# කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය
# වාර්ෂික වාර්තාව
# 2014


නො : 70 පාර්ලිමේන්තු පාර,

පැලවත්ත, බත්තරමුල්ල.

දුරකථන අංක : 7909021 - 22

ෆැක්ස් : 2784925 – 28

ඊ මේල් :gmtshda@gmail.com

aetshda1@gmail.com

## දැක්ම

ආර්ථික හා සමාජීය වශයෙන්
තිරසාර කුඩා තේ වතු ප්‍රජාවක්
බිහිවීම

## මෙහෙවර

විශිෂ්ඨතම උපකාරක සේවා
සැපයීම තුලින් කුඩා තේ ඉඩම්
අංශයේ ඵලදායිතාව සහ
ගුණාත්මය වර්ධනය කිරීම

**කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය**
**වාර්ෂික වාර්තාව 2014**
**සභාපතිතුමාගේ පණිවිඩය**

කුඩා තේ වතු අංශයේ නිෂ්පාදනය වර්ධනය මෙන්ම ඵලදායිතාවය වර්ධනය කරගැනීම පිණිස වසර කිහිපයක සිට අඛණ්ඩව රාජ්‍ය අනුග්‍රහය ලද අංශයක්වීමත්, එම අනුග්‍රහයෙන් ධනාත්මක ප්‍රතිඵල කුඩා තේ වතු අංශය ලබා ඇති බවත් 2014 වසරේ කුඩා තේ වතු අංශයේ වාර්ෂික නිමැවුම අනුව සතුටින් ප්‍රකාශකරනු කැමැත්තෙමි.

සහනාධාර මිල යටතේ තේ පොහොර මිශ්‍රණ ලබාගත හැකිවීම, නැවත වගා ආයෝජනය දිරිමත් කිරීම පිණිස මෑත කාලයේ කිහිපවතාවක් සහනාධාර මුදල වැඩි කිරීම සහ 2014 වසරේ පාංශු හා ජල සංරක්‍ෂණ සහනාධාරය ලබාගත හැකිවීම කුඩා තේ වතු අංශය ලබාගත් එම ප්‍රතිලාභ වේ.

2014 වසරේදී පාංශු හා ජල සංරක්‍ෂණ ඵලදායිතා සහ වර්ධන වැඩසටහන යටතේ කුඩා තේ වතු හිමියන් 190123 දෙනෙකුට අයත් අක්කර 129022 ක පාංශු හා ජල සංරක්‍ෂණ කටයුතු කරගැනීම වෙනුවෙන් රුපියල් මිලියන 403.64 ක මුදලක් සහනාධාර වශයෙන් ලබාගැනීමට හැකිවිය.

පෙර වර්ෂයනට වඩා අමුදළු කිලෝවක් සඳහා සාමාන්‍ය ඉහල මිල , ඉහත සඳහන් කල සහන යටතේ වගා පිරිවැය අවම වීම සහ නිෂ්පාදන ආන්තිකය වැඩිවීම කුඩා තේ වතු ක්‍ෂේත්‍රය ලද ආර්ථික ප්‍රතිලාභ වේ.

2014 වර්ෂයේ කුඩා තේ වතු අංශය, මෙතෙක් වාර්තාගත තම වාර්ෂික උපරිම නිෂ්පාදනය වූ නිමි තේ කිලෝ මිලියන 247 ක් ජාතික තේ නිෂ්පාදනයට දායක කර ඇත. මෙය සමස්ත ජාතික නිෂ්පාදනයෙන් 73.01% කි. එමෙන්ම පෙර වර්ෂයට සාපේක්‍ෂව නිෂ්පාදන දායකත්වය 0.8% කින් වර්ධනයකර තිබුණි. එහෙත් 2014 වසරේ ජාතික නිෂ්පාදනය නිමි තේ කිලෝ මිලියන 338.0 වූ අතර, එය පෙර වර්ෂයට සාපේක්‍ෂව 0.6% කින් අඩුව තිබුණි.

කුඩා තේ වතු අංශයේ නිෂ්පාදනය 0.8% කින් වර්ධනය වුවද, මතු සඳහන් ප්‍රතිලාභයන්ට අනුව සහ වර්ෂය අවසානයේ අයහපත් කාලගුණික හේතුන් මත අස්වනු ප්‍රමාණය අඩු නොවන්නට කුඩා තේ වතු අංශයට තම අස්වනු ප්‍රමාණය තවදුරටත් වර්ධනය කරගත හැකිවිය යුතුව තිබුණි.

**දිප්ති අබේවික්‍රම**
**සභාපති**

## කුඩා තේ ඉඩම් අංශයේ කාර්යඵල දර්ශක - 2014

| | | | 2012 | 2013 | 2014 |
|---|---|---|---|---|---|
| 1 | කුඩා තේ බිම් ප්‍රමාණය ( හෙක්ටයාර් ) | | 120,955 | 121,267 | 121,429 |
| 2 | කුඩා තේ ඉඩම් හිමියන් සංඛ්‍යාව | | 390,346 | 391,226 | 392,108 |
| 3 | කුඩා තේ වතු නිෂ්පාදනය (කිලෝ මිලියන) | | 233.10 | 245.43 | 247.38 |
| 4 | ජාතික නිෂ්පාදනයට දායකත්ව ප්‍රතිශතය | | 71.4 | 72.2 | 73.1 |
| 5 | සාමාන්‍ය ඵලදායිතාවය (නිමි තේ / කි.ග්‍රෑ./ හෙක්ටයාරයකට) | | 2,001 | 2,107 | 2,123 |
| 6 | තේ නැවත වගා බිම් ප්‍රමාණය /හෙක්ටයාර් (දිරිදීමනා යටතේ) | | 889 | 1165 | 720 |
| 7 | තේ අළුත් වගා බිම් ප්‍රමාණය /හෙක්ටයාර්(දිරිදීමනා යටතේ) | | 239 | 263 | 401 |
| 8 | නැවත වගා අනුපාතිකය | | 0.76 | 0.93 | 0.64 |
| 9 | භෝග පුනරුත්ථාපනය- පැල සංඛ්‍යාව ( මිලියන ) | | 0.767 | 0.497 | 0.271 |
| 10 | කුඩා තේ වතු සංවර්ධන සමිති | සමිති සංඛ්‍යාව | 1,381 | 1,382 | 1,383 |
| | | සාමාජික සංඛ්‍යාව | 261,493 | 251,794 | 266,480 |
| 11 | ව්‍යාප්ති සහ උපදෙස් සේවා | ඒක පුද්ගල ව්‍යාප්ති සේවා සංඛ්‍යාව | 27,843 | 26,980 | 25,490 |
| | | කණ්ඩායම් වැඩ සටහන් සංඛ්‍යාව | 6,508 | 6,617 | 7,064** |
| | | සහභාගිත්ව ගොවීන් සංඛ්‍යාව | 143,456 | 137,661 | 315,973** |
| 12 | ආයතනයේ මෙහෙයුම් පිරිවැය ( සංවර්ධන රුපියලක් සඳහා) | | 0.85 | 0.54 | 0.73 |
| 13 | තේ පරීක්ෂක ව්‍යාප්ති නිලධාරී : තේ ගොවි අනුපාතිකය | | 1:2730 | 1:2736 | 1:2742 |
| 14 | අමු දලු කිලෝවක සාමාන්‍ය දළ මිල රුපියල් | | 57.27 | 64.99 | 67.54 |

** පාංශු හා ජල සංරක්ෂණ වැඩසටහන මත කණ්ඩායම් වැඩසටහන් 438 කින් (54% කින්) සහ පුද්ගල සහභාගිත්වය 100194 කින් (574% කින්) වැඩිවී තිබේ.

# පටුන

**පිටු අංකය**


I අධ්‍යක්‍ෂ මණ්ඩලය 01
II විගණන හා කළමණාකරන කමිටුව 02
III විධායක කාර්යමණ්ඩලය සහ පරිපාලන දිස්ත්‍රික් කාර්යාලයන් 03

**ප්‍රධාන සාරාංශය** 14

**1 වන පරිච්ඡේදය**

**හැඳින්වීම**

1.1 ආයතනය සහ කාර්යභාරය 17
1.2 විගණන හා කළමණාකරන කමිටු කටයුතු 18
1.3 පරිපාලනමය කටයුතු 19

**2 වන පරිච්ඡේදය**

**ශ්‍රී ලංකාවේ කුඩා තේ ඉඩම් අංශය** 21

2.1 කුඩා තේ ඉඩම් 21
2.2 කුඩා තේ ඉඩම් භූමි ප්‍රමාණය 21
2.3 කුඩා තේ ඉඩම් හිමියෝ 22
2.4 කුඩා තේ ඉඩම් සංඛ්‍යාව 22
2.5 භූමි වර්ගීකරණය 23
2.6 කුඩා තේ ඉඩම් අංශයේ නිෂ්පාදනය 23
2.7 නිෂ්පාදන සංයුතිය 26
2.8 ඵලදායිතාව 27
2.9 ආයෝජනයන් හා මෙහෙයුම් සමාලෝචනය 28

**3 වන පරිච්ඡේදය**

**ව්‍යවස්ථාපිත අරමුණු හා ප්‍රතිඵල පාදක සංවර්ධන කාර්යයන්** 31

3.1 මධ්‍යකාලීන ප්‍රතිඵල පාදක ඉලක්ක හා කාර්යඵලය 35
3.2 කුඩා තේ ඉඩම්වල ආයෝජනය ප්‍රවර්ධනය කිරීමේ විශේෂ ව්‍යාපෘති කටයුතු 56
3.3 දශකයේ විශේෂ කාර්ය සාධනයන් 60
3.4 ප්‍රධාන කාර්යපාදක දර්ශක 61

**4 වන පරිච්ඡේදය**

**කුඩා තේ ඉඩම් අංශයේ වගා පිරිවැය හා දළු මිල** 62

4.1 ශ්‍රම පිරිවැය 62
4.2 අමු තේ දලු කිලෝවක නිෂ්පාදන පිරිවැය 62
4.3 නිෂ්පාදන ආන්තිකය හා මිල 63
4.4 තේ නැවත වගා කිරීමේ පිරිවැය 63
4.5 දිරිදීමනා අනුපාතිකය හා වගා පිරිවැය (හෙක්ටයාරයකට) 64

**5 උපලේඛන** 65 - 89

**විගණකාධිපතිගේ වාර්තාව**

**වාර්ෂික ගිණුම් ප්‍රකාශ හා ශේෂ පත්‍රය**

# උපලේඛන


| අංක | | පිටු අංකය |
|---|---|---|
| (1) | ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව - 2014 | 65 |
| (2) | ආයතනයේ සේවා නියුක්තිය - 2014 | 66 |
| (3) | 3- I සේවා නියුක්තියන්ගේ වයස් ව්‍යුහ විශ්ලේෂණය - 2014 | 67 |
| | 3- II විධායක නිලධාරී අධ්‍යාපන මට්ටම අනුව කාණ්ඩගත කිරීම - 2014 | 68 |
| (4) | කුඩා තේ වතු අංශයේ නිෂ්පාදනය - 1983 - 2014 | 73 |
| (5) | තේ නැවත වගා අධාර ක්‍රමය පිළිබඳ ක්‍රියාකාරීත්වය - 1978 – 2014 | 74 |
| (6) | භෝග පුනරුත්ථාපනය (පාළු සිටුවීමේ ) ආධාර ක්‍රමය පිළිබඳ ක්‍රියාකාරීත්වය - 1979- 2014 | 75 |
| (7) | තේ අලුත් වගා ආධාර ක්‍රමය පිළිබඳ ක්‍රියාකාරීත්වය –1978 – 2014 | 76 |
| (8) | තේ සමග රබර් වගා කිරීමේ ආධාර ක්‍රමය -1999 -2009 | 77 |
| (9) | 9 - A මව් වගා මගින් නව ප්‍රභේද රිකිලි හා අතු නිකුත් කිරීම - 2014 | 78 |
| | 9 - B ආයතනික තේ තවාන් ක්‍රියාකාරීත්වය - 2014 | 79 |
| | 9 - C වාණිජ තවාන් ක්‍රියාකාරීත්වය - 1992-2014 | 80 |
| (10) | 10 - A පිහිටීම මත කොළඹ තේ වෙන්දේසියේ තේ සඳහා මිල - 1985 – 2014 | 81 |
| | 10 - B අමු දළු කිලෝවක නිෂ්පාදන පිරිවැය ඇස්තමේන්තුව (සහනාධාර සහිත ) - 2014 | 82 |
| (11) | 11 - A වගා පිරිවැය ඇස්තමේන්තුව - උස් / මැදි බිම් තේ නැවත වගා හෙක්ටයාරයකට – 2014 | 83 |
| | 11 - B වගා පිරිවැය ඇස්තමේන්තුව - පහත් බිම් තේ නැවත වගා හෙක්ටයාරයකට - 2014 | 84 |
| (12) | කුඩා තේ වතු හිමියන් සඳහා ණය වාරික ක්‍රමය යටතේ පොහොර ලබාදීම 1993 – 2009 | 85 |
| (13) | තේ අපනයනය හා විදේශ විනිමය ඉපයීම | 86 |
| (14) | දළජාතික නිෂ්පාදනයට තේ මගින් එකතු කල වටිනාකම | 87 |
| (15) | තේ වගාවේ යන්ත්‍ර භාවිතය ප්‍රචලිත කිරීමේ ව්‍යාපෘතිය | 88 |
| (16) | තේ වගාවේ යන්ත්‍ර භාවිතය ප්‍රචලිත කිරීමේ ව්‍යාපෘතිය - මූල්‍ය වටිනාකම | 89 |

## රූ සටහන් අංක

(1) මුලු තේ ඉඩම් ප්‍රමාණයට කුඩා තේ ඉඩම් දායකත්වය 21

(2) කළමණාකාරිත්ව ආයතනයන්හි නිෂ්පාදන දායක ප්‍රතිශතයන් 24

(3) කුඩා තේ වතු අංශයේ මාසික තේ නිෂ්පාදනය - 2013/2014 25

(4) කුඩා තේ වතු අංශයේ වාර්ෂික තේ නිෂ්පාදන ප්‍රවනතාවන් -2013/2014 25

(5) තේ නැවත වගා සහනාධාර මුදල වැඩි කිරීම - 1979 සිට 35

(6) තේ නැවත වගා ආධාර සඳහා වාර්ෂිකව අයදුම් කිරීම -2000 – 2014 36

(7) තේ නැවත වගා ආධාර ගෙවීම්හි වාර්ෂික ප්‍රගතිය - 1994 – 2014 38

(8) තේ අළුත් වගා සහනාධාර මුදල වැඩි කිරීම - 1979 සිට 39

(9) තේ අළුත් වගා ආධාර ගෙවීම්හි වාර්ෂික ප්‍රගතිය - 1993 – 2014 41

(10) භෝග පුනරුත්ථාපන ආධාර ක්‍රමයේ ගෙවීම්හි ප්‍රගතිය - 1993 – 2014 44

## කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය
## ප්‍රධාන කාර්යාල සංවිධාන ව්‍යුහය




සංවිධාන ව්‍යුහය
කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ MSD /30 පරිදි

## කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය
## ප්‍රාදේශිය කාර්යාල සංවිධාන ව්‍යුහය




සංවිධාන ව්‍යුහය
කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ MSD /30 පරිදි

## අධ්‍යක්ෂ මණ්ඩලය

1. සභාපති - නොඑල් පද්මසිරි කාරියවසම් මහතා

**අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්**

| | | |
|---|---|---|
| 1. ආචාර්ය එස්.එස්.බී.ඩී.ජී. ජයවර්ධන මහතා | සභාපති<br>තේ පර්යේෂණ මණ්ඩලය | 051-3519619 |
| 2. එම්.විදානපතිරණ මහතා | නියෝජිත<br>පෞද්ගලික කම්හල් හිමියන්ගේ සංගමය | 077-6031000 |
| 3. දිශ්නා ධර්මසේකර මිය | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් - වැ.බ.<br>අධ්‍යක්ෂිකා, (සංවර්ධන) වැ.බ.<br>වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය | 011-2304132 |
| 4. එම්. අනෝමා නන්දනී මහත්මිය | අධ්‍යක්ෂ<br>රාජ්‍ය මුල්‍ය දෙපාර්තමේන්තුව | 011 - 2480600 |
| 5. ඊ.ඒ.ඩබ්. එදිරිසිංහ මහතා | අධ්‍යක්ෂ ජනරාල්<br>ශ්‍රී ලංකා තේ මණ්ඩලය | 011-2508991 |
| 6. නෙවිල් රත්නායක මහතා | ගරු සභාපති<br>සමස්ත ලංකා සමිති සංවිධානය | 077-2910003 |
| 7. කේ.එල්.ගුණරත්න මහතා | ගරු ලේකම්<br>සමස්ත ලංකා සමිති සංවිධානය | 077-7707623 |
| 8. එම්.එෆ්.එස්.ඩබ්. ස්ටෙම්බෝ මහතා | වැවිලි කර්මාන්ත ගරු අමාත්‍ය නියෝජිත | 0777-226751 |
| 9. රොෂාන් රාජදුරෙයි මහතා | කළමණාකරන අධ්‍යක්ෂ<br>කැලණි වැලි සහ තලවකැලේ වැවිලි සමාගම් | 011-2686274 |
| 10. පී.ජී දසනායක මහතා | සභාපති<br>රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව<br>(අධ්‍යක්ෂ මණ්ඩල නිරීක්ෂක සාමාජික) | 011-2859218 |
| 11. දමිත් ලොකු බණ්ඩාර මහතා | නිරීක්ෂක සාමාජික<br>නො.14, සමගි මාවත, ගංගොඩවිල, නුගේගොඩ. | |

අදාල වර්ෂයේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර 12 ක් පවත්වා ඇත.

## විගණන හා කළමනාකරණ කමිටුව

| | | |
|---|---|---|
| 1. සභාපති -අනෝමා නන්දනී මිය | අධ්‍යක්ෂ<br>රාජ්‍ය මුල්‍ය දෙපාර්තමේන්තුව | 011-2480600 |
| 2. සාමාජික -දිශ්නා ධර්මසේකර මිය | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් - වැ.බ.<br>අධ්‍යක්ෂිකා,(සංවර්ධන) වැ.බ.<br>වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය<br>කොළඹ 02. | 011-2304132 |
| 3. සාමාජික -එම්.එෆ්.එස්.ඩබ්. ස්ටෙම්බෝ මහතා | වැවිලි කර්මාන්ත<br>ගරු අමාත්‍ය නියෝජිත | 0777-226751 |
| 4. සාමාජික - කේ.එල්.ගුණරත්න මහතා | ගරු ලේකම්<br>සමස්ත ලංකා සමිති සංවිධානය | 077-7707623 |
| 5. නිරීක්ෂක -සුවිනිතා ඇන්තනි මිය | විගණන අධිකාරි<br>විගණන උපකාර්යාලය<br>ශ්‍රී ලංකා තේ මණ්ඩලය<br>ගාලු පාර, කොළඹ 03 | 011-2583687 |

2014 වර්ෂයේ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වාර 03 ක් පවත්වා ඇත.

**ප්‍රධාන කාර්යාලය**
**අංක 70, පාර්ලිමේන්තු පාර**
**පැලවත්ත, බත්තරමුල්ල**
**දුරකථන අංක:- 011-7909020/21**

**විධායක කාය්‍ය මණ්ඩලය**

| | |
|---|---|
| සභාපති | : නොඑල් පද්මසිරි කාරියවසම් මහතා |
| සාමාන්‍යාධිකාරි | : කේ.ජී.බී. ඔබේසේකර මහතා (2014.04.26 දක්වා) |
| සාමාන්‍යාධිකාරි | : එම්.බී. සිරිල් මහතා (2014.04.28 සිට) වැ.බ. |
| | : (2014.09.01 සිට) |

**ව්‍යාප්ති අංශය**

| | |
|---|---|
| නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි ( ව්‍යාප්ති ) | : සි.ජේ.අයි.ටී. ප්‍රනාන්දු මහතා |
| සහකාර කළමණාකරු (ව්‍යාප්ති) | : ආර්.ඒ.පී.පී. රණසිංහ මහතා (2014.07.16 සිට) |

**සංවර්ධන අංශය** :

| | |
|---|---|
| නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (සංවර්ධන) | : එම්.බී. සිරිල් මහතා (2014.09.01 දක්වා) |
| කළමණාකරු (ප්‍රජා සංවර්ධන ) | : ජේ.එම්.ජී. ජයසිංහ මහතා |

**සැලසුම් හා නියමුකරණ ඒකකය**

| | |
|---|---|
| කළමණාකරු (සැලසුම් හා නියමුකරණ) | : එම්.අයි.එම්.ජේ. සමරවික්‍රම මහත්මිය |
| සහකාර කළමණාකරු (සැලසුම් හා නියමුකරණ) | : ආර්.ඒ. වෛද්‍යරත්න මහතා |

**මුදල් අංශය**

| | |
|---|---|
| කළමනාකරු (මුදල් ) | : ඩී.ජී.පී. ජයන්ති මහත්මිය |
| සහකාර කළමණාකරු (මුදල් ) | : පී.ආර්. ඉන්දික පෙරේරා මහතා |
| සහකාර කළමණාකරු (මුදල් ) | : බී.එච්.සී.ඒ. බටගොඩ මහතා (2014.08.04 දක්වා) වැ.බ. |
| | : (2014.08.05 සිට) |

**මානව සම්පත් හා පාලන අංශය**

| | |
|---|---|
| කළමණාකරු (මානව සම්පත් හා පාලන) | : ——— |
| සහකාර සාමාන්‍යාධිකාරි (සේවා) / අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් | : අමිත පස්කුවල් මහතා |
| සහකාර ව්‍යාපෘති කළමණාකරු | : හර්ෂාන් ද සිල්වා මහතා (2014.08.04 දක්වා) |
| සහකාර කළමණාකරු (මානව සම්පත් හා පාලන) | : (2014.08.05 සිට) |
| සහකාර කළමණාකරු (මානව සම්පත් හා පාලන) | : කේ.ඒ.සී.එස්.පී. ප්‍රනාන්දු මහතා (2014.08.15 සිට) |
| පරිපාලන නිලධාරි | : ඊ.එම්.ඩී අමුණුගම මිය (2014.09.14 දක්වා) |
| පරිපාලන නිලධාරි | : සරත්චන්ද්‍ර මුරමුදලිගේ මහතා (2014.02.05සිට) වැ.බ. |

**අභ්‍යන්තර විගණන අංශය :**

| | |
|---|---|
| අභ්‍යන්තර විගණක | : කේ.ජී. නාරද මහතා |
| අභ්‍යන්තර විගණන නිලධාරී | : දමින්ද ප්‍රියන්ජිත් මහතා |

**ප්‍රාදේශිය කාර්යාලය - ගාල්ල**
**අංක 81, ප්‍රදිපාගාර විදිය**
**කොටුව, ගාල්ල**
**පරිපාලන දිස්ත්‍රික්කය - ගාල්ල**
**දුරකථන අංක:- 091-7201126/28**

**ෆැක්ස් :- 091- 2244382 / ඊ මේල් -** tshdaga@gmail.com

| | |
|---|---|
| ප්‍රාදේශිය කළමනාකරු | : ඒ.ඩබ්.ඩබ්. කරුණාරත්න මහතා (2014.06.07 දක්වා) |
| | : එල්.එච්.රංජිත් මයා (2014.03.10 දින සිට)-රා.ආ. |
| | : (2014.06.25 දින සිට) වැ.බ. |
| සහකාර ප්‍රාදේශිය කළමනාකරු | : එල්.එච්.රංජිත් මයා 2014.01.01 සිට |
| සහකාර ප්‍රාදේශිය කළමනාකරු (ව්‍යාප්ති) | : ඩී.එම්.ජේ. නාකන්දල මහතා |
| කාර්යභාර නිලධාරි | : ඩී.එල්.සී. සූරියආරච්චි මහතා |
| | : එල්.කේ. වීරසේකර මහතා(2014.08.04 දක්වා) |
| | : ජී. සිසිර කුමාර මහතා |
| | : ඊ.ජී.ඩී. ශාන්තසිරි මහතා 2014.10.15 සිට |
| පරිපාලන නිලධාරි | : එච්. දයානන්ද මහතා (2014.06.31 දක්වා) |
| | : කේ.එම්.එච්.ඒ. අමරලතා මහත්මිය (2014.07.01 සිට) |
| ගිණුම් නිලධාරි | : යූ.එල්.එම්.පෙරේරා මිය |

| **ව්‍යාප්ති මධ්‍යස්ථානය** | **උප කාර්යාල** | **සේවා කොට්ඨාශ** |
|---|---|---|
| කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය<br>ප්‍රාදේශිය ව්‍යාප්ති මධ්‍යස්ථානය<br>වලහන්දුව වත්ත, ගාල්ල.<br>දුරකථන අංක : 0917200815 | වදුරඹ | කුරුපනාව<br>උනන්විටිය<br>උඩුගම<br>බද්දෙගම<br>වදුරඹ |
| | ඇල්පිටිය | ඇත්කඳුර<br>පිටිගල<br>නියාගම<br>ඇල්පිටිය<br>බටපොල<br>කහදූව |
| | හිංගල්ගොඩ | දෙල්ලව<br>මාවනාන<br>නෙළුව<br>හබරකඩ<br>හල්විටිගල<br>හිනිදුම<br>ඕපාත |
| | අක්මීමන | ඉමදූව<br>කොට්ටව<br>යක්කලමුල්ල<br>බෙරනාගොඩ<br>අක්මීමන |

**ප්‍රාදේශිය කාර්යාලය - මාතර**
**අංක 31, කාලිදාස පාර ,මාතර**
**පරිපාලන දිස්ත්‍රික්ක - මාතර/ හම්බන්තොට**
**දුරකථන අංක:- 041-7200799 - 041-7200394/96**
**ෆැක්ස් :- 041- 2226487 / ඊ මේල් - tshdamt@gmail.com**

| | | |
|---|---|---|
| ප්‍රාදේශිය කළමනාකරු | : | පී.පී. බන්දුල මහතා |
| සහකාර ප්‍රාදේශිය කළමනාකරු (ව්‍යාප්ති) | : | ඊ.ආර්.එස්.ගුණවර්ධන මහතා |
| සහකාර ප්‍රාදේශිය කළමනාකරු (සැලසුම් හා සංවර්ධන) | : | එල්.එච්.රංජිත් මයා (2014.01.01 දක්වා) |
| | : | එස්.එස්.බී. දිසානායක මහතා(2014.08.14 දක්වා) |
| සහකාර කළමනාකරු(මානව සම්පත් හා පාලන) | : | එච්. දයානන්ද මහතා (2014.08.05 සිට 2014.11.16 දක්වා) |
| කාර්යභාර නිලධාරී | : | ජේ.එල්. එදිරිසූරිය මහතා - (වැ.බ.) |
| | : | පී.පී.එස්. දේශප්‍රිය මහතා (වැ.බ.) |
| | : | ඊ.පී.ඩී. ශාන්තසිරි මහතා - (වැ.බ.) 2014.10.14 දක්වා |
| පරිපාලන නිලධාරී | : | කේ.එච්.එම්.ඒ. අමරලතා මහත්මිය (2014.06.31 දක්වා)(වැ.බ.) |
| | : | එච්. දයානන්ද මහතා (2014.07.01 සිට 2014.08.04 දක්වා) |
| | | එන්.වී. ප්‍රීති පුෂ්පකුමාරි මිය (2014.11.25 සිට) |
| ගිණුම් නිලධාරී | : | එච්.එම්.එල්. පුෂ්පකුමාරි මිය |

| **ව්‍යාප්ති මධ්‍යස්ථානය** | **උප කාර්යාල** | **සේවා කොට්ඨාශ** |
|---|---|---|
| කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය ප්‍රාදේශිය ව්‍යාප්ති මධ්‍යස්ථානය මොරවක, අලපලාදෙනිය. | කොටපොල | දෙනියාය<br>කළුබෝවිටියන<br>මොරවක<br>දෑරංගල<br>කොළවෙනිගම<br>කොටපල<br>පිටබැද්දර |
| | අකුරැස්ස | කනංකෙ<br>අකුරැස්ස<br>තෙලිජ්ජවිල<br>තිබ්බටුවාව<br>කැටන්විල<br>කඹුරුපිටිය |
| | පස්ගොඩ | බෙරලපනාතර<br>වරාපිටිය<br>කිරිලිපන<br>දම්පහල<br>පස්ගොඩ<br>ඌරුබොක්ක<br>දෙයියන්දර |

**ප්‍රාදේශිය කාර්යාලය - රත්නපුර**
**අංක 1/28, නව නගරය, රත්නපුර**
**පරිපාලන දිස්ත්‍රික්කය - රත්නපුර**
**දුරකථන අංක:- 045-7201243 - 045-7201904**
**ෆැක්ස් :- 045- 2228647 / ඊ මේල් - tshdarat@gmail.com**

| | |
|---|---|
| ප්‍රාදේශිය කළමනාකරු | : යූ.එල්. ආරියපාල මහතා (2014.08.14 දක්වා) |
| | : එස්.එස්.බී. දිසානායක මහතා(2014.08.15 සිට) වැ.බ. |
| සහකාර ප්‍රාදේශිය කළමනාකරු ( ව්‍යාප්ති ) | : එම්.ආර්.එන්. ධම්මික මහතා |
| සහකාර ප්‍රාදේශිය කළමනාකරු (සැලසුම් හා සංවර්ධන) | : ඩබ්.එච්.එස්.පී.විජේතුංග මහතා (2013/07/19 සිට)වැ.බ. |
| ප්‍රාදේශිය සැලසුම් නිලධාරි | : ඩබ්.එච්.එස්.පී. විජේතුංග මහතා |
| කාර්යභාර නිලධාරී | : එල්.යූ. කුමාරසිරි මහතා (2014.06.17 දක්වා) |
| | : කේ.එම්.ආර්.එල්. බණ්ඩාර මහතා |
| | : පී.ඩී.කේ. බාලචන්ද්‍ර මහතා -වැ.බ. |
| | : එච්.එම්. චන්ද්‍රපාල මහතා (2014.10.15 සිට) |
| | : එම්.එම්. කුමාරසිංහ මහතා (2014.10.15 සිට) |
| පරිපාලන නිලධාරී | : කේ.එම්.සේනාරත්න මයා (2014.06.31 දක්වා) වැ.බ. |
| | : එන්.වී.පී. පුෂ්පකුමාරි මිය (2014.07.01 සිට) |
| | : කේ.එම්.සේනාරත්න මයා (2014.11.26 සිට) රා.ආ. |
| ගිණුම් නිලධාරී | : එම්.ඒ. පියසීලි මිය |

**ව්‍යාප්ති මධ්‍යස්ථානය**

කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය
ප්‍රාදේශිය ව්‍යාප්ති මධ්‍යස්ථානය
සන්නස්ගම, රත්නපුර.
දුරකථන අංක: 045 - 7201170

| **උප කාර්යාල** | **සේවා කොට්ඨාශ** |
|---|---|
| නිවිතිගල | නිවිතිගල, රත්නපුර, වැද්දාගල, කලවාන, අයගම, කුකුලේගම |
| බලංගොඩ | ඕපනායක, පින්නවල, රාස්සගල, ඉඹුල්පේ, ඇල්ලරාව, වැලිගෙපොල, බලංගොඩ |
| රක්වාන | පොතුපිටිය, මාදම්පේ, කොලොන්න, රක්වාන, පැල්මඩුල්ල, කහවත්ත |
| කුරුවිට | ඇහැලියගොඩ, ගල්ලෑල්ල, ගිලිමලේ, එරත්න, කිරිඇල්ල, වේවැල්වත්ත |

**ප්‍රාදේශීය කාර්යාලය - මහනුවර**
**අංක 2/7/1, ගන්නොරුව පාර**
**පේරාදෙණිය, මහනුවර**
**පරිපාලන දිස්ත්‍රික්ක - මහනුවර, මාතලේ, කුරුණෑගල**
**දුරකථන අංක:- 081-7200827 - 081-7201821**
**ෆැක්ස් :- 081- 2389011 / ඊ මේල් - tshdakan@gmail.com**

| | |
|---|---|
| ප්‍රාදේශීය කළමනාකරු | : කේ.ඒ.බී. ද ඒ. රාජපක්ෂ මහතා |
| සහකාර ප්‍රාදේශීය කළමනාකරු (ව්‍යාප්ති) | : එල්.කේ. වීරසේකර මහතා (2014.08.05 සිට) |
| සහකාර ප්‍රාදේශීය කළමනාකරු (සැලසුම් හා සංවර්ධන): | එම්.එම්. විජේබණ්ඩාර මහතා (2014/10/12 දක්වා) |
| කාර්යභාර නිලධාරී | : ඩබ්.ජේ.ඩබ්. අරඹේපොල මහතා |
| | : පී.එන්. යගමුණි මහතා (2014.08.14 දක්වා) වැ.බ. |
| | : ටී.එම්.ජේ. හේරත් මහතා |
| | : ටී. අමරසේකර මහතා |
| | : අනුරුද්ධ බණ්ඩාර මහතා |
| පරිපාලන නිලධාරී | : පී.එම්.පී. බණ්ඩාරනායක මහතා (2014.10.27 දක්වා) |
| පරිපාලන නිලධාරි | : ඒ.ඩබ්.පී. නන්දාවති මිය (2014.11.10 සිට) වැ.බ. |
| සහකාර ගණකාධිකාරි | : ඒ.පී. සෝමසිරි මහතා |
| මහජන සම්බන්ධතා නිළධාරි | : ඒ. දිසානායක මහතා (2014.11.13 සිට) |

| **ව්‍යාප්ති මධ්‍යස්ථානය** | **උප කාර්යාල** | **සේවා කොට්ඨාශ** |
|---|---|---|
| කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය<br>ප්‍රාදේශීය ව්‍යාප්ති මධ්‍යස්ථානය<br>සුරියගොඩ,මුරුතලාව.<br>දුරකථන අංක : 0817201921 | මාතලේ | උකුවෙල<br>මාතලේ<br>රත්තොට<br>අලවතුගොඩ |
| | වත්තේගම | පුජාපිටිය<br>වැරැල්ලගම<br>තෙල්දෙණිය<br>වත්තේගම |
| | හගුරන්කෙත | හේවාහැට<br>මන්දාරම්නුවර<br>හගුරන්කෙත<br>වලපනේ |
| | ගිරාගම | ගන්නොරුව<br>ගලගෙදර<br>මැණික්දිවෙල<br>දන්තුරේ |

**ප්‍රාදේශිය කාර්යාලය - නුවරඑළිය**
**අංක 22, කන්දේ විදිය, ගම්පොල**
**පරිපාලන දිස්ත්‍රික්ක - නුවරඑළිය, මහනුවර**
**දුරකථන අංකය:- 081-72001863/ 081-7201593**
**ෆැක්ස් :- 081- 2351293 / ඊ මේල් - tshdane@gmail.com**

| | |
|---|---|
| ප්‍රාදේශිය කළමනාකරු | : ඒ.ගුණවර්ධන මහතා (2014.01.09 සිට) රා. ආ. |
| | : (2014.06.25 සිට 2014.08.31 දක්වා) වැ.බ. |
| | : එම්.එම්. විජේබණ්ඩාර මහතා (2014.10.13 සිට)රා. ආ. |
| සහකාර ප්‍රාදේශිය කළමනාකරු ( ව්‍යාප්ති ) | : එස්.එම්.කේ.කේ.බී. කපුගෙදර මහතා(2014.08.04 දක්වා) වැ.බ. |
| | : (2014.08.05 සිට) |
| සහකාර ප්‍රාදේශිය කළමනාකරු(සැලසුම් හා සංවර්ධන) | : ඒ. ගුණවර්ධන මහතා (2014.08.31 දක්වා) |
| කාර්යභාර නිලධාරී | : ඩී.එම්.ආර්.කේ.බී. දසනායක මහතා |
| | : ජේ. බෝගහවත්ත මහතා(2014.06.04 දක්වා) |
| | : එස්.එම්.කේ.කේ.බී. කපුගෙදර මහතා (2014.08.04 දක්වා) |
| | : පී.එන්. යගමුණි මයා (2014.08.14 සිට වැ.බ.) |
| | : කේ.එම්.ඒ.ඩී.එස්. කුරුප්පු මහතා(2014.10.15 සිට) |
| | : ඩී.එස්.රණවීර මහතා (2014.10.14 දක්වා) වැ.බ. |
| | : බී.ඩී.ඒ. හියරාපිටිය මහතා වැ.බ |
| | : එච්.එම්. ප්‍රේමකුමාර මහතා (2014.10.15 සිට) |
| පරිපාලන නිලධාරී | : පී.අයි.යූ. සෝමසිරි මහතා |
| ගිණුම් නිලධාරී | : ශ්‍යාමලි ප්‍රේමසුන්දර මිය |
| මහජන සම්බන්ධතා නිලධාරී | : ඒ. දිසානායක මහතා (2014-11-12 දක්වා) |

**ව්‍යාප්ති මධ්‍යස්ථානය**

කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය
තිස්පනේ
ප්‍රාදේශිය ව්‍යාප්ති මධ්‍යස්ථානය
තිස්පනේ, නව තිස්පනේ.
දුරකථන අංක : 0817201950

| උප කාර්යාල | සේවා කොට්ඨාශ |
|---|---|
| ගම්පල | පන්විලතැන්න<br>ගම්පල<br>නිල්ලඹ<br>පුපුරැස්ස<br>පුස්සැල්ලාව |
| උඩුනුවර | හන්දෙස්ස<br>වට්ටප්පොල<br>කුරුදුවත්ත<br>උලපනේ<br>දොලොස්බාගේ |
| කොත්මලේ | රුවන්පුර<br>තිස්පනේ<br>හරංගල<br>හෙල්බොඩ<br>පුඩළුඔය |
| ගිනිගත්හේන | ගිනිගත්හේන<br>පොල්පිටිය<br>ලක්ෂපාන<br>නාවලපිටිය<br>වැලිගම්පල |

**ප්‍රාදේශිය කාර්යාලය - ඌව**
**නව බදුල්ල පාර, බණ්ඩාවෙල**
**පරිපාලන දිස්ත්‍රික්ක - බදුල්ල, මොණරාගල**
**දුරකථන අංක:- 057-72000241/ 057-7200081**
**ෆැක්ස් :- 057- 2232237 / ඊ මේල් - uvatshda@gmail.com**

| | |
|---|---|
| ප්‍රාදේශිය කළමනාකරු | : එච්.ආර්. අරුණ ශාන්ත මහතා |
| සහකාර ප්‍රාදේශිය කළමනාකරු ( ව්‍යාප්ති ) | : අයි.යු.එච්. මොහොට්ටි මහතා (2014.08.11 සිට) |
| සහකාර ප්‍රාදේශිය කළමනාකරු (සැලසුම් හා සංවර්ධන) | : එච්.කේ. ලලිත් කුමාර මහතා |
| කාර්යභාර නිලධාරී | : කේ.එම්.ඒ.ඩී.එස්.කුරුප්පු මහතා (2014.10.14 දක්වා)වැ.බ. |
| | : එස්.සී. මුදන්නායක මහතා (2014.10.15 සිට) |
| | : ආර්.එම්.පී.ආර්. බණ්ඩාර මහතා(2014.10.15 සිට) |
| | : ඩී.වීකේ. නන්දසිරි මහතා (2014.10.15 සිට) |
| පරිපාලන නිලධාරි | : ඩී. එම්. ගුණපාල මහතා(2014.02.04 දක්වා) |
| | : ඒ.ඩබ්.පී. නන්දාවති මිය (2014.02.05 සිට 2014.11.09 දක්වා) වැ.බ. |
| | : ගුණසිරි අධිකාරි මහතා(2014.11.19 සිට) රා.ආ. |
| ගිණුම් නිලධාරී | : ඩබ්.එම්. ධනපාල මහතා |

| **ව්‍යාප්ති මධ්‍යස්ථානය** | **උප කාර්යාල** | **සේවා කොට්ඨාශ** |
|---|---|---|
| කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය<br>ප්‍රාදේශිය ව්‍යාප්ති මධ්‍යස්ථානය<br>බෝගහමඩිත්ත, හාලිඇල.<br>දුරකථන අංක : 055 - 2294363 | හාලි ඇල | ලුණුගල<br>පස්සර<br>වැපස්සාවෙල<br>හාලි ඇල<br>ඇටම්පිටිය<br>බදුල්ල |
| | බණ්ඩාරවෙල | හපුතලේ<br>බණ්ඩාරවෙල<br>ලියන්ගහවෙල<br>ඇල්ල<br>බල්ලකෙටුව<br>හල්දුම්මුල්ල |
| | වැලිමඩ | වැලිමඩ<br>බොරලන්ද<br>ලුණුවත්ත<br>බඹරපාන |

**ප්‍රාදේශිය කාර්යාලය - කෑගල්ල**
**කෘෂිකර්ම ගොඩනැගිල්ල**
**කච්චේරිය පාර, කෑගල්ල**
**පරිපාලන දිස්ත්‍රික්ක - කෑගල්ල, ගම්පහ**
**දුරකථන අංකඃ-** 035- 7201254/ 035-7201243
**ෆැක්ස් :-** 035- 2230163 / **ඊ මේල් -** tshdake@gmail.com

| | | |
|---|---|---|
| ප්‍රාදේශිය කළමනාකරු | : | පී. ඒ. ඩබ්. නිල්මල්ගොඩ මහතා |
| සහකාර ප්‍රාදේශිය කළමනාකරු ( ව්‍යාප්ති ) | : | කේ.ඒ.බී. පද්මරාජා මහතා |
| කාර්යභාර නිලධාරී | : | ඩී.එම්.පී.එස්. ඒකනායක මහතා |
| | : | ඩබ්.ටී.ආර්.පී. විමලරත්න මහතා (2014.08.04 දක්වා) |
| | : | ඩී.එස්. රණවීර මහතා (2014.10.15 සිට) |
| පරිපාලන නිලධාරි | : | ඊ.එම්.ඩී අමුණුගම මිය (2014.09.15 සිට) |
| ගිණුම් නිලධාරි | : | පී.ජී.අයි. සුරංගිකා මහත්මිය |

| **ව්‍යාප්ති මධ්‍යස්ථානය** | **උප කාර්යාල** | **සේවා කොට්ඨාශ** |
|---|---|---|
| කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය ප්‍රාදේශිය ව්‍යාප්ති මධ්‍යස්ථානය හිගුල | දැරණියගල | දැරණියගල<br>නූරිය<br>යටියන්තොට<br>දෙහිඕවිට<br>මාලිබොඩ<br>දික්ඇල්ල |
| | කෑගල්ල | කෑගල්ල<br>අරණායක<br>බුලත්කොහුපිටිය<br>වලල්පොල<br>කිතුල්ගල |

**11-**

**ප්‍රාදේශිය කාර්යාලය - කළුතර**
**දඹුගොඩයාවත්ත පාර, ඉද්දගොඩ**
**මතුගම**
**පරිපාලන දිස්ත්‍රික්ක - කළුතර, කොළඹ**
**දුරකථන අංක:- 034- 7200183/ 034-7201630**
**ෆැක්ස් :- 034- 2249690 / ඊ මේල් - tshdakalu@gmail.com**

| | | |
|---|---|---|
| ප්‍රාදේශිය කළමනාකරු | : | පී.ජී. සෝමසිරි මහතා (වැ.බ.) |
| සහකාර ප්‍රාදේශිය කළමනාකරු ( ව්‍යාජ්ති ) | : | ආර්.ඒ.ජී.පී. රණසිංහ මහතා (2014.07.15 දක්වා) (වැ.බ.) |
| | : | ඩබ්.ටී.ආර්.පී. විමලරත්න මහතා (2014.08.05 සිට) |
| කාර්යභාර නිලධාරී | : | ආර්.ඒ.ජී.පී. රණසිංහ මහතා (2014.07.15 දක්වා) |
| | : | ඒ.ඒ.ඩී.පී. අබේතිලක මහතා |
| | : | ආර්.එම්.ඒ.ඩී. රත්නායක මහතා (2014.10.15 සිට) |
| | : | එම්.එම්. චන්ද්‍රපාල මහතා (2014.10.14 දක්වා ) වැ.බ. |
| පරිපාලන නිලධාරි | : | එන්.වී. ප්‍රිති පුෂ්පකුමාරි මිය(2014.06.31 දක්වා) වැ.බ. |
| | : | පී.කේ. චන්ද්‍රලතා මහත්මිය (2014.08.06 සිට) රා.ආ. |
| ගිණුම් නිලධාරි | : | ආර්.ඒ.සී.ඩී.ඩී. ජයතුංග මිය |

| **ව්‍යාජ්ති මධ්‍යස්ථානය** | **උප කාර්යාල** | **සේවා කොට්ඨාශ** |
|---|---|---|
| | මීගහතැන්න | මීගහතැන්න<br>යටිටපාත<br>පැලවත්ත<br>ඉත්තපාන<br>බදුරලිය<br>හැඩිගල්ල |
| | හොරණ | හොරණ<br>බුලත්සිංහල<br>මහගම<br>මතුගම<br>අගලවත්ත<br>කෙළින්කන්ද |

**රත්නසිරි වික්‍රමනායක ජාතික පුහුණු මධ්‍යස්ථානය**
**5 කණුව, මැද කොටස**
**උඩවෙල, හන්තාන**
**දුරකථන අංක:- 034- 7200183/ 034-7201630**
**ෆැක්ස් :- 034- 2249690 / ඊ මේල් - tshdakalu@gmail.com**

| | | |
|---|---|---|
| පුහුණු කළමනාකරු | : | කේ.ඒ.බී. ද ඒ. රාජපක්ෂ මයා (2014.04.30දක්වා)-රා.ආ. |
| | : | (2014.04.30 සිට) -වැ.බ. |
| පුහුණු කිරීමේ නිලධාරි | : | එස්.සී.ඊ. නාරංගස්පිටිය මහතා |

**සමස්ත ලංකා කුඩා තේ වතු සංවර්ධන සමිති සංවිධානය**

| | |
|---|---|
| නෙවිල් රත්නායක මහතා | - ගරු සභාපති |
| කේ.එල්.ගුණරත්න මහතා | - ගරු ලේකම් |
| එන්.එම්.ආර්.ජයතිලක මහතා | - ගරු භාණ්ඩාගාරික |
| ජේ.එම්.බී.ජේ.බණ්ඩාර මහතා | - ගරු නියෝජ්‍ය සභාපති |
| කේ.විරසිංහ මහතා | - ගරු නියෝජ්‍ය ලේකම් |

**01. ගාල්ල - කුඩා තේ වතු සංවර්ධන ප්‍රාදේශිය සමිති සංවිධානය**

| | |
|---|---|
| පී.එච්.සුසන්ත ද සිල්වා මහතා | - ගරු සභාපති |
| ටී.එච්.රිචඩ් මහතා | - ගරු ලේකම් |
| එම්.ඒ.ආර්.ගුණවර්ධන මහතා | - ගරු භාණ්ඩාගාරික |

**02. මාතර - කුඩා තේ වතු සංවර්ධන ප්‍රාදේශිය සමිති සංවිධානය**

| | |
|---|---|
| නෙවිල් රත්නායක මහතා | - ගරු සභාපති |
| කේ.විරසිංහ මහතා | - ගරු ලේකම් |
| ඩබ්.පී.හේමා මහත්මිය | - ගරු භාණ්ඩාගාරික |

**03. කළුතර - කුඩා තේ වතු සංවර්ධන ප්‍රාදේශිය සමිති සංවිධානය**

| | |
|---|---|
| කේ.එල්.ගුණරත්න මහතා | - ගරු සභාපති |
| කේ.ටී.පියදාස මහතා | - ගරු ලේකම් |
| යසපාල ගුණවර්ධන මහතා | - ගරු භාණ්ඩාගාරික |

**04. රත්නපුර - කුඩා තේ වතු සංවර්ධන ප්‍රාදේශිය සමිති සංවිධානය**

| | |
|---|---|
| ජේ.එම්.බී.ජේ.බණ්ඩාර මහතා | - ගරු සභාපති |
| ජගත් සෙනරත් පතිරණ මහතා | - ගරු ලේකම් |
| ඕ.කේ.රත්නතිලක මහතා | - ගරු භාණ්ඩාගාරික |

**05. කෑගල්ල - කුඩා තේ වතු සංවර්ධන ප්‍රාදේශිය සමිති  සංවිධානය**

| | |
|---|---|
| පි.ආර්.ඒ.රත්නායක මහතා | - ගරු සභාපති |
| එන්.එම්.ආර්.ජයතිලක මහතා | - ගරු ලේකම් |
| එච්.ඩි.අනුර ජයරත්න මහතා | - ගරු භාණ්ඩාගාරික |

**06. මහනුවර - කුඩා තේ වතු සංවර්ධන ප්‍රාදේශිය සමිති  සංවිධානය**

| | |
|---|---|
| බී.ජී.අබේසිංහ මහතා | - ගරු සභාපති |
| ඩබ්.ඩී.ජයරත්න මහතා | - ගරු ලේකම් |
| ආර්.ටී.ගුරුසිංහ මහතා | - ගරු භාණ්ඩාගාරික |

**07. නුවරඑළිය - කුඩා තේ වතු සංවර්ධන ප්‍රාදේශිය සමිති  සංවිධානය**

| | |
|---|---|
| ඩබ්.ආර්.එස්.කරුණාරත්නමහතා | - ගරු සභාපති |
| ඩී.ජී.එස්.පී.පියසේන මහතා | - ගරු ලේකම් |
| පී.කේ.සෝමරත්න මහතා | - ගරු භාණ්ඩාගාරික |

**08. ඌව - කුඩා තේ වතු සංවර්ධන ප්‍රාදේශිය සමිති  සංවිධානය**

| | |
|---|---|
| ආර්.එම්.ගුණසේකර මහතා | - ගරු සභාපති |
| එච්.එම්.දයානන්ද මහතා | - ගරු ලේකම් |
| ඒ.එම්.ගුණරත්න මහතා | - ගරු භාණ්ඩාගාරික |

# ප්‍රධාන සාරාංශය

## කුඩා තේ බිම් ප්‍රමාණය

2005 කුඩා තේ ඉඩම් සංගණනය පරිදි අත්හරින ලද තේ ඉඩම් රහිත ඇස්තමේන්තුගත සමස්ත තේ බිම් ප්‍රමාණය හෙක්ටයාර් 125,019 කි. (පර්චස් 20 අඩු බිම්ද සහිතව) ගතවූ දශකයේ දත්ත පරිදි ආයතනයෙහි සහනාධාර සහිතව වාර්ෂිකව සාමාන්‍යයෙන් හෙක්ටයාර් 1034 ක පමණ භූමි ප්‍රමාණයක් තේ නැවත වගාව සඳහා උදුරා දැමීමත්, හෙක්ටයාර් 913 ක පමණ සාමාන්‍ය ප්‍රමාණයක් වාර්ෂිකව තේ නැවත වගාවත් සිදුකර තිබේ. ගතවූ වසර 03 ක ප්‍රවනතාව අනුව වාර්ෂිකව හෙක්ටයාර් 1028 ක ප්‍රමාණයක් උදුරා දැමීමද, හෙක්ටයාර් 925 ක පමණ ප්‍රමාණයක් නැවත වගා කිරීමද සිදුවී තිබේ. ආයතනයෙහි සහනාධාර රහිතවද තේ නැවත වගාව සහ අලුතින් තේ වගාව සඳහා ගොවීන් යොමුවී ඇත.

තේ සඳහා හොඳ වෙළඳපොළ මිල, විකල්ප භෝග වලට යොමුවීම, තේ සමඟ අතුරු භෝග වගා කිරීම, අඩු ආදායම්ලාභීන් සඳහා ක්‍රියාත්මක කල විශේෂ ව්‍යාපෘති වැඩසටහන් සහ කාලීනව සිදුවන හිතකර සහ අහිතකර ප්‍රතිඵල මත මෙම යොමුවීමේ ප්‍රමාණය ස්ථායිව නොපවතී. කුඩා තේ වතු අංශය පිළිබඳ තේ පරීක්ෂක /ව්‍යාප්ති නිලධාරී කොට්ඨාශ මට්ටමින් ප්‍රශ්නාවලියක් මගින් රැස්කරගනු ලැබූ තොරතුරු පරිදි 2013 වසරේදී ගොවීන් 880 දෙනෙකු තේ වගාව සඳහා අලුතින් එකතුවී තිබුනි.

සහනාධාර රහිතව අළුතින් තේ වගාව කර තිබූ එම භූමි ප්‍රමාණය හෙක්ටයාර් 490 කි. එයින් හෙක්ටයාර 216 ක් මාතර දිස්ත්‍රික්කයෙන්ද, හෙක්ටයාර 72 ක් රත්නපුර, හෙක්ටයාර 66 ක් කළුතර සහ හෙක්ටයාර 20 ක් ගාල්ල යන දිස්ත්‍රික්කවලින් අනුපිළිවෙලින් වාර්තා වී තිබුණි. මේ අනුව 2014 වසර අවසානය වන විට සමස්ත කුඩා තේ වතු භූමි ප්‍රමාණය හෙක්ටයාර් 121,429 කි.

## කුඩා තේ ඉඩම් අංශයේ නිෂ්පාදනය හා ජාතික නිෂ්පාදන දායකත්වය

ගතවූ දශකයක කාලය තුළ කුඩා තේ ඉඩම් අංශයේ නිෂ්පාදනය කිලෝ මිලියන 206 සිට කිලෝ මිලියන 247 දක්වා එනම් කිලෝ මිලියන 42 කින් වර්ධනය කර ගැනීමට හැකිවී තිබේ. එම කාලය තුල ජාතික නිෂ්පාදන දායකත්වයද 64.9% සිට 73.1% දක්වා වර්ධනය වී තිබේ. 2013 වර්ෂය හා සැසඳීමේදී කිලෝ මිලියන 1.9 කින් හෙවත් 0.8% කින් නිෂ්පාදනය වර්ධනය කර ගැනීමට කුඩා තේ අංශයට හැකිවී තිබේ.

## කුඩා තේ ඉඩම් අංශයේ ඵලදායිතාවය

ජාතික පොහොර සහනාධාර සහිත මිල යටතේ විවෘත වෙළඳපලින් කුඩා තේ වතු හිමියන්ට පොහොර ලබාගැනීමට හැකිවීම සහ යහපත් දේශගුණික තත්වයන් මත 2014 වසරේදී ද කුඩා තේ ඉඩම් අංශයේ නිෂ්පාදනය මෙන්ම සාමාන්‍ය ඵලදායිතාවයද වැඩිවී තිබේ. එනම් සාමාන්‍ය වාර්ෂික ඵලදායිතාවය හෙක්ටයාර් එකකට / නිමි තේ කිලෝ ග්‍රෑම් 2107 සිට 2123 දක්වා එනම් 0.8% කින් වැඩිකර ගැනීමට හැකිවිය. 2013 වසරට සාපේක්ෂව උඩරට 15% කින්ද, පහත රට තේ නිෂ්පාදනය 1.3 කින් වැඩිවී තිබුනි. මැදරට තේ නිෂ්පාදනය 8% කින් අඩුවී තිබුණි. පහතරට සාමාන්‍ය ඵලදායිතාවය හෙක්ටයාර් එකකට / නිමි තේ කිලෝ ග්‍රෑම් 2227 සිට 2256 දක්වා එනම් 1.3% කින් වැඩිවී තිබුනි.

### තේ නැවත වගා බිම් ප්‍රමාණය හා නැවත වගා අනුපාතිකය

උපරිම ඵලදාවක් ලබමින් තේ භූමි ප්‍රමාණය ස්ථායීව පවත්වා ගැනීම සඳහා ජාතික ප්‍රතිපත්තියට අනුකූලව පවත්නා තේ භූමි ප්‍රමාණයෙන් 2% ක් වාර්ෂිකව තේ නැවත වගාකළ යුතුවේ. සංගණන තොරතුරු පරිදි කුඩා තේ ඉඩම් අංශයේ සමස්ත මේරූ තේ භූමි ප්‍රමාණය හෙක්ටයාර් 116,492 කි. එමෙන්ම හෙක්ටයාර් 21,613 ක් දැනටමත් වසර 25 ඉක්මවූ තේ ඉඩම් වේ. මෙම භූමි ප්‍රමාණය හැකි ඉක්මනින් නැවත වගාවට යොමු කිරීමේ අවශ්‍යතාවයක් පවතී. ජාතික අවශ්‍යතාවය මත හෙක්ටයාර් 2300 ක් වාර්ෂිකව නැවත වගාකල යුතු වේ. 2014 වසරේ තේ නැවත වගාව සඳහා ඉලක්ක කරනු ලැබූ භූමි ප්‍රමාණය හෙක්ටයාර 1125 ක් වූ අතර එයින් නැවත වගා කල භූමි ප්‍රමාණය හෙක්ටයාර 720කි. ඒ අනුව 2013 වසරේ දී පැවති 0.93 ක් වූ තේ නැවත වගා අනුපාතිකය 2014 වසරේදී 0.64 ක් දක්වා අඩුවී තිබුණි.

### භෝග පුනරුත්ථාපනය

නිර්දේශිත පරිදි කප්පාදුව සිදුකිරීම, පස සංරක්ෂණ ක්‍රම යෙදීම හා සෙවන පාලනය වැනි කටයුතු සමඟ පාළු තැන්වල තේ පැල සිටුවීම ඒකාබද්ධව සිදුකිරීම සඳහා බෝග පුනරුත්ථාපන දිරිදීමනාව ගෙවනු ලැබේ. මේ සඳහා අයදුම් කිරීම පෙර වර්ෂයට සාපේක්ෂව 30% කින් ද අවසර පත්‍ර නිකුත් කිරීමේ ප්‍රගතිය 27% කින් ද අඩුවී ඇත. වගාකරන ලද පැල සංඛ්‍යාව පැල මිලියන 0.271 කි. මෙය 2013 වසර සමග සැසඳීමේදී 46% කින් අඩුවී ඇත. අයවැය ප්‍රතිපාදන අනුව ඉලක්කගත පැල සංඛ්‍යාව මිලියන 0.80 කි.

### ව්‍යාප්ති හා උපදේශක සේවා

වර්ෂයතුල ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරනු ලැබූ ව්‍යාප්ති හා උපදේශක සේවා වැඩසටහන් ඉලක්කය 6854 කි. වාර්ෂික සැලැස්මේ පාංශු කළමණාකරනය ඉලක්ක වැඩසටහන තුල පාංශු හා ජල සංරක්‍ෂණ ඵලදායිතා සංවර්ධන විශේෂ වැඩසටහනද ක්‍රියාත්මක කරනු ලැබූ බැවින්, පාංශු කළමණාකරනයේ සමස්ත වැඩසටහන් ප්‍රගතිය 7064 දක්වා එනම් 3% කින් වැඩිවී තිබුණි.

එසේම 2014 වසරේ ව්‍යාප්ති වැඩසටහන් සඳහා ගොවි සහභාගිත්වයේ ප්‍රගතිය 315973 කි. වර්ෂයේ ඉලක්කගත ගොවි සංඛ්‍යාව 167559 කි. පාංශු කළමණාකරනය වැඩසටහන සඳහා ඉලක්කගත ගොවි සංඛ්‍යාව 17460 ක් වුවද පාංශු හා ජල සංරක්‍ෂණ ඵලදායිතා සංවර්ධන විශේෂ වැඩසටහන ද ක්‍රියාත්මක කිරීම හේතුවෙන් මෙම සංඛ්‍යාව 117644 දක්වා එනම් ගොවීන් 100194 කින් ( 574% කින් ) වැඩිවී තිබුණි.

ඒ අනුව ව්‍යාප්ති වැඩසටහන් සඳහා සමස්ත වාර්ෂික ගොවි සහභාගිත්වය 148414 කින් එනම් 188% කින් වැඩිවී තිබීමට ඉහත විශේෂ වැඩසටහන හේතුවී තිබුණි.

### කුඩා තේ වතු සංවර්ධන සමිති

1989 වර්ෂයේ සිට ආරම්භ කරන ලද කුඩා තේ වතු සංවර්ධන සමිති නීතිගත සංවිධාන බවට පත්කරන ලද සමිති ක්‍රමයකි. ප්‍රාදේශීය සංවිධාන 8 ක් සහ සමස්ත ලංකා සමිති සංවිධානයෙන් යුතු මෙම සමිති ක්‍රමය යටතේ 2014 වසර අවසානය වන විට සමිති 1383 ක් ලියාපදිංචි වී තිබුනි. එහි සමස්ත සාමාජික සංඛ්‍යාව 266,480 කි. 2013 වසර හා සසඳන විට 2014 වසරේ සමිති සංඛ්‍යාව 01 කින් වැඩිවී ඇත. සාමාජික සංඛ්‍යාව 14686 කින් හෙවත් 6% කින් වැඩිවී තිබුනි.

**ආයතනයේ මෙහෙයුම් පිරිවැය**

2014 වසරේ ආයතනයේ සංවර්ධන පිරිවැය රුපියල් මිලියන 345.104 කි. පුනරාවර්තන පිරිවැය රුපියල් මිලියන 252.774 කි. 2013 වර්ෂය හා සසඳන කළ සංවර්ධන පිරිවැය රුපියල් මිලියන 94.951 කින් අඩුවී තිබේ. පුනරාවර්ත පිරිවැය රුපියල් මිලියන 13.951 කින් වැඩිවී තිබේ. ඒ අනුව මෙහෙයුම් පිරිවැය හා සංවර්ධන පිරිවැය අතර අනුපාතය 0.73 කි. පසුගිය වසර හා සසඳන විට මෙහෙයුම් පිරිවැය 0.19 කින් වැඩිවී තිබේ.

**තේ ගොවි හා තේ පරීක්ෂක / ව්‍යාප්ති නිලධාරී අනුපාතිකය**

ඵලදායි ව්‍යාප්ති සේවාවන් සඳහා තිබිය යුතු ව්‍යාප්ති කාරක සහ ගොවි සංඛ්‍යාවේ අනුපාතිකය 1:1000 ක් පමණ වුවද, කුඩා තේ වතු අංශයේ ක්ෂේත්‍ර නිලධාරී හා තේ ගොවි අනුපාතිකය 1:2742 කි. මේ අනුව ආවරණ ගොවි සංඛ්‍යාව පහත හෙලීම සඳහා නිලධාරී සංඛ්‍යාව වැඩි කල යුතු මුත් ආයතනයේ ප්‍රතිපාදන හා පිරිවැය සීමා තත්ත්වයන් සැලකිල්ලට ගෙන එසේ වැඩිකල නොහැකිවුවද, ඒ වෙනුවට සේවා කටයුතු වලදී කුඩා තේ වතු සංවර්ධන සමිති වැනි ප්‍රජා සංවිධානවල සහායක සේවාවන්හි සහාය ලබාගැනීමට ආයතනය විසින් කටයුතු කරන ලදී.

**අමු දළු සඳහා මිල**

2014 වසර ශ්‍රී ලංකා තේ වෙළඳපොල සඳහා ලද මිල ගණන් පරිදි අමු දළු කිලෝවක් සඳහා වර්ෂාවසානයේ කුඩා තේ වතු හිමියන් සඳහා ලැබූ සාමාන්‍ය අමු දළු මිල උඩරට සඳහා රු. 61.47 ක් ද, මැදරට සඳහා රු.59ග98 ක් ද, පහතරට සඳහා රු. 71.37 ක් ද වූ අතර , සියළුම ප්‍රදේශයන්හි සාමාන්‍යය රු. 67.54 ක් විය. සියළුම ප්‍රදේශ සඳහා සාමාන්‍ය මිල පරිදි 2014 වසරේදී කුඩා තේ වතු හිමියන්ගේ නිෂ්පාදන ආන්තිකය ධන අගයක් ගෙන තිබුණි .

# කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය
# වාර්ෂික වාර්තාව – 2014

## 1. හැඳින්වීම.

### 1.1. ආයතනය හා කාර්යභාරය.

ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 35 දරන කුඩා තේ වතු සංවර්ධන පනත යටතේ, 1977 පෙබරවාරි මස 01 වන දින කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය පිහිටුවන ලදි.

අනතුරුව ප්‍රධාන ප්‍රඥප්තියට සංශෝධන එකතුකර 1991 අංක 36 දරණ පනත, 1997 අංක 21 දරණ පනත, 2003 අංක 34 දරන පනත සහ 2006 අංක 42 දරණ පනත සම්මත කරතිබේ.

**පරමාර්ථ :**

කුඩා තේ ඉඩම් සංවර්ධනය කිරීම, නිෂ්පාදනය වැඩි කිරීම, ඵලදායිතාවය වර්ධනය කිරීම, දළු අලෙවි කටයුතු සහ කුඩා තේ ඉඩම් හිමියන්ගේ සුභ සිද්ධිය පිණිස කටයුතු කිරීම ආයතනයේ පරමාර්ථ වේ.

**අධිකාරියේ කාර්යභාරය.**

1. කුඩා තේ වතු වල සහ තමන්ගේම නිෂ්පාදන මාර්ග නොමැති වෙනත් තේ වතු වලද සංවර්ධනයට අනුබල දීම හෝ සංවර්ධනය කිරීමට භාර ගැනීම.

2. එම තේ ඉඩම් වල ඵලදාව නිෂ්පාදන බවට පත් කිරීම සඳහා අවශ්‍ය තේ කර්මාන්ත ශාලා සහ වෙනත් පහසුකම් අත්කර ගැනීම හෝ සංවර්ධනය කිරීම.

3. මෙම තේ ඉඩම් වල හෝ එකී කර්මාන්තශාලා වල කෙරෙන නිෂ්පාදන අලෙවිය දියුණු කිරීම හෝ අලෙවි කිරීම භාර ගැනීම.

4. එකී ඉඩම් හා කර්මාන්ත ශාලා සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය විය හැකි පහසුකම් සහ සේවාවන් සපයාදීම හෝ ලබාදීම සඳහා නැතහොත් එම පහසුකම් සහ සේවාවන් ලබාදීම පහසු කිරීම සඳහා ද, එම ඉඩම් වල ඵලදාව නිෂ්පාදන බවට පත්කිරීමෙහි හෝ ඒවා ඇසුරුම් කිරීමෙහි යෙදී සිටින්නන්ට ව්‍යවස්ථාපිත හිමිකම් සහ පාරිශ්‍රමික ගෙවීමද ඇතුළුව ඔවුන්ගේ සුභ සිද්ධිය සඳහා ද අවශ්‍ය සියළු පියවර ගැනීම.

5. කුඩා තේ වතු සංවර්ධන සමිති ලියාපදිංචි කිරීම හා පාලනය කිරීමට සහ අධිකාරිය වෙත ලියාපදිංචිකර ඇති එවැනි සමිති වල සාමාජිකයනට අධාර ලබාදීම සහ ඒ හා සම්බන්ධ කාරණා සඳහා රීති සැදීමට විධිවිධාන සැලසීම.

6. කුඩා තේ වතුවල ආයෝජනය ප්‍රවර්ධනය කිරීම

7. දත්ත එකතු කිරීමට හා බෙදාහැරීමට භාර ගැනීම සහ කුඩා තේ වතු වල සංවර්ධන හැකියාව දැනගැනීම

8. උචිත ප්‍රතිපත්ති පිළබඳව අමාත්‍යාංශයට උපදෙස් දීම සහ වෙනත් අදාල නියෝජිත ආයතන සමග සම්බන්ධීකරණය කිරීම

ඉහත සඳහන් අංක 02,03,04 හි කාර්යභාරයන් කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ පනතින් ඉවත් කිරීමට සහ වෙනත් කාර්යයන් ආදේශ කිරීමට අවශ්‍ය කටයුතු කෙරෙමින් පවති.

මීට අමතරව 1978 ජනවාරි 01 වන දින සිට ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් වරින් වර පවරන ලද කාර්යයන් සහ අනෙකුත් අදාල පහත සඳහන් සෙසු කාර්යයන්ද ඇතුලත් වන පරිදි අධිකාරිය විසින් කටයුතු කරගෙන යන ලදි.

1. පෞද්ගලික අංශයේ කළමනාකාරිත්වය යටතේ පවත්නා ඉඩම් සංවර්ධනය කිරීම සඳහා පහත සඳහන් ආධාර ක්‍රමයන් ක්‍රියාත්මක කිරීම.

   I තේ නැවත වගාව. II අළුත් වගාව. III පාළු සැපයීම.

2. තේ පොහොර බෙදා හැරීම, වැවිලි ද්‍රව්‍ය, උපකරණ හා ප්‍රවාහන පහසුකම් ලබාදීම වැනි උපකාරක සේවාවන් ක්‍රියාත්මක කිරීම.

3. ව්‍යාප්ති හා උපදේශක සේවාවන් ක්‍රියාත්මක කිරීම.

**1.2. විගණන හා කළමනාකරණ කමිටු කටයුතු**

සමාලෝචිත වර්ෂයතුල විගණන හා කළමණාකරණ කමිටු රැස්වීම් 04 ක් පවත්වා ඇත.

කමිටුව විසින් පහත දැක්වෙන විෂය ක්ෂේත්‍රයන් සම්බන්ධව විමර්ශනයන් මූලිකව සිදුකරන ලදි.

1. අභ්‍යන්තර විගණන වාර්ෂික සැලැස්ම විමසුමට භාජනය කර අනුමත කිරීම.
2. අභ්‍යන්තර විගණන වාර්තා මගින් අනාවරණය කර තිබූ කරුණු සමාලෝචනයට භාජනය කිරීම හා යෝජනා ක්‍රියාත්මක කිරීම කඩිනම් කිරීමට කටයුතු කිරීම.
3. විගණකාධිපති වාර්තා සමාලෝචනය කිරීම හා එමගින් දක්වා ඇති ඌනතාවයන් නැවත ඇතිවීම වැලැක්වීම සඳහා අවශ්‍ය වූ නිවැරදි කිරීම් සිදුකිරීමට පියවර ගැනීම.
4. විගණන විමසුම් පිළිබඳ පිළිතුරු ඉදිරිපත් කිරීමේ ප්‍රගතිය පරීක්ෂාව.
5. වාර්ෂික අයවැය ලේඛණ, අභ්‍යන්තර මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කිරීම සහ කාර්ය සාධනය මත ඉලක්ක සාක්ෂාත් කරගැනීම ඇගයීම.

6. අවසන් ගිණුම් හා වාර්ෂික වාර්තා කාලිනව ඉදිරිපත් කිරීම සහතික වීම.

7. මානව සම්පත් හා වෙනත් සම්පත් පරිපාලනය හා සංවර්ධනය කිරීමේ කටයුතු සමාලෝචනය කිරීම හා ඒ පිළිබඳ අදාල තිරණ ගැනිම.

8. කාර්ය මණ්ඩල විනය පවත්වාගැනිමට අදාල කරුණු සමාලෝචනය කිරීම, ආයතනික වියදම් අරපිරිමැස්ම කෙරෙහි යොමුකරවීම.

9. පවත්නා චක්‍රලේඛ හා රෙගුලාසි අනුව කටයුතු කරන්නේද යන්න පිළිබඳව විමර්ශනය කිරීම හා අඩුපාඩු නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනිම

2014 වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණන සැලැස්ම 2014.03.20 දින විගණන හා කළමණාකරන කමිටුව විසින් අනුමත කරන ලද අතර 2014.03.26 දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරඇත.

විගණන පරීක්‍ෂණ පැවැත්වීම හා වාර්තා කිරීම යටතේ සැලසුම් කරන ලද විගණන පරීක්‍ෂණ 13 ක්ද වෙනත් පරීක්‍ෂණ 07 ක්ද 2014 වසරේ නිමකර තිබේ.

විගණන විමසුම වෙනුවෙන් පරිපාලන අංශය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳ තොරතුරු කාලිනව විගණන කමිටුව හා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කිරීමට කටයුතු කරඇත.

## 1.3 පරිපාලනමය කටයුතු

### 1.3.1 සංවිධාන ව්‍යුහය සහ බඳවාගැනිමේ පරිපාටිය

ආයතනය සඳහා අනුමත කාර්ය මණ්ඩලය පිටු අංක 63 හි දක්වා ඇත. සේවක තොරතුරු සවිස්තරව පිටු අංක 64 හි දක්වා ඇත. එමෙන්ම එම සේවක තොරතුරු වයස් කාණ්ඩ හා අධ්‍යාපන සුදුසුකම් පරිදි සවිස්තරව පිටු අංක 65 හා 66 හි දක්වා ඇත.

**වර්ෂය තුළ සිදුකරන ලද පත්කිරීම්**

| **තනතුර** | **ශ්‍රේණිය** | **සංඛ්‍යාව** |
|---|---|---|
| සාමාන්‍යාධිකාරි | HM 2-1 | 01 |
| සහකාර කළමනාකරු (ව්‍යාප්ති) | MM 1-1 | 01 |
| සහකාර කළමනාකරු (මුදල්) | MM 1-1 | 01 |
| සහකාර කළමනාකරු (මානව සම්පත් හා පාලන) | MM 1-1 | 03 |
| සහකාර ප්‍රාදේශිය කළමනාකරු (ව්‍යාප්ති) | JM 1-1 | 04 |
| පරිපාලන නිලධාරී | JM 1-1 | 02 |
| කාර්යභාර නිලධාරී | JM 1-1 | 10 |
| තේ පරික්ෂක ව්‍යාප්ති නිලධාරි | MA 2-2 | 15 |
| කළමණාකරන සහකාර (තාක්‍ෂණික නොවන) | MA 1-2 | 13 |
| තේ තවාන් සහකාර | MA 1-2 | 01 |
| රියදුරු | PL -3 | 03 |
| කාර්යාල සහායක | PL -1 | 03 |
| කම්කරු | PL -1 | 08 |
| **එකතුව** | | **65** |

### 1.3.2 ව්‍යවස්ථාපිත අරමුණු උදෙසා වූ ප්‍රතිඵල පාදක කළමණාකරණ උපාය මාර්ග

ව්‍යවස්ථාපිත අරමුණු ඉටුකරලීම පිණිස වාර්ෂික ක්‍රියාත්මක සැලැසුම් තුලින් කටයුතු කරනු ලැබූ අතර, එම වාර්ෂික ක්‍රියාත්මක සැලැසුම් ප්‍රතිඵල පාදක කළමණාකරන ආයතනික උපායමාර්ග යටතේ 2010 වසරේ සිට මේ දක්වා යාවත්කාලීන කරමින් ක්‍රියාත්මක කරන ලදී.

මෙහිදී ආයතනයෙහි දිගුකාලීන සංවර්ධන ප්‍රතිඵලය " කුඩා තේවතු හිමියන්ගේ ජීවන තත්ත්වය නංවාලීම " ලෙස හඳුනාගෙන තිබේ.

2014 වසර වෙනුවෙන් ද පහත සඳහන් මධ්‍යකාලීන ප්‍රතිඵල ලගාකර ගැනීම පිණිස වාර්ෂික ක්‍රියාත්මක සැලැස්ම අනුව කටයුතු කරන ලදී.

### සංවර්ධන ප්‍රතිඵල

**දිගුකාලීන බලපෑම/ ප්‍රතිඵලය** - කුඩා තේ වතු හිමියන්ගේ ජීවන තත්ත්වය නංවාලීම

**මධ්‍ය කාලීන ප්‍රතිඵල**

1. වසර 06 කදී වසරකට / හෙක්ටයාරයකට / සකස්කල තේ / කිලෝ
   පහත රට 2700 දක්වා
   මැද රට 1700 දක්වා
   ඌව 1500 දක්වා වැඩි කිරීම

2. වසර 5 කදී කම්හල් මට්ටමින් අමු දලු ගුණාත්මය 60% දක්වා වර්ධනය කිරීම

3. වසර 06 ක් තුළ ප්‍රජා මූලික සංවිධාන 50% කින් ශක්තිමත් කිරීම

4. වසරක් තුල වඩාත් සඵලදායී ලෙස ක්‍රියාත්මක වීම සඳහා ආයතනය ශක්තිමත් වීම

5. වසර 05 ක් තුලදී තේ ඉඩම් වලින් 10% ක් අමතර ආදායම් ඉපැයීමේ කටයුතු සඳහා යොමුකරවීම

# 2. ශ්‍රී ලංකාවේ කුඩා තේ ඉඩම් අංශය.

2.1. **කුඩා තේ ඉඩම්** :

තේ පාලන පනතට අනුව " අක්කර 10 ට අඩු තේ ඉඩම් කුඩා තේ ඉඩම්" ලෙස සැලකේ. එසේ වුවද ශ්‍රී ලංකා තේ මණ්ඩලය යටතේ පැවති අක්කර 10 -50 දක්වා වූ තේ ඉඩම් සඳහා සංවර්ධන කටයුතු කිරීමේ බලතල 1978 ජනවාරි මස 01 දා සිට කුඩා තේවතු සංවර්ධන අධිකාරිය වෙත ගරු වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා විසින් පවරන ලදී. ඒ අනුව පුද්ගලික අයිතිය යටතේ ඇති අක්කර 50 ට අඩු සියළුම තේ ඉඩම්වල සංවර්ධනය සඳහා අදාල සහායක සේවාවන් ආයතනය විසින් මෙතෙක් සපයා තිබුණි.

2012 වසර වන විට අක්කර 10 සිට 50 දක්වූ බිම් ප්‍රමාණ සඳහා ඉඩම් සංවර්ධන සේවා සැපයීම ශ්‍රී ලංකා තේ මණ්ඩලය වෙතත්, ව්‍යාප්ති සේවා සැපයීම ශ්‍රී ලංකා තේ පරේෂණායතනය වෙතත් පවරා ඇත. ඒ අනුව 2012 වර්ෂයේ සිට පනතෙහි පවතින ප්‍රතිපාදන පරිදි අක්කර 10 ට අඩු තේ බිම් සඳහා පමණක් ඒවායේ සංවර්ධනයට සහ ඊට අදාල සහායක සේවාවන් ආයතනය විසින් සපයන ලදී.

2.2. **කුඩා තේ ඉඩම් භූමි ප්‍රමාණය** :

2005 කුඩා තේ වතු සංගණනය පරිදි කුඩා තේ ඉඩම් භූමි ප්‍රමාණය වූ හෙක්ටයාර් 132,329 ද ( පර්චස් 20 අඩු භූමි සහිතව ) සහිතව ශ්‍රී ලංකාවේ සමස්ත තේ ඉඩම් භූමි ප්‍රමාණය හෙක්ටයාර් *221,968 ක් පමණ වනු ඇත. මේ අනුව ශ්‍රී ලංකාවේ සමස්ත තේ භූමි ප්‍රමාණයෙන් 59% ක් කුඩා තේ ඉඩම් අංශයට අයත් වේ. 1994 / 95 කුඩා තේ ඉඩම් සංගණන තොරතුරු හා සසඳා බැලීමේදී දශකයක කාල පරිච්ඡේදයක් තුල ශ්‍රී ලංකාවේ කුඩා තේ ඉඩම් භූමි ප්‍රමාණය හෙක්ටයාර් 82,919 සිට හෙක්ටයාර් 116,492 දක්වා ( පර්චස් 20 ට වැඩි ඉඩම් පමණි.) එනම් 40% කින් පමණ වැඩිවී ඇත.

තේ පරීක්ෂක ව්‍යාප්ති නිලධාරී කොට්ඨාශ පාදක තොරතුරු සමීක්ෂණය - 2013 පරිදි හෙක්ටයාර් 312 ප්‍රමාණයක් 2013 වසර සඳහා තේ වගාවට අලුතින් එකතුවී තිබේ. 2013 වර්ෂය අවසාන වන විට තේ වගාව සහිත මුළු කුඩා තේ ඉඩම් භූමි ප්‍රමාණය හෙක්ටයාර් 121,267 කි.

**රූ සටහන අංක 01**

**මුළු තේ ඉඩම් ප්‍රමාණයට කුඩා තේ ඉඩම් හි දායකත්වය**




මූලාශ්‍ර

* ශ්‍රී ලංකා තේ ඉඩම් පිළිබඳ සංගණන වාර්තාව 1994 / 1995 - ශ්‍රී ලංකා තේ මණ්ඩලය

* කුඩා තේ ඉඩම් පිළිබඳ සංගණනය 2005 - ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව

2.3. **කුඩා තේ ඉඩම් හිමියෝ.**

2005 වසර වන විට කුඩා තේ හිමියන් සංඛ්‍යාව 370,842 කි. (පර්චස් 20 වඩා අඩු වගාකරුවන්ද ඇතුළුව) මොවුන්ගෙන් 82% ක් තනි අයිතිය යටතේ වූ ඉඩම් හිමි කුඩා තේ වතු හිමියන් වන අතර, මෙම පිරිස සඳහා තේ වගා භූමි ප්‍රමාණයෙන් 76% ක් පමණ අයත් වේ. තේ පරීක්ෂක ව්‍යාප්ති නිලධාරී කොට්ඨාශ පාදක වාර්ෂික තොරතුරු පරිදි 2013 වසර අවසානය වන විට කුඩා තේ ඉඩම් හිමියන් සංඛ්‍යාව 391226 කි.

**කුඩා තේ ඉඩම් සංඛ්‍යාව.**

1994 සිට 2005 වසර දක්වා කාලය තුළ සමස්ත කුඩා තේ ඉඩම් සංඛ්‍යාව 206,652 සිට 350,982 (පර්චස් 20 වැඩි) දක්වා එනම් 70% කින් වැඩිවී ඇත. 2013 වසර අවසානය වන විට පර්චස් 20 ට වැඩි ඉඩම් කැබලි සංඛ්‍යාව 370842 කි. පර්චස් 20 ට අඩු ඉඩම් කැබලි සංඛ්‍යාව සහිතව මුළු ඉඩම් කැබලි සංඛ්‍යාව 417607 කි.

2005 වසරේ සංගණනය පරිදි සමස්ත කුඩා තේ ඉඩම් කැබලි සංඛ්‍යාව සහ බිම් ප්‍රමාණය විසිරීම පහත පරිදි වේ. ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ 123 ක් යටතේ ග්‍රාම නිලධාරී වසම් 3692 ක කුඩා තේ ඉඩම් ව්‍යාප්තවී තිබේ.

**වගු අංක 1**

**ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික් අනුව කුඩා තේ ඉඩම් කැබලි සංඛ්‍යාව - 2005**

| දිස්ත්‍රික්කය | කුඩා තේ ඉඩම් හිමියන් සංඛ්‍යාව | කුඩා තේ ඉඩම් සංඛ්‍යාව | හෙක්. ගණන | ඉඩම් සංඛ්‍යාව / ඒකකය හෙක්. ප්‍රමාණය අනුව | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | <1/2 අඩු | 1/2 - < 1 | 1 - < 2 | 2 - < 3 | 3 - < 5 | 5 - < 10 | >10 |
| කොළඹ | 478 | 491 | 246 | 423 | 35 | 22 | 4 | 4 | 2 | 1 |
| ගම්පහ | 9 | 9 | 2 | 9 | - | - | - | - | - | - |
| කළුතර | 35,908 | 38,263 | 7,823 | 35,793 | 1,927 | 396 | 74 | 38 | 26 | 9 |
| මහනුවර | 29,224 | 30,747 | 16,058 | 25,457 | 3,345 | 1,094 | 353 | 206 | 140 | 152 |
| මාතලේ | 1,387 | 1,408 | 1,672 | 1,011 | 166 | 81 | 40 | 38 | 41 | 31 |
| නුවරඑළිය | 16,875 | 17,547 | 7,205 | 15,270 | 1,663 | 302 | 100 | 77 | 55 | 80 |
| ගාල්ල | 81,491 | 90,524 | 27,427 | 79,432 | 8,296 | 1,840 | 467 | 276 | 166 | 47 |
| මාතර | 63,273 | 67,613 | 25,417 | 58,470 | 6,835 | 1,296 | 430 | 290 | 176 | 116 |
| හම්බන්තොට | 2,386 | 2,533 | 546 | 2,373 | 141 | 14 | 4 | 1 | - | - |
| කුරුණෑගල | 145 | 151 | 180 | 111 | 23 | 8 | 3 | 2 | - | 4 |
| බදුල්ල | 28,101 | 29,679 | 9,020 | 26,989 | 1,747 | 574 | 182 | 85 | 56 | 46 |
| මොණරාගල | 634 | 637 | 199 | 551 | 72 | 11 | 1 | 2 | - | - |
| රත්නපුර | 92,038 | 97,984 | 30,441 | 87,070 | 7,910 | 1,880 | 530 | 345 | 141 | 108 |
| කෑගල්ල | 18,893 | 19,637 | 6,093 | 17,333 | 1,680 | 400 | 98 | 65 | 31 | 30 |
| **එකතුව** | **370,842** | **397,223** | **132,329** | **350,292** | **33,840** | **7,918** | **2,286** | **1,429** | **834** | **624** |
| **ප්‍රතිශතය** | | | | **88.19** | **8.52** | **1.99** | **0.57** | **0.36** | **0.21** | **0.16** |

**මූලාශ්‍රය - ශ්‍රී ලංකාවේ කුඩා තේ ඉඩම් පිළිබඳ සංගණනය – 2005**

කුඩා තේ ඉඩම් අංශයේ තේ ඉඩම් වර්ධනය සඳහා විශේෂයෙන් අමුදලු සඳහා ලැබෙන මිල ඉහල යාම, තේ වගාව සඳහා දිරි දීමනා මුදල වැඩි කිරීම, විශාල ඉඩම් කැබලි කිරීම සහ විකල්ප වගා නොමැති ඉඩම් තේ වගාවට යොමුවීම යන කරුණු බලපා තිබේ.

## 2.4. භූමි වර්ගීකරණය

* කුඩා තේ ඉඩම් භූමි ප්‍රමාණයෙන් අක්කර 113,190 ( 34.6% ) අක්කර එකකට වඩා අඩු තේ ඉඩම් වන අතර, අක්කර 198,707 ( 60.8% ) අක්කර දෙකකට වඩා අඩු තේ ඉඩම් වේ. අක්කර 10 ට වැඩි තේ ඉඩම් ප්‍රමාණය අක්කර 59,731 කි. ( 18.3 % )

**වගු අංක 2**

**ශ්‍රී ලංකාවේ කුඩා තේ ඉඩම් භූමි ප්‍රමාණය සහ කැබලි සංඛ්‍යාව අනුව වර්ගීකරණය - 2005**

| අක්කර | භූමි ප්‍රමාණය අක්කර | % | ඉඩම් කැබලි සංඛ්‍යාව | ප්‍රතිශතය % |
|---|---|---|---|---|
| 1 ට අඩු | 113,190 | 34.6 | 297,342 | 75 |
| 1 - 2 ට අඩු | 85,517 | 26.2 | 74,314 | 18.7 |
| 2 - 3 ට අඩු | 31,882 | 9.8 | 15,101 | 3.8 |
| 3 - 5 ට අඩු | 18,413 | 5.6 | 5,299 | 1.3 |
| 5 - 10 ට අඩු | 18,251 | 5.5 | 2,936 | 0.7 |
| 10 සහ වැඩි | 59,731 | 18.3 | 2,231 | 0.5 |
| | **326,984** | | **397,223** | |

**මූලාශ්‍රය : ශ්‍රී ලංකා තේ ඉඩම් පිළිබඳ සංගණන වාර්තාව**

## 2.5. කුඩා තේ ඉඩම් අංශයේ නිෂ්පාදනය :

1991 වර්ෂයේ ජාතික තේ නිෂ්පාදනයෙන් 50% ක දායකත්වය දැරූ කුඩා තේ වතු අංශය, වසර 2014 වන විට සිය දායකත්වය 73.1% ක් දක්වා වර්ධනය කරගෙන තිබේ. (උප ලේඛන අංක 04 )

2014 වසරේ ජාතික තේ නිෂ්පාදනය කිලෝ මිලියන 388.03 කි. මෙය 2013 වසරට (කි.මිලි.340.02) සාපේක්ෂව 0.58% කින් අඩුවී තිබේ.

එහෙත්, කුඩා තේ වතු අංශයේ නිෂ්පාදනය 2013 වසරේ කිලෝ මිලියන 245.43 සිට 247.38 දක්වා කිලෝ මිලියන 1.95 කින් එනම් 0.8% කින් 2014 වසරේදී වැඩි වී තිබේ. 2000 වසරේ 60% ක්වූ කුඩා වතු අංශයේ ජාතික නිෂ්පාදන දායකත්ව ප්‍රතිශතය 2014 වසර වන විට 73.1% ක් දක්වා වර්ධනය වී ඇත.

## වගු අංක 3
## ශ්‍රී ලංකාවේ ජාතික තේ නිෂ්පාදනය - 2013 / 2014
## කළමනාකාරිත්ව ආයතන අනුව දායකත්වය

| | කළමනාකාරිත්ව ආයතන | තේ නිෂ්පාදනය මෙ. ටො. 2013 | % | 2014 | % |
|---|---|---|---|---|---|
| 01 | පෞද්ගලික අංශය(කුඩා තේ අංශය) | 245,436 | 72.18 | 247,388 | 73.18 |
| 02 | ප්‍රාදේශීය වැවිලි සමාගම් | 91,139 | 26.80 | 88,978 | 26.33 |
| 03 | ජනතා වතු සංවර්ධන මණ්ඩලය<br>රාජ්‍ය වැවිලි සංස්ථාව | 2,911 | 0.86 | 1,351 | 0.40 |
| 04 | අනෙකුත් | 540 | 0.16 | 313 | 0.09 |
| | **මුළු එකතුව** | **340,026** | | **338,038** | |

(අනෙකුත් = තේ ශක්ති , ටි ස්මොල් හොල්ඩර් ෆැක්ටරීස් ලිමිටඩ් ,ශ්‍රී ලංකා තේ පර්යේෂණායතනය, සමුපකාර, ඇල්කඩුව වැවිලි සමාගම , කළුබෝවිටියන තේ කම්හල් සමාගම)

මූලාශ්‍රය :- ශ්‍රී ලංකා තේ මණ්ඩලය.

( ආයතන වර්ගිකරණයෙහි මිලදි ගත් දලු සියල්ලම කුඩා තේ ඉඩම් අංශයේ නිෂ්පාදනයට ඇතුලත් කර ඇත. මෙහිදි පෞද්ගලික අංශය යන්න කුඩා තේ ඉඩම් අංශය ලෙස සලකා ඇත.)

### රූප සටහන් අංක 02

### කළමනාකාරිත්ව ආයතන අනුව ජාතික නිෂ්පාදන දායකත්ව ප්‍රතිශතය - 2014



**රූප සටහන් අංක 03**

**කුඩා තේ වතු අංශයේ මාසික තේ නිෂ්පාදනය -කිලෝ මිලියන**

**( 2013 / 2014 )**




මූලාශ්‍රය :- ශ්‍රී ලංකා තේ මණ්ඩලය.

**රූප සටහන් අංක 04**

**කුඩා තේ වතු අංශයේ වාර්ෂික තේ නිෂ්පාදන ප්‍රවනතාවන්**

**2000 - 2014 දක්වා (කිලෝ මිලියන)**




මූලාශ්‍රය :- ශ්‍රී ලංකා තේ මණ්ඩලය.

## 2.6. කුඩා තේ ඉඩම් නිෂ්පාදන සංයුතිය

2014 වර්ෂයේ ජාතික තේ නිෂ්පාදනයෙහි සමස්ත පහත රට තේ නිෂ්පාදනයෙන් 95.8% ක්ද, මැදරට සමස්ත නිෂ්පාදනයෙන් 62% ක්ද, උඩරට සමස්ත නිෂ්පාදනයෙන් 18% ක්ද කුඩා තේ ඉඩම් අංශයේ නිෂ්පාදනයෙන් සමන්විත වී තිබුණි. (වගු අංක 04) තවද 2014 වසරේදී ද පුද්ගලික අංශයේ සමස්ත තේ නිෂ්පාදනයෙන් 81.3% ක් ම පහතරට තේ නිෂ්පාදනයට අයත් විය.

2013 වර්ෂය හා සසඳන කල 2014 වර්ෂයේදී කුඩා තේ ඉඩම් අංශයේ උඩරට තේ නිෂ්පාදනය 15% කින් වැඩිවී ඇත. මැදරට තේ නිෂ්පාදනය 8% කින් අඩුවී ඇත. පහත රට තේ නිෂ්පාදනය 1.3% කින් වැඩිවී තිබේ.

**වගු අංක 04**

**කුඩා තේ ඉඩම් අංශයේ භෞතික හා නිෂ්පාදන දායකත්වය ( පිහිටීම මත )**

**2013/ 2014**

| | | | පිහිටීම | | | |
|---|---|---|---|---|---|---|
| | | වර්ෂය | උඩරට | මැදරට | පහත රට | එකතුව |
| කුඩා තේ බිම් ප්‍රමාණය | (හෙක්ටයාර) | | 5913 | 21403 | 89176 | 116492 |
| දායක ප්‍රතිශතය | | | 5% | 18% | 77% | |
| ජාතික නිෂ්පාදනය | මෙ.ටො | 2013 | 75777 | 56127 | 208122 | 340026 |
| | % | | 22% | 17% | 61% | |
| | මෙ.ටො | 2014 | 78874 | 49205 | 209952 | 338031 |
| | % | | 24% | 13% | 63% | |
| කුඩා තේ නිෂ්පාදනය | මෙ.ටො | 2013 | 13401 | 33442 | 198593 | 245436 |
| | % | | 5.5% | 13.6% | 80.9% | |
| | මෙ.ටො | 2014 | 15399 | 30749 | 201239 | 247389 |
| | % | | 6.2% | 12.4% | 81.3% | |
| ජාතික නිෂ්පාදනයට දායකත්වය | % | 2013 | 3.94 | 9.84 | 58.40 | 72.18 |
| | | 2014 | 4.5% | 9.09% | 59.51% | 73.16% |
| ඵලදායිතාවය | වසරකට / හෙකටයාරයකට/ සකස්කල තේ | 2013 | 2266 | 1563 | 2227 | 2107 |
| | | 2014 | 2095 | 1436 | 2256 | 2123 |

**මූලාශ්‍රය**

i. කුඩා තේ ඉඩම් පිළිබඳ සංගණන වාර්තාව 2005 - ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

ii. මාසික සංඛ්‍යාන සාරාංශය - ශ්‍රී ලංකා තේ මණ්ඩලය 2014

## 2.7. කුඩා තේ ඉඩම් අංශයේ ඵලදායිතාවය.

2013 සහ 2014 වසර දෙකෙහිද ජාතික තේ නිෂ්පාදනයේ වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් බලපා ඇත්තේ කුඩා තේ ඉඩම් අංශයේ නිෂ්පාදනය හා ඵලදායිතාවය වර්ධනය විමයි.

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ තේ නිෂ්පාදනය පිළිබඳ දත්ත පරිදි 2013 වසරේ කුඩා තේ ඉඩම් අංශයේ සාමාන්‍ය ඵලදායිතාවය වසරකට හෙක්ටයාරයකට නිමි තේ කිලෝ 2017 කි. 2014 වසරේ කුඩා තේ ඉඩම් අංශයේ සාමාන්‍ය ඵලදායිතාවය හෙක්ටයාරයකට නිමිතේ කි.ග්‍රෑ. 2123 දක්වා 5.5% කින් වර්ධනය වී තිබේ.

වගු අංක 05

**කුඩා තේ ඉඩම් අංශයේ ඵලදායිතාවය 2014 ( නිමි තේ / කිලෝ )**

**පරිපාලන දිස්ත්‍රික් පදනමින්**

| පරිපාලන දිස්ත්‍රික්කය | කුඩා තේ බිම් ප්‍රමාණය (හෙක්:) | උස් බිම් | මැදි බිම් | පහත් බිම් | එකතුව | ඵලදායිතාවය (හෙක්:01ට නිමි තේ කිලෝ )* |
|---|---|---|---|---|---|---|
| බදුල්ල | 7,863 | 4082547 | 6239830 | - | 10322376 | 1312 |
| ගාල්ල | 25,325 | - | - | 51606362 | 51606362 | 2037 |
| හම්බන්තොට | 492 | - | - | 265549 | 265549 | 540 |
| කළුතර | 7,588 | - | - | 17647571 | 17647571 | 2326 |
| කොළඹ | 246 | - | - | 683323 | 683323 | 2777 |
| මහනුවර | 12,486 | 440357 | 15264575 | 11885983 | 27590915 | 2210 |
| කෑගල්ල | 5,753 | 228252 | 829 | 7981717 | 8210798 | 1427 |
| මාතලේ | 1,190 | - | 2351224 | 470957 | 2822181 | 2371 |
| මාතර | 22,971 | - | 63588 | 42191255 | 42254843 | 1839 |
| නුවරඑළිය | 5,971 | 10613673 | 5788099 | 783383 | 17185154 | 2878 |
| රත්නපුර | 28,232 | 34790 | 1041109 | 67723718 | 68799616 | 2437 |
| එකතුව | - | **15399618** | **30749252** | **201239819** | **247388689** | |
| **2005 සංගණනය පාදකව බිම් ප්‍රමාණය | - | **5913** | **21403** | **89176** | **116492** | |
| ඇස්තමේන්තු ගත සාමාන්‍ය ඵලදායිතාව/ හෙක්ටයාරයකට | 2014 | 2095 | 1,436 | 2,256 | 2,123 | - |
| | 2013 | 2,266 | 1,63 | 2,227 | 2,107 | - |

මුලාශ්‍රය:- ශ්‍රී ලංකා තේ මණ්ඩලය

* පරිපාලන දිස්ත්‍රික් පදනමට පරිබාහිරව කම්හල්වලට අමු දළු මිලදී ගැනීම මත දත්ත යථාරූපි නොවේ

** මේරූ තේ භූමි ප්‍රමාණය

## 2.9 කුඩා තේ අංශයේ ආයෝජනයන්

2014 වර්ෂයේ සංවර්ධන හා ආයතනික ප්‍රාග්ධන පිරිවැය ලෙස රුපියල් මිලියන 600 ක් ද, පුනරාවර්ථන වියදම් ලෙස රුපියල් මිලියන 275 ක් ද වනසේ රුපියල් මිලියන 875 ක මුදලක් සඳහා ආයතනික ක්‍රියාත්මක සැලැස්ම පිළියෙල කරන ලදී. නමුත් වර්ෂය අවසානයේදී ජාතික අයවැය දෙපාර්තමේන්තුවෙන් ප්‍රාග්ධන වැයෙන් රුපියල් මිලියන 50 ක් අඩුකර ඇත. ඒ අනුව මුදල රුපියල් මිලියන 550 ක් විය.

නමුත් 2014 වසර සඳහා ලද ප්‍රාග්ධන මුදල රුපියල් මිලියන 476.25 ක් හා පුනරාවර්තන වියදම රුපියල් මිලියන 266.692 ක් වනසේ සමස්ත ලැබීම් රුපියල් මිලියන 742.942 ක් විය.

ප්‍රාග්ධන ලැබීම් රුපියල් මිලියන 476.25 න් රුපියල් මිලියන 248.28 ක් පෙර වර්ෂයේ සහනාධාර ගෙවීම් සඳහා උපයෝගී කරගනු ලැබීය. එබැවින් 2014 වසර අවසාන වන විට රුපියල් මිලියන 134.35 ක් සහනාධාර ගෙවීම් උපචිත වියදම් ලෙස ගිණුම්ගත කරන ලදී.

මේ අනුව කුඩා තේවතු අංශය සඳහා ආයෝජන කටයුතු මෙහෙයවීම පිණිස ආයතනික යටිතල පහසුකම් වැඩි දියුණු කිරීමද, 2014 වසරේදී ද ඊට සමාගාමීව සිදුකල යුතු වුවද ප්‍රතිපාදන සීමාව තුල එම කාර්යන් සඳහා ආයතනය විසින් ප්‍රමුඛතාවය ලබාදී නොමැත.

**වගු අංක 06**

**පුද්ගලික අංශයේ තේ නිෂ්පාදනය සහ**

**ප්‍රතිපාදිත සෙස් අරමුදල - 1998 – 2014**

| වර්ෂය | සමස්ත තේ නිෂ්පාදනය ( කි.ග්‍රෑ.මි.) | සමස්ත නිෂ්පාදන දායකත්වය % | | සෙස් මුදල ( රු. මිලි. ) | පුද්ගලික අංශය (කුඩා තේ ඉඩම් අංශය ) සඳහා ප්‍රතිපාදන සෙස් මුදල (රු. මිලි. ) | ප්‍රතිපාදිත අරමුදලේ ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|
| | | පුද්ගලික අංශය | අනෙකුත් අංශ | | | |
| 1998 | 280.05 | 59.2 | 46.1 | 680.3 | 188.5 | 27.7 |
| 1999 | 283.76 | 57.8 | 42.2 | 651.1 | 247.9 | 33.0 |
| 2000 | 305.84 | 60.0 | 40.0 | 701.2 | 259.4 | 37.0 |
| 2001 | 295.09 | 62.1 | 37.9 | 741.0 | 274.5 | 37.0 |
| 2002 | 310.01 | 61.1 | 38.9 | 767.5 | 230.2 | 30.0 |
| 2003 | 303.23 | 61.9 | 38.1 | 739.6 | 332.0 | 37.0 |
| 2004 | 308.08 | 65.9 | 34.1 | 753.8 | 371.6 | 43.7/39.5 |
| 2005 | 317.19 | 64.8 | 35.1 | 771.1 | 290.68 | 39.5 |
| 2006 | 310.82 | 68.3 | 26.1 | 1088.4 | 461.56 | 39.51/43.28 |
| 2007 | 304.61 | 67.5 | 26.2 | 1146.6 | **426.00 (ලද සැබෑ මුදල රු 418.00 කි) | - |
| 2008 | 318.46 | 67.4 | 25.9 | 1294.64 | 405.30 | - |
| 2009 | 291.13 | 69.3 | 24.8 | 1360.40 | 367.80 | - |
| 2010 | 331.42 | 69.4 | 23.8 | 1193.98 | 394.93 | - |
| 2011 | 327.53 | 69.9 | 30.1 | 2057.80 | 391.59 | - |
| 2012 | 326.27 | 71.4 | 28.6 | 2051.40 | 418.83 | - |
| 2013 | 340.02 | 72.2 | 27.8 | 2240.20 | 520.14 | - |
| 2014 | 338.03 | 73.1 | 26.9 | ……….. | 742.94 | |

මූලාශ්‍රය : ශ්‍රී ලංකා තේ මණ්ඩලය

** 2007 වර්ෂයේ සිට ප්‍රතිපාදන භාණ්ඩාගාර අරමුදලින් ලැබී ඇත.

**මෙහෙයුම් සමාලෝචනය**

2014 වසර ක්‍රියාත්මක සැලැස්ම පරිදි ඉලක්කගත මෙහෙයුම් පිරිවැය රුපියල් 0.48 කි. එහෙත් එම වසරේ මෙහෙයුම් පිරිවැය 0.73 කි. 2013 වර්ෂයට සාපේක්ෂව 2014 වසරේ මෙහෙයුම් සමාලෝචනය අනුව මෙහෙයුම් පිරිවැය 0.19 කින් වැඩි වී තිබේ.

**වගු අංක 7**

**මෙහෙයුම් සමාලෝචනය ( 1995 සිට 2014 දක්වා )**

| වර්ෂය | සංවර්ධන පිරිවැය රු. '000 | මෙහෙයුම් පිරිවැය රු. '000 | සංවර්ධන රුපියලක් සඳහා මෙහෙයුම් පිරිවැය. |
|---|---|---|---|
| 1995 | 79821 | 59150 | 0.74 |
| 1996 | 52665 | 58095 | 1.10 |
| 1997 | 63379 | 70547 | 1.11 |
| 1998 | 101191 | 127080 | 1.26 |
| 1999 | 153503 | 116822 | 0.76 |
| 2000 | 115575 | 128460 | 1.11 |
| 2001 | 112839 | 142654 | 1.26 |
| 2002 ** | 166982 | 188126 | 1.13 |
| 2003 | 170134 | 155216 | 0.91 |
| 2004 | 215430 | 156809 | 0.73 |
| 2005 | 192263 | *158695 | 0.83 |
| ***2006 | 198118 | *186396 | 0.94 |
| 2007 | 183782 | 178985 | 0.97 |
| 2008 | 208255 | 188725 | 0.91 |
| 2009 | 185660 | 202146 | 1.08 |
| 2010 | 189194 | 205385 | 1.08 |
| 2011 | 208407 | 218527 | 1.04 |
| 2012 | 276324 | 233738 | 0.85 |
| 2013 | 440060 | 238823 | 0.54 |
| 2014 | 345104 | 252774 | 0.73 |

** 2002 වර්ෂය දක්වා ව්‍යාපෘති පිරිවැයද ඇතුලත්ව මෙහෙයුම් පිරිවැය ගණනය කර ඇත.

+ මෙහෙයුම් පිරිවැය උපචිත පදනම යටතේ ගණනය කර ඇත.

## 3. ව්‍යවස්ථාපිත අරමුණු හා ප්‍රතිඵල පාදක සංවර්ධන කාර්යයන්

ආයතනය ස්ථාපිත කිරීම සඳහා වූ පනතට පදනම්ව පැවති ප්‍රධාන ව්‍යාවස්ථාපිත අරමුණු 4ට අනතුරුව වර්ෂ 1997 , 2003 හා 2006 යන වර්ෂවලදී පනතට එකතුකරන ලද සංශෝධන පරිදි ආයතනයෙහි ව්‍යවස්ථාපිත අරමුණු හා ඊට අදාල සංවර්ධන කාර්යයන් පහත සඳහන් පරිදි වේ. මෙයින් අංක 02 , 03 හා අංක 04 හි සඳහන් කාර්යන් පනතෙන් ඉවත් කිරිමට සහ වෙනත් කාර්යන් ආදේශ කිරීමට අවශ්‍ය කටයුතු ද ක්‍රියාත්මක වෙමින් පැවතුනි.

ව්‍යවස්ථාපිත අරමුණු :-

01. කුඩා තේ වතු වල සහ තමන්ගේම නිෂ්පාදන මාර්ග නොමැති වෙනත් තේ වතු වලද සංවර්ධනයට අනුබල දීම හෝ සංවර්ධනය කිරීමට භාර ගැනීම

සංවර්ධන කාර්යයන් :-

I. තේ නැවත වගා දිරි දීමනා ක්‍රමය
II. තේ අළුත් වගා දිරි දීමනා ක්‍රමය
III. භෝග පුනරත්ථාපන දිරි දීමනා ක්‍රමය

02. එම තේ ඉඩම් වල ඵලදාව නිෂ්පාදන බවට පත් කිරීම සඳහා අවශ්‍ය තේ කර්මාන්ත ශාලා සඳහා වෙනත් පහසුකම් අත්කර ගැනීම

සංවර්ධන කාර්යයන් :-

අධිකාරිය විසින් 1977 වසරේදී “ තේ ශක්ති අරමුදල ” පිහිටවනු ලැබූ අතර 2000 වසරේ සිට එය වෙනම ආයතනයක් වශයෙන් ඉහත අරමුණ වෙනුවෙන් අදාල කටයුතු ක්‍රියාත්මක කරනු ලැබේ.

03. මෙම තේ ඉඩම්වල හෝ එකී කර්මාන්ත ශාලාවල කෙරෙන නිෂ්පාදන අලෙවිය දියුණු කිරීම හෝ අලෙවි කිරීම භාරගැනීම

සංවර්ධන කාර්යයන් :-

I. කුඩා තේ වතු හිමියන් දළු සපයන කම්හල්හි අමුදළු ගුණාත්මය වර්ධනය කිරීම
II. කුඩා තේ වතු වල නිෂ්පාදිත දළු අලෙවිය සඳහා කුඩා තේ වතු සංවර්ධන සමිති මෙහෙයවීම

04. එකී ඉඩම් හා කර්මාන්තශාලා සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය වියහැකි පහසුකම් සහ සේවාවන් සපයාදීම හෝ ලබාදීම නැතහොත් එම පහසුකම් හා සේවාවන් ලබාදීම පහසු කිරීම සඳහා ද තේ ඉඩම්වල ඵලදාව නිෂ්පාදන බවට පත්කිරීමෙහි හෝ ඇසුරුම් කිරීමෙහි යෙදී සිටින්නන්ගේ සුභසිද්ධිය සඳහා අවශ්‍ය පියවර ගැනීම.

සංවර්ධන කාර්යයන් :-

I. තේ පොහොර බෙදාහැරීම , පැළ ද්‍රව්‍ය , උපකරණ හා ප්‍රවාහන සේවා පහසුකම් ලබාදීම වැනි උපකාරක සේවාවන් ක්‍රියාත්මක කිරීම

II. ව්‍යාප්ති හා උපදේශක සේවාවන් ක්‍රියාත්මක කිරීම

III. තේ ඉඩම් වල ඵලදාව නිෂ්පාදන බවට පත්කිරීමෙහි යෙදී සිටින්නන්ගේ සුභ සිද්ධිය සඳහා පියවර ගැනීම සහ සහායක සේවා පුළුල් කිරීමේ අරමුණින් කුඩා තේ වතු සංවර්ධන සමිති නීතිගත සංවිධාන වශයෙන් පිළිගැනීම පිණිස සමිති ලියාපදිංචි කිරීම සහ ඒවායේ කටයුතු පිළිබඳ රෙගුලාසි පැනවීම.

IV. කුඩා තේ වතු සංවර්ධන සමිති ප්‍රජා මූලික සංවිධාන වශයෙන් ශක්තිමත් කිරීම සහ කුඩා තේ ඉඩම් හිමියන් තම ඉඩමේ අමතර ආදායම් ඉපයීමේ කටයුතු සඳහා යොමුකිරීම

05. කුඩා තේ වතු සංවර්ධන සමිති ලියාපදිංචි කිරීම හා පාලනය කිරීමට සහ අධිකාරිය වෙත ලියාපදිංචි කර ඇති එවැනි සමිතිවල සාමාජිකයිනට ආධාර ලබාදීම සහ ඒ හා සම්බන්ධ කාරණා සඳහා රීති සෑදීමට විධිවිධාන සැලසීම.

සංවර්ධන කාර්යයන් :-

I. කුඩා තේ වතු සංවර්ධන සමිති ආයතනය විසින් ලියාපදිංචි කිරීම
II. කුඩා තේ වතු සංවර්ධන සමිති රීති සකස් කිරීම
III. කුඩා තේ වතු සංවර්ධන සමිති සමස්ත ලංකා සංවිධානය පවත්වාගෙනයාම සඳහා අවශ්‍ය මූල්‍ය ආධාර හා සේවා සහ සහයෝගිතාව ලබාදීම
IV. කුඩා තේ වතු සංවර්ධන සමිති සමස්ත ලංකා සංවිධානය පවත්වාගෙනයාම සඳහා වාර්ෂික මූල්‍ය ප්‍රතිපාදන ලබාදීම
V. කුඩා තේ වතු සංවර්ධන සමිති සඳහා අනෙකුත් ආධාර හා සේවා සහියෝගීතාව ලබාදීම

06. කුඩා තේ වතු වල ආයෝජනය ප්‍රවර්ධනය කිරීම

සංවර්ධන කාර්යයන් :-

I. ආයතනික සහනාධාරවලට පරිභාහිර විශේෂ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම (කුඩා වැවිලි ව්‍යවසායකත්ව වැඩසටහන , දිවිනැගුම වැනි)
II. විශේෂිත ණය ක්‍රම ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකම් සලසාදීම ( තේ සංවර්ධන ව්‍යාපෘති චක්‍රිය ණය අරමුදල් ක්‍රමය , ලංකා බැංකු විශේෂ ණය යෝජනා ක්‍රමය)
III. පොහොර ණය ක්‍රමය ක්‍රියාත්මක කිරීම
IV. ආයතනික තේ තවාන් පවත්වාගෙන යාම
V. මව් වගා පවත්වාගෙන යාම
VI. වාණිජ තේ තවාන් ලියා පදංචි කිරීම සහ දැනුම හා පුහුණුව ලබාදීම
VII. කාලීනව වැඩිවන ආයෝජන පිරිවැය අවම කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සලසා දීම
VIII. ජාතික ප්‍රතිපත්තිය වූ 2% තේ නැවත වගා අනුපාතිකය උපරිම මට්ටමින් රඳවාගැනීම පිණිස අවශ්‍ය කටයුතු කිරීම

07. දත්ත එකතු කිරීමට හා බෙදාහැරීමට බාර ගැනීම සහ කුඩා තේ වතු වල සංවර්ධන හැකියාව දැනගැනීම

සංවර්ධන කාර්යයන් :-

I. කුඩා තේ ඉඩම් අංශය සඳහා සංගණන ක්‍රියාත්මක කිරීම තුලින් දත්ත හා තොරතුරු ලබාගැනීම
II. කාලීනව සමීක්ෂණ ක්‍රියාත්මක කිරීම
III. කුඩා තේ ඉඩම් හිමියන් ලියාපදංචි කිරීම
IV. තේ පරීක්ෂක / ව්‍යාප්ති නිලධාරී කොට්ඨාශ මට්ටමින් පිරිවැය දත්ත සහ අදාල අනෙකුත් තොරතුරු ලබාගැනීම

08. උචිත ප්‍රතිපත්ති පිළිබඳව අමාත්‍යාංශයට උපදෙස්දීම සහ වෙනත් අදාල නියෝජිත ආයතන සමග සම්බන්ධීකරණය කිරීම

සංවර්ධන කාර්යයන් :-

I. ශ්‍රී ලංකා තේ පර්යේෂණායතනය සමග පර්යේෂණ හා ව්‍යාප්ති සංසදය හා අන්තර් ආයතන උපදේශක කමිටුව පවත්වාගෙනයාම

## ක්‍රියාත්මක සැලැස්ම හා ප්‍රායෝගික ගැටළු

කුඩා තේ වතු අංශය සඳහා ප්‍රතිඵල පාදක කළමණාකරන ප්‍රවේශය තුලින් අරමුණු කරනු ලැබූ සංවර්ධන ප්‍රතිඵල සාක්ෂාත් කරගැනීම පිණිස 2014 වසර සඳහා සැකසූ ක්‍රියාත්මක සැලැස්ම වෙනුවෙන් ඇස්තමේන්තුගත සංවර්ධන පිරිවැය රුපියල් මිලියන 564 කි. එහෙත් ඒකාබද්ධ අරමුදලින් සංවර්ධන පිරිවැය සඳහා ප්‍රතිපාදිත මුදල රුපියල් මිලියන 514 ක් විය.

ක්‍රියාත්මක සැලැස්මේ ප්‍රාග්ධන පිරිවැයෙන් 90.56% ක් ඉඩම් සංවර්ධන කටයුතු සඳහා වෙන්කරන ලදි. ව්‍යාප්ති කටයුතු සඳහා 2.7% ක්ද ප්‍රජාමූල සංවිධාන ශක්තිමත් කිරීම සඳහා 1.41% ක්ද ආයතනික කටයුතු ශක්තිමත් කිරීම සඳහා 5.3% ක්ද ඇස්තමේන්තුකර තිබුණි.

ප්‍රතිපාදිත මුදල වූ රුපියල් මිලියන 514 න් රුපියල් මිලියන 345.1 ක් සංවර්ධන පිරිවැය විය. මේ අනුව ඇස්තමේන්තුව හා සත්‍ය වියදම අතර වෙනස රුපියල් මිලියන 169 කි. එමෙන්ම සමස්ත ප්‍රාග්ධන ප්‍රතිපාදන ඇස්තමේන්තුව රුපියල් මිලියන 550 ක් වුවද, ප්‍රාග්ධන ලැබීම් රුපියල් මිලියන 476.25 ක් විය. මේ අනුව ප්‍රතිපාදන ලැබීම් රුපියල් මිලියන 74 ක් වර්ෂය තුලදී නොලැබුණු බැවින්, උපචිත වියදම් වැඩි වූ අතර, නියමිත කාලයේදී කුඩා තේ වතු හිමියන්ට සහනාධාර ගෙවීමටද නොහැකිවිය.

**මධ්‍යකාලීන ප්‍රතිඵල පාදක ඉලක්ක හා කාර්යඵලය**

## 3.1. මධ්‍යකාලීන ප්‍රතිඵල - 01

## වසර 06කදී වසරකට / හෙක්ටයාරයකට / සකස්කල තේ / කිලෝ පහත රට 2700 දක්වා ද මැද රට 1700 දක්වාද ඌව 1500 දක්වාද වැඩි කිරීම

### 3.1.1 වාර්ෂිකව 2% මට්ටමින් තේ නැවත වගාව පවත්වාගෙන යාම

කුඩා තේ ඉඩම් වල තේ නිෂ්පාදනය හා ඵලදායීතාවය වැඩි කිරීම පිණිස අඩු අස්වනු සහිත පැරණි බීජ තේ ඉඩම් හි නැවත අනුමත රිකිලි තේ වගා කිරීමට අනුබල දීම සඳහා දිරි දීමනා ලබාදීම කෙරේ. උස් / මැදි හා පහත් බිම් යන සියළු බිම් සඳහා හෙක්ටයාරයකට රු.350,000/- ක් වනසේ අදාල වර්ෂයතුල වාරික වශයෙන් පහත පරිදි ආධාර මුදල් ගෙවන ලදි.

**තේ නැවත වගා සහනාධාර වාරික මුදල - හෙක්ටයාරයකට (රුපියල්)**

| | පස සාරවත් කිරීම සහිතව | පස සාරවත් කිරීම රහිතව |
|---|---|---|
| පැරණි තේ උදුරා දැමීම | රු. 90,000 | රු. 90,000 |
| පස පුනරුත්ථාපනය 1 වන වාරිකය | රු. 35,000 | - |
| පස පුනරුත්ථාපනය 2 වන වාරිකය | රු.140,000 | - |
| තේ නැවත වගාව | රු. 50,000 | රු. 135,000 |
| පළමු වසර නඩත්තුව | රු. 35,000 | රු. 35,000 |
| මුළු මුදල | රු.350,000 | රු. 260,000 |

**රූප සටහන් අංක - 05**

**තේ නැවත වගා සහනාධාර මුදල වැඩි කිරීම/ හෙක්ටයාරයකට 1979 වර්ෂයේ සිට**




* නැවත වගා සහනාධාරය සංශෝධනය කර ඇත.

**උස් මැදි සහ පහත් බිම් සඳහා සහනාධාර මුදල සමාන වේ

**නැවත වගාව සඳහා අයදුම් කිරීම**

තේ නැවත වගාව කිරීම පිණිස ගොවීන් 16632 දෙනෙකුගෙන් පමණ අයදුම්පත්‍ර ලබාගැනීම සඳහා 2014 ක්‍රියාත්මක සැලැස්ම මගින් ඉලක්ක කරනු ලැබීය. නමුත් ගොවීන් 10778 දෙනෙකු නැවත වගාව සඳහා අයදුම් කර තිබුණි. එම සංඛ්‍යාවෙන් 10134 ක් සඳහා අවසරපත්‍ර වර්ෂය තුලදී නිකුත් කරනු ලැබිණි. තේ නැවත වගා ආධාර ක්‍රමය සඳහා අයදුම් කිරීම 2013 වර්ෂයට සාපේක්ෂව 2014 වර්ෂයේදී 28% කින් අඩුවී තිබුණි.

**රූප සටහන් අංක - 06**

**වගා ආධාර සඳහා වාර්ෂිකව අයදුම් කිරීම 2000 සිට 2014 දක්වා**




**කාර්යඵලය**

තේ නැවත වගාව සඳහා අවසරපත්‍ර නිකුත් කිරීම 26% කින් සහ අවසරපත්‍රලාභීන් පැරණි තේ උදුරා දැමීමට අයදුම්කල හෙක්ටයාර ප්‍රමාණය 13% කින් පෙර වර්ෂයට සාපේක්ෂව අඩුවී ඇත.

2014 වර්ෂය තුලදී තේ නැවත වගා කිරීම සඳහා උදුරා දැමූ හෙක්ටයාර ප්‍රමාණය 810 කි. එම ප්‍රමාණය වාර්ෂික ඉලක්ක ගත භූමි ප්‍රමාණයෙන් එනම් හෙක්ටයාර 1600 න් 50% ක ප්‍රගතියකි. මෙම ප්‍රගතිය 2013 වර්ෂයේ 59% කි. පෙර වර්ෂයට සංසන්දනාත්මකව ඉහත ඉලක්කයට සාපේක්ෂව ප්‍රගතියේ ප්‍රතිශතය 9% කින් ද, උදුරා දමන ලද හෙක්ටයාර ප්‍රමාණය 32% කින් ද අඩුවී ඇත.

2014 වර්ෂයේ පස පුනරුත්ථාපනය කරනු ලැබූ හෙක්ටයාර ප්‍රමාණය 739 කි. මෙම ප්‍රමාණය 2013 වර්ෂයට සාපේක්ෂව 21% ක අඩුවීමකි. වර්ෂයේ ඉලක්කගත හෙක්ටයාර ප්‍රමාණය හෙක්ටයාර 1100 ක් වූ බැවින්, එහි කාර්යඵලය 67% ක ප්‍රගතියකි.

2014 වර්ෂයේ තේ නැවත වගාකල භූමි ප්‍රමාණය හෙක්ටයාර 720 කි. වර්ෂයේ ඉලක්කගත හෙක්ටයාර ප්‍රමාණය 1125 ක් වූ බැවින්, එයින් 64% ක ප්‍රගතියක් පමණක් වර්ෂය තුලදී ලබාගෙන ඇත. 2013 වර්ෂයට සාපේක්ෂව වගාකල හෙක්ටයාර ප්‍රමාණය ද 38% කින් අඩුවී තිබේ.

## 08 වන වගුව

## තේ නැවත වගා ආධාර ක්‍රමය

## 2013 / 2014 වර්ෂයේ භෞතික කාර්යඵලය ( හෙක්ටයාර්)

| කාර්යය | වර්ෂය | පහත් බිම් | | | | | උස් / මැදි බිම් | | | එකතුව | වාර්ෂික ඉලක්කය | පෙර වර්ෂය හා සැසඳීමේදී ප්‍රගතිය අඩු /වැඩි වීමේ ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | ගාල්ල | කළුතර | මාතර | රත්නපුර | කෑගල්ල | මහනුවර | නුවරඑළිය | ඌව | | | |
| 1. ලැබුණු ඉල්ලුම් පත්‍ර සංඛ්‍යාව | 2014 | 1755 | 556 | 2259 | 2451 | 664 | 1006 | 1066 | 1021 | 10778 | 16632 | (28) |
| | 2013 | 3106 | 747 | 2701 | 3230 | 1063 | 1504 | 1163 | 1411 | 14925 | 19275 | 20 |
| 2. නිකුත් කළ අවසර පත්‍ර සංඛ්‍යාව | 2014 | 1634 | 560 | 2193 | 2191 | 531 | 1007 | 980 | 1038 | 10134 | 10464 | (26) |
| | 2013 | 2544 | 920 | 2602 | 2903 | 1026 | 1430 | 998 | 1379 | 13802 | 17153 | 16 |
| 3. අවසර පත්‍ර ආවරණය වු බිම් ප්‍රමාණය | 2014 | 441 | 172 | 479 | 554 | 151 | 265 | 253 | 225 | 2540 | 1893 | (13) |
| | 2013 | 548 | 218 | 472 | 610 | 233 | 320 | 257 | 270 | 2928 | 2140 | 10 |
| 4. බිම් සැකසීම | 2014 | 158 | 68 | 166 | 153 | 57 | 84 | 62 | 62 | 810 | 1600 | (32) |
| | 2013 | 232 | 89 | 248 | 254 | 94 | 104 | 80 | 87 | 1188 | 2000 | 09 |
| 5. පස පුනරුත්ථාපනය - 1 වාරිකය | 2014 | 142 | 34 | 168 | 143 | 67 | 70 | 61 | 74 | 758 | 1500 | (8) |
| | 2013 | 163 | 36 | 187 | 141 | 53 | 87 | 75 | 78 | 820 | 1610 | (15) |
| 6. පස පුනරුත්ථාපනය - II වාරිකය | 2014 | 145 | 32 | 180 | 128 | 58 | 67 | 57 | 71 | 738 | 1100 | (21) |
| | 2013 | 187 | 46 | 182 | 181 | 66 | 93 | 99 | 79 | 933 | 1100 | 05 |
| 7. තේ නැවත වගා කිරීම | 2014 | 150 | 33 | 151 | 164 | 42 | 69 | 63 | 47 | 720 | 1125 | (38) |
| | 2013 | 241 | 72 | 238 | 242 | 81 | 111 | 98 | 82 | **1165 | 1250 | 31 |
| 8. වසරකට පසු නඩත්තුව | 2014 | 177 | 40 | 168 | 191 | 55 | 86 | 74 | 43 | 833 | 1000 | (5) |
| | 2013 | 182 | 21 | 225 | 153 | 48 | 89 | 77 | 83 | 878 | 900 | 09 |
| 8. ගෙවන ලද වගා ආධාර මුදල ( රුපි. මිලියන ) | 2014 | 41.30 | 15.08 | 61.56 | 53.33 | 20.96 | 23.54 | 21.40 | 20.92 | 258.09 | 391.75 | (27) |
| | 2013 | 70.68 | 20.07 | 70.67 | 74.56 | 23.91 | 33.28 | 31.30 | 27.40 | *351.87 | 416.66 | 55 |

මුලාශ්‍රය : කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ ප්‍රගති වාර්තාව

* කෘෂි උපකරණ සඳහා රුඃමිලියන 0.213 ඇතුළුව ගෙවන ලද මුළු සහනාධාර මුදල රුඃමිලියන 258.3 කි.

* * IFAD ව්‍යාපෘති භෞතික කටයුතුද ඇතුළුව උදුරා දැමීම හෙක්ටයාර 812 ක්ද, පස පුනරත්ථාපනය හෙක්ටයාර 778 ක්ද තේ නැවත වගාව හෙක්ටයාර 761 ක්ද 2014 වසරේ දී නිමකර තිබේ.

**රූප සටහන් අංක - 07**

**තේ නැවත වගා ආධාර ගෙවීම්හි වාර්ෂික ප්‍රගතිය ( රු. ද. ල. )**

**1993 – 2014**




* සෙස් මුදල සංශෝධනය වීම මත ප්‍රතිශතය දැක්විය නොහැක.

තේ නැවත වගා සහනාධාරලාභීන් සඳහා 2014 වසරේදී රුපියල් මිලියන 258.09 ක් ගෙවා තිබුණි. 2013 වර්ෂය හා සසඳනවිට ගෙවනු ලැබූ සහනාධාර මුදල රුපියල් මිලියන 93.78 කින් හෙවත් 27% කින් අඩුවී ඇත. සහනාධාරලාභීන් සඳහා කෘෂි උපකරණ ලබාදීම වෙනුවෙන් රුපියල් මිලියන 0.21 ක්ද ඇතුළුව සමස්ත වශයෙන් රුපියල් මිලියන 258.3 ක් සහනාධාර වශයෙන් ගෙවා ඇත.

### 3.2.1 තේ අළුත් වගා ආධාර ක්‍රමය

ප්‍රතිපත්තිමය තිරණ මත 2003 වර්ෂයේ සිට අත්හිටවනු ලැබූ තේ අළුත් වගා ආධාර ක්‍රමය 2010 වර්ෂයේ සිට නැවත ක්‍රියාත්මක කිරීමට කටයුතු කර ඇත. ඒ අනුව විකල්ප බෝග හා ආදායම් මාර්ග නොමැති ප්‍රදේශ සඳහා සීමිත ප්‍රතිපාදන යටතේ තේ අළුත් වගාව කිරීම සඳහා ප්‍රතිපාදන සැලසීමට කටයුතු කරන ලදි. තේ අළුත් වගාව සඳහා අවසර පත්‍ර නිකුත් කරනු ලැබූ උපරිම බිම් ප්‍රාමණය අක්කර 01කි.

**තේ අළුත් වගා සහනාධාර වාරික මුදල - හෙක්ටයාරයකට (රුපියල්)**

| | පස සාරවත් කිරීම සහිතව | පස සාරවත් කිරීම රහිතව |
|---|---|---|
| බිම් සැකසීම | රු. 70,000 | රු. 70,000 |
| පස පුනරුත්ථාපනය 1 වන වාරිකය | රු. 25,000 | - |
| පස පුනරුත්ථාපනය 2 වන වාරිකය | රු.100,000 | - |
| තේ අළුත් වගාව | රු. 30,000 | රු. 100,000 |
| පළමු වසර නඩත්තුව | රු. 25,000 | රු. 25,000 |
| මුළු මුදල | රු.250,000 | රු. 195,000 |

**රූප සටහන් අංක - 08**

**තේ අළුත් වගා සහනාධාර මුදල වැඩි කිරීම/ හෙක්ටයාරයකට 1979 සිට**




**කාර්යඵලය**

2014 වසරේදී තේ අළුත් වගාව සඳහා අයදුම්පත්‍ර 6248 ක් ලැබී තිබුණි. ඉලක්කගත ඉල්ලුම්පත්‍ර සංඛ්‍යාව 3631 කි. ප්‍රතිපාදන සීමාව සැලකිල්ලට ගෙන 5315 දෙදෙනෙකු සඳහා අවසරපත්‍ර නිකුත් කරන ලදි.

හෙක්ටයාර 375 ක් බිම් සැකසීම ඉලක්ක කර තිබුනි. හෙක්ටයාර 426ක බිම් සැකසීම නිමකර තිබුණි. එනම් ඉලක්කය අනුව 114% ක් බිම් සැකසීම නිමකර තිබුණි.වර්ෂය තුලදී තේ අළුත් වගාව සඳහා හෙක්ටයාර 215 ක් ඉලක්ක කරනු ලැබුණි. එහෙත් හෙක්ටයාර 401ක් තේ අළුත් වගාව නිමකර තිබුණි.

පෙර වර්ෂයට සාපේක්ෂව අළුත් වගාව සඳහා බිම් සැකසීම 65% කින් ද, වගාකල භූමි ප්‍රමාණය හෙක්ටයාර 138 කින් හෙවත් 52% කින් ද වැඩිවී තිබුණි.

2014 වසරේ තේ අළුත් වගාව වෙනුවෙන් ගෙවූ මුළු මුදල රුපියල් මිලියන 66.98 කි. පෙර වර්ෂයට සාපේක්ෂව ගෙවූ සහනාධාර මුදල 58%කින් වැඩිවී ඇත.

**09 වන වගුව**

**තේ අළුත් වගා ආධාර ක්‍රමය**

**2013/2014 වර්ෂයේ භෞතික කාර්‍යසාධනය ( හෙක්ටයාර් )**

| කාර්යය | වර්ෂය | පහත් බිම් | | | | | උස් / මැදි බිම් | | | එකතුව | ඉලක්ක | පෙර වර්ෂය හා සැසදීමේදී අඩු/වැඩි වීමේ ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | ගාල්ල | කළුතර | මාතර | රත්නපුර | කෑගල්ල | මහනුවර | නුවරඑළිය | ඌව | | | |
| 1. ලැබුණු ඉල්ලුම් පත්‍ර සංඛ්‍යාව | 2013 | 843 | 915 | 463 | 705 | 616 | 80 | 84 | 124 | 3830 | | 16 |
| | 2014 | 844 | 1566 | 714 | 1408 | 1146 | 136 | 224 | 210 | 6248 | | 63 |
| 2. නිකුත් කල අවසර පත්‍ර සංඛ්‍යාව | 2013 | 342 | 871 | 447 | 524 | 445 | 63 | 53 | 127 | 2872 | 2442 | (5) |
| | 2014 | 780 | 1562 | 695 | 1188 | 556 | 135 | 182 | 217 | 5315 | 3631 | 85 |
| 3 බිම් සැකසීම | 2013 | 28 | 66 | 35 | 65 | 40 | 09 | 10 | 08 | 258 | 260 | (0.7) |
| | 2014 | 67 | 101 | 62 | 106 | 53 | 12 | 10 | 14 | 426 | 375 | 62 |
| 4 වගාව | 2013 | 28 | 70 | 33 | 69 | 40 | 10 | 06 | 07 | 263 | 260 | 10 |
| | 2014 | 67 | 98 | 62 | 88 | 53 | 13 | 09 | 12 | 401 | 215 | 52 |
| 5. ගෙවන ලද ආධාර මුදල ( රුපි. මිලියන ) | 2013 | 5.21 | 8.95 | 7.37 | 10.90 | 6.08 | 1.62 | 1.08 | 1.20 | 42.41 | 22.40 | 83 |
| | 2014 | 8.44 | 16.76 | 10.96 | 16.67 | 8.26 | 1.68 | 1.64 | 2.56 | 66.98 | 51.50 | 58 |

මුලාශ්‍රය : කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ ප්‍රගති වාර්තාව

**රූප සටහන් අංක - 09**

**තේ අළුත් වගා ආධාර ගෙවීම්හි වාර්ෂික ප්‍රගතිය ( රු. ද. ල. )**

**1993 – 2014**




- 2006 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා තේ අළුත් වගා සහනාධාර ක්‍රමය ක්‍රියාත්මක නොවුනි.

### 3.3.1 භෝග පුනරුත්ථාපන ආධාර ක්‍රමය

ඒකක ඵලදායිතාවය වර්ධනය කිරීම අරමුණු කර දළු නෙලන රිකිලි තේ ඉඩම් වල නිර්දේශිත කප්පාදුව අනුගමනය කිරීමේදී පාළු සම්පූර්ණ කිරීම, පස සංරක්ෂණ ක්‍රම (කාණු පද්ධති/ ගල් වැටි පිළිසකර කිරීම) හා සෙවන පාලනය කිරීම ඇතුළු අනෙකුත් වගා පිළිවෙත් ඒකාබද්ධව සිදු කිරීම (සෙවන, කප්පාදුව, වල්පැල නෙලීම ) වෙනුවෙන් භෝග පුනරුත්ථාපන ආධාර ක්‍රමය යටතේ දිරි දීමනා ගෙවනු ලැබේ.

ඉදිරි වර්ෂ 10 ක කාලයක් තුළ සාර්ථක ලෙස තේ වගාව පවත්වාගෙන යාහැකි ඉඩම් මෙම ආධාර ක්‍රමය සඳහා නිර්දේශ කරනු ලබන අතර, තේ ඉඩම් දෙවන කප්පාදු අවස්ථාවට එළඹ තිබීම හෝ වගාවේ වයස අවුරුදු 07 ඉක්මවා තිබීම, ආධාර ලබා ගැනීම සඳහා සුදුසුකම් වේ.

මෙම ආධාර ක්‍රමය යටතේ, සමූහ වශයෙන් පිහිටි පාළු සපයා දළු නෙලන තේ වගාව පුනරුත්ථාපනය කිරීමේ පදනම මත උඩරට / මැදරට අක්කරයකට පැල 1,000 ක් සහ පහත රට අක්කරයකට පැල 750 ක උපරිමයකට යටත්ව පැලයකට රු. 25/- බැගින් වාරික 2 කදී ආධාර ගෙවීම කරනු ලැබේ.

**කාර්යඵලය**

2014 වර්ෂයේ භෝග පුනරුත්ථාපන ආධාර ක්‍රමය සඳහා 1809 දෙනෙකු අයදුම්කර තිබුණි. මෙම ප්‍රමාණයෙන් 1498 දෙනෙකු සඳහා අවසර පත්‍ර නිකුත් කරන ලදී. මෙය ඉලක්කගත අවසර පත්‍ර සංඛ්‍යාවෙන් 83% ක ප්‍රගතියකි. 2013 වසරට සාපේක්ෂව ඉල්ලුම්පත්‍ර සංඛ්‍යාව 30% කින් ද නිකුත්කරනු ලැබූ අවසර පත්‍ර සංඛ්‍යාව 27% කින්ද අඩුවී තිබුණි.

අවසරපත්‍ර පරිදි ඉලක්කගත පැල සංඛ්‍යාව 800,000 ක් වූ අතර මෙය 2013 වසරට සාපේක්ෂව 20% ක අඩුවීමකි.

පළමු වාරිකය ගෙවනු ලැබූ පැල සංඛ්‍යාව 271,015 කි. මෙය ඉලක්කගත පැල සංඛ්‍යාව වූ පැල 800,000 න් 34% ක ප්‍රගතියකි. පෙර වර්ෂයට සාපේක්ෂව පළමු වාරිකය ගෙවූ පැල සංඛ්‍යාව 465% කින් අඩුවී තිබේ.

දෙවන වාරිකය ගෙවූ පැල සංඛ්‍යාව 232,034 කි. මෙය ඉලක්කගත පැල සංඛ්‍යාව වූ 550,000 න් 42% ක ප්‍රගතියකි. පෙර වර්ෂයට සාපේක්ෂව දෙවන වාරිකය ගෙවූ පැල සංඛ්‍යාව 45% කින් අඩුවී තිබේ.

2014 වර්ෂයේදී භෝග පුනරුත්ථාපනය සඳහා සහනාධාර රුපියල් මිලියන 5.91 ක් ගෙවා ඇත. මෙය පෙර වර්ෂයට සාපේක්ෂව 47% ක අඩුවීමකි.

## 10 වන වගුව

### භෝග පුනරුත්ථාපන ආධාර ක්‍රමය

### 2013 - 2014 වර්ෂයේ භෞතික කාර්යඵලය ( පැල සංඛ්‍යාව )

| කාර්යය | වර්ෂය | පහත් බිම් | | | | | උස් / මැදි බිම් | | | එකතුව | ඉලක්ක | පෙර වර්ෂය හා සැසදිමේදී අඩු/වැඩි වීමේ ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | ගාල්ල | කළුතර | මාතර | රත්නපුර | කෑගල්ල | මහනුවර | නුවරඑළිය | ඌව | | | |
| 1. ලැබුණු ඉල්ලුම් පත්‍ර සංඛ්‍යාව | 2014 | 272 | 147 | 209 | 436 | 87 | 366 | 145 | 147 | 1809 | | (30) |
| | 2013 | 637 | 274 | 422 | 393 | 155 | 298 | 238 | 174 | 2591 | | (39) |
| 2. නිකුත් කල අවසර පත්‍ර සංඛ්‍යාව | 2014 | 228 | 146 | 195 | 301 | 42 | 365 | 71 | 150 | 1498 | 2089 | (27) |
| | 2013 | 421 | 247 | 397 | 267 | 139 | 250 | 149 | 171 | 2041 | 2442 | (44) |
| 3 ඉලක්ක ගත පැල සංඛ්‍යාව | 2014 | 149180 | 49727 | 121183 | 148185 | 34311 | 130283 | 67678 | 99453 | 800000 | | (25) |
| | 2013 | 211896 | 133068 | 191876 | 146367 | 77960 | 147727 | 81615 | 70125 | 1060634 | | 5 |
| 4 1 පළමු වාරිකය ගෙවූ පැළ සංඛ්‍යාව | 2014 | 34827 | 15792 | 21767 | 37026 | 16825 | 90361 | 22835 | 31554 | 271015 | 800000 | (46) |
| | 2013 | 99523 | 47597 | 68832 | 76805 | 34517 | 71248 | 36183 | 62887 | 497592 | 1300000 | (35) |
| 5 දෙවන වාරිකය ගෙවූ පැළ සංඛ්‍යාව | 2014 | 40526 | 9169 | 32559 | 46815 | 19650 | 45896 | 18290 | 19129 | 232034 | 550000 | (45) |
| | 2013 | 85641 | 33539 | 42666 | 59688 | 26419 | 95223 | 38789 | 38646 | 420611 | 737000 | 22 |
| 6. ගෙවන ලද ආධාර මුදල(රුපි. මිලියන ) | 2014 | 0.694 | 0.329 | 0.587 | 1.073 | 0.502 | 1.527 | 0.525 | 0.672 | 5.910 | 17.50 | (47) |
| | 2013 | 2.483 | 1.063 | 1.282 | 1.713 | 0.590 | 1.907 | 0.897 | 1.301 | 11.236 | 26.87 | (22) |

මුලාශ්‍රය : කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ ප්‍රගති වාර්තාව

**රූප සටහන් අංක - 10**
**භෝග පුනරුත්ථාපන ආධාර ක්‍රමය**
**ගෙවීම්හි ප්‍රගතිය ( 1993 - 2014 )**




* සෙස් මුදල සංශෝධනය වීම මත ප්‍රතිශත වශයෙන් දැක්විය නොහැක.

**ගුණාත්මක තේ පැල සැපයීම.**

වැඩි දියුණු කල නව තේ ප්‍රභේද සහිත මව් වගා

තේ නිෂ්පාදනය හා ඵලදායිතාව වර්ධනය කර ගැනීම සඳහා ගුණාත්මක බවින් යුත් රෝපණ ද්‍රව්‍ය කුඩා තේ වතු හිමියන්ට ලබාගැනීමට පහසුකම් සලසාලීම මව් තවාන් පවත්වාගෙන යාමේ අරමුණ වේ.

ඒ අනුව වැඩි දියුණු කල ප්‍රභේද සහිත ගුණාත්මක බවින් යුත් මව් වගාවන් ආයතනය විසින් පවත්වා ගනිමින් කුඩා තේ වතු හිමියන්ට, වාණිජ තේ තවාන්කරුවන්ට සහ ආයතනයේ තේ තවාන් සඳහා අතු 246,356 සැපයීමට කටයුතු කරන ලදි. මෙම ප්‍රමාණය පෙර වර්ෂයට සාපේක්ෂව 5%කින් අඩුවී තිබේ. මව් වගා මගින් රිකිලි අතු නිෂ්පාදනයේ වාර්ෂික ඉලක්කය 303,650 ක් විය. එනම් 81% ක ප්‍රගතියකි. මව් වගා මගින් වැඩි දියුණුකල රිකිලි අතු නිකුතුව පිළිබඳ සවිස්තර තොරතුරු උපලේඛන අංක 9 - A හි දක්වා ඇත. මෙම කාර්යන් වෙනුවෙන් රුපියල් මිලියන 0.73 ක් වැයකර තිබේ.

**වාණිජ තේ තවාන්**

තේ නිෂ්පාදනය හා ඵලදායිතාවය වැඩි කිරීම අරමුණු කර ගුණාත්මක පැල කුඩා තේ වතු හිමියන් වෙත ලබාගැනීමට පහසු කරවීම සඳහා ගුණාත්මක බවින් යුත් වාණිජ තේ තවාන් ආයතනයේ ලියාපදිංචි තේ තවාන් වශයෙන් පවත්වාගෙන යාම හා අධීක්ෂණය කිරීම අරමුණ වේ.

ඒ අනුව වසර 2013/2014 සඳහා ප්‍රාදේශිය කාර්යාල මගින් වාණිජ තේ තවාන් 810 ක් ලියාපදිංචි කරන ලදි. එම තවාන්හි පැල ධාරිතාවය පැල මිලියන 31.04 කි. මෙයින් තවාන් 608 ක පළමු පරීක්ෂණය මගින් පැල මිලියන 12.8 ක් ද, තවාන් 475 ක පැල මිලියන 9.6 ක් සඳහා දෙවන පරීක්ෂණයද, තවාන් 75 ක පැල මිලියන 3.6 ක් සඳහා තෙවන පරීක්ෂණය මගින් ද නිර්දේශ ලබාදී තිබුණි.

2014/2015 වර්ෂය සඳහා වාණිජ තේ තවාන් 492 ක් වසර අවසානය වන විට ලියා පදිංචිකර තිබුණි.

එම තවාන් වල සහතික කරනු ලැබූ පැල සංඛ්‍යාවන්හි සවිස්තර තොරතුරු උපලේඛන අංක 9-C හා 9-D මගින් දැක්වේ.

**වගුව - 11**

**වාණිජ තේ තවාන්**

**අවසර පත් නිකුතුව සහ පැල ධාරිතාවය**

**( 2013 / 14 ) සහ ( 2014 / 15 )**

| ප්‍රදේශය | නිකුත් කල අවසර පත්‍ර ගණන | | පැල ධාරිතාවය (මිලියන) | |
|---|---|---|---|---|
| | 2014/15 | 2013/14 | 2014/15 | 2013/14 |
| මාතර | 180 | 194 | 3.6 | 5.3 |
| රත්නපුර | 27 | 81 | 1.3 | 5.3 |
| කෑගල්ල | 24 | 24 | 1.1 | 1.1 |
| මහනුවර | 127 | 96 | 4.8 | 3. 5 |
| ගාල්ල | - | 170 | - | 7.7 |
| නුවරඑළිය | 80 | 65 | 3.3 | 3.1 |
| ඌව | 18 | 130 | 0.4 | 3.3 |
| කළුතර | 36 | 50 | 0.6 | 1.5 |
| **එකතුව** | **492** | **810** | **15.2** | **31.0** |

මූලාශ්‍රය : කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ ප්‍රගති වාර්තාව

**ආයතනික තේ තවාන්**

කුඩා තේ වතු හිමියන්ට අවශ්‍ය තේ පැල මිලදී ගැනීමේදී වෙළඳපල මිල ගණන් පාලනය කර ගැනීම හා ගුණාත්මක පැල නිෂ්පාදනය පවත්වාගෙන යාම ආදර්ශයක් ලෙස පැවතිය යුතුවීම ආයතනික තේ තවාන් හි අරමුණු වේ.

ඒ අනුව 2013/14 නිරිත දිග හා ඊසාන දිග වගා කන්න සඳහා තවාන් 07 මගින් ටිකිලි තේ පැල 8489,238 ක් නිෂ්පාදනය කරන ලදි. අලෙවිකරනු ලැබූ සමස්ත පැල සංඛ්‍යාව 606,103 කි. තවාන් මට්ටමින් පැලයක අලෙවි මිල උපලේඛණ අංක 9 - B හි දක්වා ඇත.

පැලයක ඇස්තමේන්තුගත සාමාන්‍ය පිරිවැය රුපියල් 13.62 ක් වුවද පැලයක සැබෑ සාමාන්‍ය පිරිවැය රුපියල් 14.91 කි. ඇතැම් තවාන් වල ඇස්තමේන්තුගත පිරිවැයට වඩා සත්‍ය පිරිවැය අඩුවීමද, ඇතැම් තවාන් වල එම පිරිවැය වැඩිවී ද තිබුණි.

**3.1.4 ව්‍යාප්ති හා උපදෙස් පුහුණු වැඩසටහන්**

ප්‍රතිඵල පාදක කළමණාකරනය යටතේ 2014 වසර සඳහා ක්‍රියාත්මක සැලැස්ම පරිදි සමස්ත වශයෙන් ව්‍යාප්ති හා පුහුණු උපදෙස් වැඩසටහන් 6,854 සැලසුම් කරන ලදි. එම වැඩසටහන් සඳහා ඉලක්කගත ගොවීන් සංඛ්‍යාව 167,559 කි.

ජාතික අයවැය - 2014 ප්‍රතිපාදන පරිදි පාංශු හා ජල කළමණාකරනය සඳහා වූ පුහුණු වැඩසටහන් සංඛ්‍යාව ද වාර්ෂික ක්‍රියාත්මක සැලැස්මට අළුතින් එකතුවූ බැවින් පාංශු කළමණාකරනය සඳහා ඉලක්ක කර තිබූ පුහුණු වැඩසටහන් සංඛ්‍යාව වූ 805 ඉක්මවා කටයුතු කිරීමට සිදුවිය. ඒ අනුව එම වැඩසටහන් සංඛ්‍යාවේ ප්‍රගතිය 1243 දක්වා වැඩිවී තිබුණි. එසේම ඉලක්ක කර තිබූ ගොවි සංඛ්‍යාව 17460 ක් වුවද එහි ප්‍රගතිය 117644 දක්වා වැඩිවී තිබුණි.

ඒ අනුව ඉහත පාංශු හා ජල කළමණාකරන වැඩසටහන්හි ප්‍රගතිය ද ඇතුළුව සමස්ත කණ්ඩායම් පුහුණු වැඩසටහන් ප්‍රගතිය 7064 දක්වා ද ගොවි සහභාගීත්වය 315973 ක් එනම් 88% කින් වැඩි වූ තිබුණි.

මධ්‍යකාලීන ප්‍රතිඵල අතුරින් කුඩා තේ ඉඩම්වල නිෂ්පාදනය හා ඵලදායිතාවය වැඩි කිරීම පිණිස අංක 12-I වගුව පරිදි 2014 වසරට සැලසුම් කරන ලද පුහුණු වැඩසටහන් ගණන 5667 ක් වූ අතර, වැඩසටහන් 5923 ක් ක්‍රියාත්මක කිරීමට හැකිවිය. ඒ අනුව ඉලක්කය පරිදි වැඩසටහන් ප්‍රගතිය 4.5 කින් වැඩිවී තිබේ. මේ සඳහා හේතුවී ඇත්තේ පාංශු හා ජල සංරක්‍ෂණ ඵලදායිතා සංවර්ධන විශේෂ වැඩසටහන යටතේ වැඩිපුර වැඩසටහන් 256 ක් ක්‍රියාත්මක කිරීමට සිදුවූ බැවිනි. ඵලදායිතාව වර්ධනය අරමුණු කරන ලද වැඩසටහන් සඳහා ඉලක්ක කරනු ලැබූ වැඩ සටහන් සංඛ්‍යාව 5667 ක් වූ අතර, ඉලක්ක ගත ගොවීන් සංඛ්‍යාව 126,561 කි. එහෙත් වැඩසටහන් සංඛ්‍යාවේ ප්‍රගතිය 5923කි. සහභාගි වූ ගොවීන් සංඛ්‍යාව 262,982 ක් දක්වා වැඩිවී තිබුණි.

# වගුව - 12- i
## ව්‍යාප්ති හා උපදේශ සේවා - ඵලදායිතා වර්ධනය
## පුහුණු වැඩසටහන් සංඛ්‍යාව-(1) සහ සහභාගී සංඛ්‍යාව-(2)

වැඩ සටහන්

| ප්‍රාදේශිය කාර්යාලය | | අවසර පත්‍ර හිමියන් දැනුවත් කිරීමේ පුහුණුව(1.1.6) | යෙදවුම් තවාන් සඳහා පුහුණුව (1.1.15) | වාණිජ තවාන් කරුවන් පුහුණුව (1.1.19) | තේ වගාව පිළිබඳ පුහුණුව (1.1.25) | දළු නෙළීම පිළිබඳ පුහුණුව (1.2.6) | කප්පාදුව පිළිබඳ පුහුණුව (1.3.3) | කප්පාදු හැකියා වර්ධන පුහුණුව (1.3.7) | පාංශු කළමණාකරණය පිළිබඳ පුහුණුව (1.4.2) | සෙවන ස්ථාපනය හා කළමණාකරනය පිළිබඳ පුහුණුව (1.5.2) | පෝශක කළමණාකරණය (1.6.1) | **එකතුව** |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ගාල්ල | 1 | 89 | 18 | 21 | 63 | 228 | 67 | 31 | 204 | 136 | 138 | **995** |
| | 2 | 2375 | 387 | 418 | 2287 | 615 | 1728 | 679 | 38408 | 10385 | 5428 | **68253** |
| මාතර | 1 | 52 | 23 | 21 | 69 | 149 | 74 | 25 | 236 | 167 | 135 | **951** |
| | 2 | 1416 | 291 | 263 | 2463 | 3728 | 2067 | 485 | 33696 | 13466 | 4030 | **61905** |
| කළුතර | 1 | 57 | 11 | 8 | 58 | 126 | 71 | 28 | 106 | 112 | 145 | **722** |
| | 2 | 1269 | 136 | 121 | 2460 | 3548 | 1743 | 542 | 6628 | 3978 | 6387 | **26812** |
| කෑගල්ල | 1 | 52 | 6 | 10 | 50 | 58 | 39 | 23 | 64 | 63 | 51 | **416** |
| | 2 | 1482 | 112 | 126 | 1703 | 1422 | 1091 | 507 | 1722 | 1354 | 1274 | **10793** |
| මහනුවර | 1 | 54 | 18 | 33 | 41 | 118 | 53 | 33 | 146 | 79 | 93 | **668** |
| | 2 | 1463 | 193 | 488 | 885 | 2201 | 1211 | 536 | 7204 | 1813 | 2756 | **18750** |
| නුවරඑළිය | 1 | 104 | 14 | 21 | 44 | 77 | 68 | 17 | 173 | 73 | 90 | **681** |
| | 2 | 2435 | 139 | 151 | 1051 | 1608 | 1469 | 348 | 9005 | 2084 | 2347 | **20637** |
| රත්නපුර | 1 | 58 | 18 | 23 | 32 | 139 | 176 | 53 | 189 | 124 | 141 | **953** |
| | 2 | 1864 | 222 | 300 | 1030 | 3510 | 4561 | 1014 | 12864 | 3791 | 4569 | **33725** |
| ඌව | 1 | 49 | 13 | 11 | 23 | 80 | 61 | 12 | 125 | 77 | 86 | **537** |
| | 2 | 1147 | 205 | 109 | 620 | 2504 | 1981 | 318 | 8117 | 3349 | 3757 | **22107** |
| **එකතුව** | 1 | **515** | **121** | **148** | **380** | **975** | **609** | **222** | **1243** | **831** | **879** | **5923** |
| | **2** | **13451** | **1685** | **1976** | **12499** | **24679** | **15851** | **4429** | **117644** | **40220** | **30548** | **262982** |
| **ඉලක්කය** | 1 | **494** | **148** | **139** | **351** | **1035** | **652** | **240** | **805** | **869** | **934** | **5667** |
| | **2** | **16067** | **1819** | **1223** | **8533** | **21525** | **14914** | **4050** | **17460** | **19590** | **21380** | **126561** |

මූලාශ්‍රය : කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ ප්‍රගති වාර්තාව

ඉහත ව්‍යාප්ති සේවා කටයුතුවලට අමතරව වාර්ෂික ක්‍රියාත්මක සැලැස්මට අනුව තේ ඉඩම්වල පාංශු ආම්ලිකතාව (Soil pH ) පිළිබඳ පස් සාම්පල් පරීක්ෂාවන් 25372 ක් නිමකර ඇති අතර මෙහි ප්‍රගතිය ඉලක්ක ගත පරීක්ෂණ සංඛ්‍යාවෙන් 98% කි. එමෙන්ම ඒකපුද්ගල ව්‍යාප්ති සේවා 29580 ක් සැලසුම්කර තිබූ අතර, එහි ප්‍රගතිය 25490 කි. මෙය ඉලක්කගත වැඩසටහන් සංඛ්‍යාවෙන් 86% ක ප්‍රගතියකි.

**වගුව - 12-ii**

**ඒක පුද්ගල ව්‍යාප්ති කටයුතු හා පාංශු පරීක්ෂණ සංඛ්‍යාව**

| ප්‍රාදේශිය කාර්යාලය | | ගාල්ල | මාතර | කළුතර | කෑගල්ල | මහනුවර | නුවරඑළිය | රත්නපුර | ඌව | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| ඒකපුද්ගල ව්‍යාප්ති | ඉලක්කය | 5980 | 6000 | 2400 | 2000 | 2000 | 3000 | 5000 | 3200 | **29580** |
| | ප්‍රගතිය | 5157 | 5575 | 2543 | 1347 | 1189 | 2478 | 4041 | 2160 | **25490** |
| පාංශු පරීක්ෂාව | ඉලක්කය | 3433 | 4830 | 2026 | 2081 | 2240 | 3000 | 5000 | 3200 | **25810** |
| | ප්‍රගතිය | 3777 | 5612 | 2026 | 1766 | 3415 | 1675 | 5187 | 1914 | **25372** |

මූලාශ්‍රය : කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ ප්‍රගති වාර්තාව

## මධ්‍යකාලීන ප්‍රතිඵල - 02

### වසර 5 කදී කම්හල් මට්ටමින් අමු දළු ගුණාත්මය 60% දක්වා වර්ධනය කිරීම

කුඩා තේ වතු හිමියන්ගේ ආදායම වර්ධනය කරවීමට නම් වැඩි ඵලදාවක් සමග අවම නිෂ්පාදන පිරිවැය හා ඉහල වෙළඳපල මිල ඉතා වැදගත් සාධක වේ. නිෂ්පාදන පිරිවැය අවම කර ගැනීම සඳහා ජාතික පොහොර සහනාධාර ක්‍රමය මගින් අඩු මිලට පොහොර ලබාගැනීමට ගොවීනට හැකිවී ඇති නමුදු, අමු දළු සඳහා ඉහල වෙළඳපල මිල ලබාගැනීම සඳහා ගුණාත්මක බවින් යුතු අමු දළු නිෂ්පාදනය වර්ධනය විය යුතු වේ.

දළු ගුණාත්මය වර්ධනය කිරීම සඳහා දළු නෙලන්නන් 10745 ක් පුහුණු කරවීමත්, ගුණාත්මක දළු පමණක් කම්හල් සඳහා භාර ගැනීම අනිවාර්ය කෙරෙන නිති රීති පද්ධතින් ප්‍රවර්ධනය කිරීමත්, දළු සපයන්නන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමත්, සහ දළු ගුණාත්මය පිළිබඳ කුඩා තේ වතු හිමියන් දැනුවත් කිරීම යන කටයුතු මෙම ප්‍රතිඵලය ලබාගැනීම සඳහා අපේක්ෂිත ක්‍රියාකාරකම් විය. ඒ අනුව 2014 වසරේදී දළු ගුණාත්මය වර්ධනය කිරීම පිණිස පුහුණු වැඩසටහන් 1055 ක් සැලසුම් කරනු ලැබූ අතර වැඩසටහන් 1037 ක් ක්‍රියාත්මක කර ඇත. (වගු අංක 13) වාර්ෂික ඉලක්කයට අනුව එහි ප්‍රගතිය 98%කි. සහභාගී ගොවීන් සංඛ්‍යාව 50929 වූ අතර ඉලක්කගත ගොවීන් සංඛ්‍යාව 39550 කි. මේ අනුව සහභාගීත්වයේ ප්‍රගතිය 129% කි.

## වගුව - 13

### දළු ගුණාත්මය වර්ධන පුහුණු වැඩසටහන් සංඛ්‍යාව සහ සහභාගී ගොවි සංඛ්‍යාව

| ප්‍රාදේශිය කාර්යාලය | අයිතමය | දළු නෙලන්නන් පුහුණුව (2.2.2) | දළු සපයන්නන් දැනුවත් කිරීම පිළිබඳ පුහුණුව (2.3.4) | දළු ගුණාත්මය පිළිබඳ පුහුණුව (2.5.2) | එකතුව |
|---|---|---|---|---|---|
| ගාල්ල | වැඩසටහන් | 114 | 35 | 32 | **181** |
| | සහභාගිත්වය | 2659 | 6381 | 3255 | **12295** |
| මාතර | වැඩසටහන් | 111 | 44 | 57 | **212** |
| | සහභාගිත්වය | 2615 | 4313 | 6596 | **13524** |
| කළුතර | වැඩසටහන් | 45 | 7 | 17 | **69** |
| | සහභාගිත්වය | 904 | 786 | 738 | **2428** |
| කෑගල්ල | වැඩසටහන් | 38 | 8 | 15 | **61** |
| | සහභාගිත්වය | 837 | 566 | 421 | **1824** |
| මහනුවර | වැඩසටහන් | 47 | 22 | 26 | **95** |
| | සහභාගිත්වය | 858 | 1840 | 2921 | **5619** |
| නුවරඑළිය | වැඩසටහන් | 63 | 31 | 53 | **147** |
| | සහභාගිත්වය | 1326 | 911 | 2014 | **4251** |
| රත්නපුර | වැඩසටහන් | 76 | 28 | 70 | **174** |
| | සහභාගිත්වය | 1847 | 2049 | 3091 | **6987** |
| ඌව | වැඩසටහන් | 37 | 23 | 38 | **98** |
| | සහභාගිත්වය | 1138 | 863 | 1996 | **3997** |
| **එකතුව** | **වැඩසටහන්** | **531** | **198** | **308** | **1037** |
| | **සහභාගිත්වය** | **12184** | **17709** | **21032** | **50925** |
| **ඉලක්කය** | **වැඩසටහන්** | **597** | **165** | **293** | **1055** |
| | **සහභාගිත්වය** | **10745** | **13505** | **15300** | **39550** |

මුලාශ්‍රය : කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ ප්‍රගති වාර්තාව

අපේක්ෂිත ප්‍රතිඵල මැනීම සඳහා කම්හල් මට්ටමින් හොඳ දළු ප්‍රතිශතය යන දර්ශකය යොදගනු ලබන අතර, එම ප්‍රතිඵල සාර්ථකත්වය පිණිස අධිකාරිය මෙන්ම ශ්‍රී ලංකා තේ මණ්ඩලයෙහි, තේ කොමසාරිස් අංශය හා ශ්‍රී ලංකා තේ පර්යේෂණායතනය සමග ඒකාබද්ධ ප්‍රයත්නයක් යොදමින් කටයුතු කිරීම අත්‍යාවශ්‍ය වේ.

සමස්ත වශයෙන් ව්‍යාප්ති උපදෙස් හා පුහුණු වැඩසටහන් සඳහා රුපියල් මිලියන 1.77 ක් වැයකර ඇත. එයින් පුහුණු ද්‍රව්‍ය සඳහා රුපියල් මිලියන 0.112 ක් වැයකර තිබුනි.

**මධ්‍යකාලීන ප්‍රතිඵල - 03**

**වසර 06 ක් තුළ ප්‍රජා මූලික සංවිධාන 50% කින් ශක්තිමත් කිරීම**

1989 වර්ෂයේ අග භාගයේදී ආරම්භ කරනු ලැබූ කුඩා තේ වතු සංවර්ධන සමිති ක්‍රමය නීතිගත සංවිධාන බවට පත් කිරීම සඳහා 1991 අංක 36 දරණ පනතින් සංශෝධිත, ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 35 දරණ කුඩා තේවතු සංවර්ධන පනතෙහි 15 වන වගන්තියේ 2 වන උප වගන්තියේ (ඔ ඕ) ජේදය යටතේ පැවරී ඇති බලතල අනුව කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය විසින් අංක 878/15 දරණ අති විශේෂ ගැසට් නිවේදනය මගින් 1995 අංක 01 දරණ කුඩා තේ වතු සංවර්ධන සමිති රීති ප්‍රකාශයට පත්කරන ලදී.

2014 වසර අවසානය වන විට කුඩා තේ වතු සංවර්ධන සමිති 1383 ක් ලියාපදිංචිව තිබූ අතර එයට අයත් සාමාජිකයන් සංඛ්‍යාව 266480 ක් දක්වා එනම් 6% ක වර්ධනයක් වී ඇත. එහෙත් සමිති සංඛ්‍යාව 01 කින් වර්ධන වී තිබුණි.

**14 වන වගුව**

**කුඩා තේවතු සංවර්ධන සමිති ව්‍යාප්තිය**

2013/2014

| කාර්යාලීය බල ප්‍රදේශය | සමිති සංඛ්‍යාව | | සාමාජික සංඛ්‍යාව | |
|---|---|---|---|---|
| | **2013** | **2014** | **2013** | **2014** |
| රත්නපුරය | 284 | 285 | 74,461 | 76,788 |
| ඌව(බදුල්ල සහ මොණරාගල) | 161 | 161 | 21,643 | 28,856 |
| නුවරඑළිය | 187 | 187 | 18,936 | 20,171 |
| මහනුවර සහ මාතලේ | 141 | 141 | 12,385 | 10,412 |
| ගාල්ල | 208 | 208 | 44,875 | 44,459 |
| මාතර සහ හම්බන්තොට | 177 | 177 | 40,515 | 47,288 |
| කෑගල්ල | 127 | 127 | 16,473 | 17,479 |
| කළුතර | 97 | 97 | 22,506 | 21,009 |
| **එකතුව** | **1,382** | **1,383** | **251,794** | **266,480** |

මූලාශ්‍රය : කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ ප්‍රගති වාර්තාව

ජාතික වැවිලි කළමණාකරන ආයතනය මගින් ලබාදී ඇති මූල්‍ය ප්‍රතිපාදන යටතේ සියළු දිස්ත්‍රික්කයන්හි සමිතිවල සභාපති , ලේකම් , භාණ්ඩාගාරික සඳහා උපකාර්යාල මට්ටමින් එක්දින පුහුණු වැඩසටහන් 68 ක් ක්‍රියාත්මක කර ඇති අතර ඒ මගින් සංවර්ධන , ව්‍යාප්ති හා සමිති කටයුතු පිළිබඳ දැනුවත් කිරීමක් ලබාදී තිබුණි.

මෙයට අමතරව අධිකාරිය විසින් ජාතික අයවැය ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කරනු ලැබූ පාංශු හා ජල සංරක්ෂණ ඵලදායිතා ප්‍රවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී කුඩා තේ වතු සංවර්ධන සමිතිවල පූර්ණ මෙහෙයවීම යටතේ කුඩා තේ වතු හිමියන්ගෙන් ඉදිරිපත් වූ ඉල්ලුම්පත්‍ර ලබාගැනීමේ මූලික පියවරේ සිට නිර්දේශ ලබාදීම ඇතුළු අදාල සියළු සහාය කුඩා තේ වතු සංවර්ධ සමිති විසින් ලබාදෙන ලදී.

**සමස්ත ලංකා කුඩා තේ වතු සංවර්ධන සමිති සංවිධානය**

දිස්ත්‍රික් සංවිධාන 08 ක් හා සමස්ත ලංකා සමිති සංවිධානයකින්ද යුතුව මෙම තේ සමිති පද්ධතිය සමන්විත වේ. මෙහිදී ප්‍රාදේශීය සංවිධාන වල කාර්යයන් පහසුකරවීම, තේ ශක්ති සුභසාධන ක්‍රියාවලිය පවත්වාගෙන යාම, ජාතික තේ පොහොර සහනධාර ක්‍රමය ක්‍රියාත්මක වූ අවස්ථාවේදී ඒ සඳහා මැදිහත්ව කටයුතු කිරීම ද, ප්‍රාථමික සමිති සාමාජිකයනට යහපත් සේවාවන් ඉටුකිරීම වෙනුවෙන් කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය හා ඒකාබද්ධව ව්‍යාප්ති වැඩසටහන් සඳහා සහායවීම වැනි සේවාවන් ඉටුකිරීම සමස්ත ලංකා කුඩා තේ වතු සංවර්ධන සමිති සංවිධානයේ කාර්යයන් විය. සමස්ත ලංකා සංවිධානය සඳහා කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය , ශ්‍රී ලංකා තේ මණ්ඩලය , ශ්‍රී ලංකා තේ පරේෂණායතනය , ජාතික වැවිලි කළමණාකරණ ආයතනය , තේ ශක්ති අරමුදල යන ආයතනවල අධ්‍යක්‍ෂ මණ්ඩල සාමාජිකත්වය හිමිය.

## මධ්‍යකාලීන ප්‍රතිඵල 04

## වසරක් තුල වඩාත් සඵලදායි ලෙස ක්‍රියාත්මක වීම සඳහා ආයතනය ශක්තිමත් වීම

**අපේක්ෂිත කෙටිකාලීන ප්‍රතිඵලයන් පහත සඳහන් පරිදි විය.**

4.1 කාර්ය මණ්ඩල පුරප්පාඩු වසරක් තුල 5% කට වඩා අවම මට්ටමින් පවත්වාගෙන යාම

4.2 වසරක් තුල ආයතනික කටයුතු හැකිතාක් උපරිම ප්‍රමාණයකට විමධ්‍යගත කිරීම

4.5 වසර 02 කදී සියලු විගණන මත අනනුසිම්ත වීම ( Unqualified)

4.6 අදාල වසර ආරම්භයේදීම හඳුන්වාදී ඇති සැලසුම් ක්‍රියාවලිය ආයතනගත කිරීම සහ විමර්ශනය කර ක්‍රියාත්මක කිරීම

2014 වර්ෂයේදී පෙර වර්ෂයන්ගේ කාර්යභාරයන්හි ප්‍රගතිය විමර්ශනය කරමින් 2014 වසර වෙනුවෙන් සැලසුම්කල වාර්ෂික ක්‍රියාත්මක සැලැස්ම හඳුන්වාදී කටයුතු කරන ලදී.

4.7 නියාමුකරණ ක්‍රමය ශක්තිමත් කිරීම සහ ආයතනගත කිරීම

මේ යටතේ හඳුනාගනු ලැබූ දුර්වලතා මගහරවා ගැනීම පිණිස නිරන්තර ප්‍රගති විමර්ෂණ කටයුතු සහ නියමුකරණය තවදුරටත් ශක්තිමත් කිරීම පිණිස වාර්ෂික ක්‍රියාත්මක සැලැස්ම පරිදි සියළු අංශ නියමුකරණය කිරීම සඳහා කමිටු එකගතාවයකින් නව ක්‍රමයක් සකස් කරන ලදී. 2015 වසර සඳහා සැලසුම් ක්‍රියාවලිය 2014 වසරේ විමර්ශනය කර නිමකරන ලදී.

4.11 රාජකාරි කටයුතු සඳහා ආයතනික කාර්යය මණ්ඩලයේ ධනාත්මක ආකල්ප පැවැතිම

4.13 වාර්ෂිකව කාර්යය මණ්ඩලය 5% ක් සඳහා වෘත්තිමය පුහුණුව ලබාදීම

කාර්ය මණ්ඩල විවිධ ශ්‍රේණීන් නියෝජනය වනසේ පහත පරිදි අභ්‍යන්තර මෙන්ම බාහිර පුහුණු වැඩසටහන් සඳහා කාර්ය මණ්ඩලය සහභාගි කරවන ලදි.

| අනු අංකය | සේවක කාණ්ඩය | පුහුණු වැඩ මුළු පවත්වන ලද දින වකවානු | පුහුණු වැඩ මුළු පවත්වන ලද ආයතනය | පුහුණු විෂය/ අවශ්‍යතා | පුහුණු ලාභීන් ගණන |
|---|---|---|---|---|---|
| 1 | කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) | 2014.03.04 සහ 05 | ඉඳි කිරීම් යන්ත්‍රෝපකරණ පුහුණු මධ්‍යස්ථානය | ප්‍රවාහන කළමනාකරණය | 1 |
| 2 | තේ පරීක්ෂක/ව්‍යාප්ති නිලධාරි | 2014.06.15 සිට 2014.07.13 දක්වා | Zhangzhov College of Science & Technology | ජාත්‍යන්තර තේ වෙළඳාම හා කාර්මිකරණය පිළිබඳ සමුළුව | 1 |
| 3 | පරිපාලන නිලධාරි | 2014.07.18 සහ 19 | Centre for Studies in Disciplinary Management (විධිමත් විනය පාලන පුහුණු මධ්‍යස්ථානය) | විධිමත් විනය පාලනය මගින් මානව සම්පත් වර්ධනය කිරීමේ දෙදින වැඩමුළුව | 1 |
| 4 | කාර්ය භාර නිලධාරීන් | 2014.07.18 සහ 19 | හන්තාන පුහුණු මධ්‍යස්ථානය | පරිඝනක භාවිතය පිළිබඳ කුසලතා සංවර්ධන පුහුණු වැඩසටහන | 30 |
| 5 | පරිපාලන නිලධාරි / කළමනාකරණ සහකාර | 2014.07.31 සහ 2014.08.01 | නිපුණතා සංවර්ධන අරමුදල / යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය | විනය පරීක්ෂණ පැවැත්වීම | 2 |
| 6 | තේ පරීක්ෂක/ව්‍යාප්ති නිලධාරි | 2014.08.23 සිට 30, 2014.09.20 සිට 27 | හන්තාන පුහුණු මධ්‍යස්ථානය | අධිකාරියේ ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා ව්‍යාප්ති දෘෂ්‍යාධාරක සකස් කිරීමේ වැඩමුළුව | 45 |
| 7 | තේ පරීක්ෂක/ව්‍යාප්ති නිලධාරීන් ,<br>කාර්ය භාර නිලධාරීන් , සහකාර ප්‍රාදේශීය කළමනාකරුවන් (ව්‍යාප්ති) | 2014.08.22 සහ 23<br>2014.08.29 සහ 30<br>2014.10.17 සහ 18<br>2014.10.31 සහ 11.01 | හන්තාන පුහුණු මධ්‍යස්ථානය | ව්‍යාප්ති සන්නිවේදන කුසලතා සංවර්ධන හා ඉඩම් මැනීම පිළිබඳ කුසලතා සංවර්ධන පුහුණු වැඩ සටහන | 45<br>45<br>45<br>45 |
| 8 | සාමාන්‍යාධිකාරි , කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය<br>සභාපති , සමස්ත ලංකා සමිති සංවිධානය | 2014.11.03 සිට 2014.11.07 දක්වා | බැන්ඩුම් ජාත්‍යන්තර තේ සමුළුව FAO/IGG සම්මන්ත්‍රණයේ 21 වන සැසිය | FAO/IGG තේ සම්මන්ත්‍රණය | 2 |
| 9 | ප්‍රාදේශීය කළමනාකරුවන්, සහකාර ප්‍රාදේශීය කළමනාකරුවන් , තේ පරීක්ෂක / ව්‍යාප්ති නිලධාරීන් | 2014.11.28 සිට 2014.12.10 දක්වා | ඉන්දියාවේ / IFAD බැංගලෝර් | තේ වගාව , නිෂ්පාදනය හා අලෙවිය පිළිබඳ පුහුණු වැඩ සටහන | 10 |
| 10 | සහකාර කළමනාකරු (මානව සම්පත් හා පාලන) පරිපාලන නිලධාරි | 2014.11.19 , 20 , 21 | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | විනය කාර්යය පරිපාටිය | 2 |
| 11 | කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) | 2014.11.21 - 22<br>2014.12.05 - 06<br>2014.12.12 - 13<br>2014.12.19 - 20 | හන්තාන පුහුණු මධ්‍යස්ථානය | කාර්යාල කළමනාකරණ ආකල්ප හා කුසලතා සංවර්ධන පුහුණු වැඩ සටහන | 45<br>45<br>45<br>45 |

4.14 අවශ්‍ය යටිතල පහසුකම් ඇති කිරීම

4.15 අන්තර් ආයතනික සම්බන්ධතා පවත්වාගෙන යාම හා ශක්තිමත් කිරීම

I. ජාතික වැවිලි කළමණාකරණ ආයතනය හා කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය ඒකාබද්ධ වැඩසටහන

වාණිජ තේ තවාන්කරුවන් පුහුණුව
කුඩා තේ වතු හිමියන්ගේ තේ වගාවන් සඳහා ගුණාත්මක තේ පැල නිෂ්පාදනය අරමුණු කර ගනිමින් වාණජ තේ තවාන් කරුවන් සඳහා ජාතික වැවිලි කළමණාකරණ ආයතනයේ මූල්‍ය දායකත්වය මත එක්දින පුහුණු විශේෂ වැඩසටහන් 28 ක් වර්ෂයතුලදී පහත පරිදි ක්‍රියාත්මක කරන ලදී.

| ප්‍රාදේශිය කාර්යාලය | පවත්වන ලද වැඩසටහන් ගණන | සහභාගි වූ තවාන්කරුවන් සංඛ්‍යාව | දැරූ වියදම (රුපි.) |
|---|---|---|---|
| ගාල්ල | 5 | 177 | 138683.49 |
| මාතර | 5 | 165 | 136906.80 |
| රත්නපුර | 3 | 89 | 77249.75 |
| මහනුවර | 4 | 146 | 155141.00 |
| නුවරඑළිය | 4 | 136 | 109609.50 |
| කෑගල්ල | 2 | 75 | 54587.00 |
| කළුතර | 2 | 89 | 52010.00 |
| ඌව | 3 | 71 | 66137.00 |
| **එකතුව** | **28** | **948** | **790324.54** |

II. පර්යේෂණ හා ව්‍යාප්ති සංසදය

මෙම සංසදය තුලින් තේ වගා ක්ෂේත්‍රයේ පවතින ගැටළු හඳුනා ගැනීමත් නව තාක්ෂණික දැනුම හුවමාරු කරගැනීමත් සිදු කෙරේ.

කුඩා තේ වතු අංශය සඳහා ශ්‍රී ලංකා තේ පර්යේෂණායතනය විසින් පවත්වනු ලබන පර්යේෂණ හා ව්‍යාප්ති සංසදය වසරකට වාර 02 බැගින් පැවැත්වීමට නියමිත වුවත් 2014 වර්ෂය තුලදී එක් රැස්වීම් වාරයක් පමණක් 2014.06.29 වන දින පවත්වන ලදී.
මෙම සංසදය සඳහා සහභාගීත්වය කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ නිලධාරීන්, තේ පර්යේෂණායතනයේ පර්යේෂණ නිලධාරීන්, උපදෙස් නිලධාරීන්, කුඩා තේ වතු හිමියන්ගේ සමස්ත ලංකා සමිති සංවිධානයේ නිලධාරීන්, ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ හා තේ කම්හල් හිමියන්ගේ සංගමයේ නියෝජිතයන් සහභාගි වන අතර, සහභාගි වූ මුළු සංඛ්‍යාව 127 කි.

III. තේ පර්යේෂණායතනය හා කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ අන්තර් සම්බන්ධතා මෙහෙයුම් කමිටුව

ආයතන දෙක මගින් කුඩා තේ වතු අංශය සඳහා ක්‍රියාත්මක කරන වැඩ සටහන් පිළිබඳව සාකච්ඡාකර තිරණ ගැනිම හා පවත්නා ගැටළු හඳුනාගෙන නිසි ක්‍රියාමාර්ග ගැනිමත් ක්‍රියාත්මක වැඩසටහන්වල ප්‍රගතිය සාකච්ඡා කිරීමත් මෙම කමිටුවේ අරමුණ වේ.

වාර්ෂිකව රැස්වීම් වාර දෙකක් පැවැත්වීමට නියමිතව ඇතත් 2014 වර්ෂයේ රැස්වීම් වාර එකක් පමණක් පවත්වා ඇත. 2014.09.29 දින මෙම රැස්වීම පවත්වන ලද අතර, මේ සඳහා ශ්‍රී ලංකා තේ පර්යේෂණායතනයේ පර්යේෂණ නිලධාරීන්, උපදෙස් නිලධාරීන් සහ කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ නිලධාරීන් සහභාගි විය. සමස්ත සහභාගිත්වය 31 කි.

Iv ප්‍රාදේශිය තාක්ෂණික සංසදය

කුඩා තේවතු අංශයේ ප්‍රාදේශිය මට්ටමින් කාලින අවශ්‍යතාවය හඳුනාගැනිම හා සෙෂ්ත්‍රයේ වගාව ආශ්‍රිත ගැටලු හඳුනාගැනිම හා නව තාකෂණික ක්‍රමවේදයන් පිළිබඳව හඳුන්වාදීම පිණිස ප්‍රාදේශිය තාක්ෂණික සංසදය ප්‍රාදේශිය කාර්යාල මට්ටමින් වර්ෂයකට දෙවරක් තේ පර්යේෂණායතනයේ නිලධාරීන් ද කුඩා තේවතු සංවර්ධන සමිති නියෝජනයකින්ද පැවැත්වීම සිදුකරනු ලබයි. මෙම ප්‍රාදේශිය තාක්ෂණික සංසදය ජාතික මට්ටමේ ව්‍යාප්ති සංසදයට ප්‍රථමව පැවැත්වෙන අතර මෙහිදී හඳුනාගන්නා ගැටලු ජාතික මට්ටමේ ව්‍යාප්ති සංසදයකට ඇතුලත් කිරිමට කටයුතු කරනු ලැබේ.

2014 වර්ෂයේ ප්‍රාදේශිය කාර්යාල **8** හිම සංසදවාර 15 ක් පවත්වා ඇත. සමස්ත සහභාගිත්වය 493 කි. 2014 වර්ෂයේ ප්‍රාදේශිය තාක්ෂණික සංසද පහත පරිදි පවත්වා ඇත

ප්‍රාදේශිය තාක්ෂණික සංසදය පැවැත්වීම.

| ප්‍රාදේශිය කාර්යාලය | පැවැත්වු වැඩ සටහන් ගණන | මුලු සහභාගිත්වය |
|---|---|---|
| කලුතර | 02 | 59 |
| ගම්පල | 02 | 72 |
| නුවරඑළිය | 02 | 78 |
| මාතර | 02 | 54 |
| රත්නපුර | 02 | 85 |
| කැගල්ල | 02 | 38 |
| ඌව | 01 | 34 |
| මහනුවර | 02 | 73 |
| එකතුව | 15 | 493 |

ආයතනය වඩාත් සඵලදායි ලෙස ක්‍රියාත්මකවීම සඳහා ශක්තිමත් විම සම්බන්ධයෙන් භෞතික හා මුල්‍ය ප්‍රගතියේ සාර්ථකත්වය, අයවැය අපගමන ප්‍රතිශතය හා විගණන අඩුපාඩු සංඛ්‍යාව ප්‍රධාන කාර්ය පාදක දර්ශක වශයෙන් හඳුනාගෙන තිබේ.

2014 වසරේ මානව සම්පත් පුහුණු කටයුතු සහ ආයතනය ශක්තිමත් කිරීමේ අනෙකුත් කටයුතු සඳහා රුපියල් මිලියන 3.27 වැයකර තිබුණි.

## මධ්‍යකාලීන ප්‍රතිඵල 05

**වසර 05ක් තුලදී ඉඩම්වලින් 10% ක් අමතර ආදායම් ඉපැයීමේ කටයුතු සඳහා යොමු කරවීම.**

කුඩා තේ ඉඩම් හිමියන්ගේ ජීවන තත්ත්වය වර්ධනය කිරීම සඳහා අමතර ආදායම් ඉපැයීමේ කටයුතු සඳහා යොමුකරවීම හඳුනාගෙන තිබේ. මේ අනුව තේ පාදක ගොවිපල කළමණාකරණ ක්‍රමය වාර්ෂිකව තේ ඉඩම් 1000 ක් සඳහා හඳුන්වාදීමත්, කුඩා තේ ඉඩම් 1000 ක වන වගා වගාකරවීමත් මේ යටතේ හඳුනා ගන්නා ලද කෙටි කාලීන ප්‍රතිඵලයකි. මේ යටතේ අදාල වර්ෂය තුලදී වැඩසටහන් 143 ක් සැලසුම් කරනු ලැබූ අතර වැඩසටහන් 118 ක් ක්‍රියාත්මක කර තිබේ. ඒ සඳහා ඉලක්කගත ගොවී සංඛ්‍යාව 1535 ක් වූ අතර සහභාගි වූ ගොවීන් ගණන 1973 කි. අදාල වර්ෂයේදී පහත පරිදි වැඩ සටහන් ක්‍රියාත්මක කර ඇත.

**වගුව - 15**

**තේ පාදක ගොවිපල පුහුණුව (5.1.4)**
**වැඩසටහන් සංඛ්‍යාව හා සහභාගී ගොවී සංඛ්‍යාව**

| | ප්‍රදේශීය කාර්යාලය | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ගාල්ල | මාතර | කළුතර | කෑගල්ල | මහනුවර | නුවරඑළිය | රත්නපුර | ඌව | එකතුව |
| **වැඩසටහන්** | | | | | | | | | |
| ඉලක්කය | 19 | 20 | 12 | 5 | 16 | 20 | 25 | 15 | **132** |
| ප්‍රගතිය | 10 | 15 | 11 | 2 | 16 | 13 | 26 | 11 | **104** |
| **සහභාගිත්වය** | | | | | | | | | |
| ඉලක්කය | 220 | 200 | 256 | 60 | 160 | 148 | 265 | 139 | **1448** |
| ප්‍රගතිය | 220 | 402 | 226 | 32 | 275 | 242 | 459 | 210 | **2066** |

මූලාශ්‍රය : කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ ප්‍රගති වාර්තාව

ඉහත සඳහන් ප්‍රතිඵල මැනීම පිණිස කුඩා තේ ඉඩම් වල අනෙකුත් භෝග පවත්නා ප්‍රතිශතය හා කුඩා තේ ඉඩම් වල පශු පාලනය පවත්නා ප්‍රතිශතය ප්‍රධාන කාර්ය පාදක දර්ශක වශයෙන් හඳුනාගෙන තිබේ.

## 3.2 කුඩා තේ ඉඩම්වල ආයෝජනය ප්‍රවර්ධනය කිරීමේ විශේෂ ව්‍යාපෘති කටයුතු

### 3.2.1 පාංශු හා ජල සංරක්ෂණ ඵලදායිතා ප්‍රවර්ධන විශේෂ වැඩසටහන

2014 වසරේ ජාතික අයවැය ප්‍රතිපාදන මත ආරම්භ කරන ලද මෙම විශේෂ ව්‍යාපෘතිය මගින් එක් කුඩා තේ ඉඩම් හිමියකුට වගාවේ වයස අවු 10 ඉක්මවූ, තේ අක්කර 01 ක උපරිම බිම් ප්‍රමාණයකට ඉඩමේ සංරක්ෂණ කටයුතු නිම කිරීම අනුව අදියර 02 කින් ඒ සඳහා ප්‍රතිපාදන සපයන ලදී.

සමාලෝචිත වර්ෂයේ අක්කර 129022 ක ප්‍රමාණයකට කුඩා තේ වතු හිමියන් 190123 දෙනෙකු සඳහා කුඩා තේ වතු සංවර්ධන සමිති මගින් රුපියල් මිලයන 406.34 ක සහනාධාර මුදලක් ගෙවන ලදී. අදාල වර්ෂයේ ප්‍රගතිය පහත සඳහන් පරිදි වේ

**පාංශු හා ජල සංරක්ෂණ ඵලදායිතා ප්‍රවර්ධන විශේෂ වැඩසටහන**
**භෞතික හා මූල්‍ය ප්‍රගතිය - 2014**

| ප්‍රාදේශීය කාර්යාලය | වාරිකය | සමිති ගණන | කුඩා තේ වතු හිමියන් ගණන | බිම් ප්‍රමාණය (අක්කර) | ගෙවනු ලැබූ මුදල (රු.මිලි.) |
|---|---|---|---|---|---|
| ගාල්ල | I | 203 | 47527 | 36513 | 90.6 |
| | II | 4 | 832 | 562 | 1.4 |
| නුවර | I | 123 | 8146 | 5828 | 14.03 |
| නුවරඑළිය | I | 185 | 12048 | 9068 | 22.65 |
| බණ්ඩාරවෙල | I | 153 | 18449 | 12258 | 30.64 |
| | II | 153 | 18349 | 12200 | 30.49 |
| කළුතර | I | 96 | 15897 | 13036 | 31.00 |
| මාතර | I | 172 | 37611 | 29019 | 72.55 |
| | II | 11 | 2574 | 2005 | 5.01 |
| කෑගල්ල | I | 125 | 8751 | 6976 | 17.43 |
| රත්නපුර | I | 273 | 41694 | 16324 | 87.84 |
| **උප එකතුව** | **I** | **1330** | **190123** | **129022** | **366.74** |
| | **II** | **168** | **21755** | **14767** | **36.90** |
| **මුළු එකතුව** | | **1330** | **190123** | **129022** | **403.64** |

.

### 3.2.2 තේ සංවර්ධන ව්‍යාපෘති චක්‍රිය අරමුදල් ණය ක්‍රමය

ශ්‍රී ලංකා රජය විසින් ආසියානු සංවර්ධන බැංකුව සමග අත්සන් කරන ලද ණය ගිවිසුමකට අනුව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් SDR මිලියන 15.4 ක අරමුදලක් කුඩා තේ වතු අංශයේ සංවර්ධන කටයුතු සඳහා වෙන්කර ක්‍රියාත්මක කරනු ලැබූ මෙම වැඩසටහන යටතේ එම අරමුදල් උපයෝගී කර ගනිමින් ණය පහසුකම් සහභාගිත්ව ණය දෙන ආයතන මගින් ලබාදී තිබුණි. කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය මගින් ණය අයදුම්කරුවන් සඳහා තේ නැවත වගාව, වාණිජ තවාන් යන සංවර්ධන කටයුතු සඳහා ණය නිර්දේශ ලබාදීම පමණක් සිදුකරනු ලැබේ.

2014 වර්ෂය තුලදී තේ නැවත වගාව හෙක්ටයාර 10 ක් වෙනුවෙන් ණය අයදුම් පත් 20 ක් සඳහා ද වාණිජ තවාන් අයදුම්කරුවන් 02 දෙනෙකු සඳහා පැල 150000 ක් සඳහා ණය නිර්දේශ ලබාදී ඇත.

### 3.2.3 කුඩා තේ වතු හිමියන් සඳහා වන ලංකා බැංකු විශේෂ ණය යෝජනා ක්‍රමය

ලංකා බැංකුව විසින් ක්‍රියාත්මක කරනු ලබන ඉහත සඳහන් ණය යෝජනා ක්‍රමය සඳහා 2013 වර්ෂයේ ඔක්තොම්බර් මස කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය විසින් ණය ගිවිසුම අත්සනු කරනු ලැබිය.

තේ වගා කරන සියළු දිස්ත්‍රික්කයන් ආවරණය වන පරිදි ක්‍රියාත්මක කරනු ලබන මෙම ණය ව්‍යපෘතිය මගින් අක්කර 01 ක උපරිම බිම් ප්‍රමාණයකට යටත්ව රුපියල් ලක්ෂ 05 ක උපරිමය දක්වා තේ නැවත වගාව තේ අළුත් වගාව තේ තවාන් පිහිටවීම සහ අමතර ආදායම් උත්පාදන කටයුතු සඳහා ප්‍රධාන සංවර්ධන කාර්ය සඳහා කාලින සහනදායි පොලි අනුපාතිකයක් යටතේ ණය මුදල් සපයනු ලැබේ.

සමාලෝචිත වර්ෂයේ කුඩා තේ ඉඩම් හිමියන් 273 දෙනෙකු සඳහා ඉහත සංවර්ධන කාර්යයන් වෙනුවෙන් ණය මුදල් නිර්දේශකර තිබූ අතර එයින් තේ අළුත් වගාව සඳහා අයදුම්කරුවන් 42 දෙනෙකු වෙනුවෙන් රුපියල් මිලියන 14 ක් ද තේ නැවත වගාව අයදුම් කරුවන් 140 දෙනෙකු සඳහා රුපියල් මිලියන 49 ක් ද තවාන් අයදුම්කරුවන් 82 දෙනෙකු සඳහා රුපියල් මිලියන 28 ක් ද වෙනත් ආදායම් උත්පාදන ණය අයදුම්කරුවන් 09 දෙනෙකු සඳහා රුපියල් මිලියන 1.8 ක් ද අප ආයතනය විසින් නිර්දේශකර තිබුණි. මෙයින් කුඩා තේ ඉඩම් හිමියන් 99 දෙනෙකු ණය පහසුකම් ලබාගෙන තිබුණි.

### 3.2.4 කුඩා වැවිලි ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන (SPEnDP) – (IFAD) නුවරඑළිය දිස්ත්‍රික්කය

ව්‍යාපෘති බල ප්‍රදේශය තුල හඳබිම සහ මහවැලි ජනපද වාසී කුඩා තේවතු හිමියන්ගේ ව්‍යවසායකත්වය සංවර්ධනය කිරීම සඳහා තේ නැවත වගා සංවර්ධනය සහ යෙදවුම් තේ තවාන් සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීම මෙම ව්‍යාපෘති කටයුතු යටතේ ඉලක්ක කරන ලදී.

වසර තුල ව්‍යාපෘති කටයුතු සඳහා රුපියල් මිලියන 20.3 ක පිරිවැයක් දරා ඇති අතර භෞතික ප්‍රගතිය පහත පරිදි විය.

| | බිම් ප්‍රමාණය හෙක් | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | මූල්‍ය ප්‍රගතිය (රුපියල්) |
|---|---|---|---|
| **තේ නැවත වගාව** | | | |
| උදුරා දැම්ම පස සංරක්ෂණය | 1.73 | 14 | |
| පස සාරවත් කිරීම 1 | 15.96 | 131 | |
| පස සාරවත් කිරීම 2 | 32.56 | 218 | 13,070,633.00 |
| වගාව | 35.59 | 296 | |
| වගාවෙන් වසරකට පසු | 44.94 | 396 | |
| පෙර වර්ෂයට නියමිත සහනාධාර | | 198 | |
| **භෝග පුනරුත්ථාපනය** | | | |
| පෙර වර්ෂයට නියමිත සහනාධාර | | | |
| පැල සංඛ්‍යාව | 14,505 | | 435155.00 |
| බිම් ප්‍රමාණය (හෙක්ටයාර) | 5.87 | | |
| **යෙදවුම් ද්‍රව්‍ය ලබා දීම** | | | |
| තේ පැල | 229,908 | 151 | 5,903,305.00 |
| පොලිතින් (කැබලි) | 3,800 | 02 | |
| මෙතම් සෝඩියම් - මි.ලි.400 | 07 | 02 | |
| ගොවි පුහුණු වැඩසටහන් ගණන | 20 | 384 | 19,656.00 |
| මෙහෙයුම් වියදම් | | | 919,971.00 |
| **මුළු එකතුව** | | | 20,348,720.00 |

### 3.2.5 කුඩා තේ ඉඩම්වල තේ වගාවේ දී යාන්ත්‍රිකරණය කටයුතු ප්‍රචලිත කිරීමේ වැඩසටහන

තේ ඉඩම්වල අස්වනු නෙලීමේ ශ්‍රම හිගයට විසඳුමක් ලෙස අස්වනු නෙලීමේ යන්ත්‍ර භාවිතය ප්‍රචලිත කිරීම සඳහා තේ පර්යේෂණායතනය විසින් යෝජනා කරනු ලැබූ යාන්ත්‍රිකරණ ප්‍රචලිත කිරීමේ වැඩසටහන සඳහා 2013 වසරට ජාතික අයවැය මගින් එය අනුමත කරන ලදී.

ඒ අනුව මෙම ව්‍යාපෘතියේ අඛණ්ඩ කටයුතු යටතේ පළමු අදියරයේදී කුඩා තේ වතු සංවර්ධන සමිති 50 ක් වෙත යන්ත්‍ර සහ උපකරණ කට්ටල 50 ක් ලබාදීමටත් එම යන්ත්‍ර එකලස් කිරීම හා නඩත්තුව පිළිබඳ පුහුණුව ලබදීමටත් සමිති මට්ටමින් යන්ත්‍ර ක්‍රියාකරුවන් සඳහා තෙදින පුහුණුවක් ලබාදීමටත් කටයුතු කරන ලදී.

සමාලෝචිත වර්ෂය තුල එම සමිති 50 වෙත දළු කතුරු හා දළු කුඩ 500 බැගින් ද දළු නෙලන යන්ත්‍ර 100 ක් ද කප්පාදු යන්ත්‍ර 50 ක් ද වලවල් හාරන යන්ත්‍ර 50 ක් ද ඒප්‍රන් 500 ක් ද ඕවරෝල් සමග තොප්පි 50 ක් ද සපත්තු 600 ක් ද ( ගම්බූට්ස් 100 ක් හා කැන්වස් 500 ) බෙදාහරින ලදී. සමස්ත දිස්ත්‍රික් ප්‍රගතිය සඳහා උපලේඛණ අංක 15 සහ 16

### 3.2.6 දිවිනැගුම ජාතික සංවර්ධන වැඩසටහන

මෙම වැඩසටහන යටතේ කුඩා තේ වතු සංවර්ධන වැඩ කටයුතු වෙනුවෙන් ප්‍රතිපාදිත මුදල රුපියල් මිලියන 24.912 කි. මේ යටතේ තේ අළුතින් වගා කිරීම, තේ නැවත වගා කිරීම සහ බෝග පුනරුත්ථාපනය යටතේ තේ පැල සැපයීමත්, තේ සමග අතුරු බෝග වගාව යටතේ ගම්මිරිස් පැල සපයාදීමත්, දළු ගුණාත්මය වර්ධනය සඳහා දළු කතුරු සහ දළු කුඩ 50% ක සහන මිලකට ලබාදීමත්, තේ පැල නිෂ්පාදනය සඳහා තවාන් පිහිටුවීම සඳහා අවශ්‍ය යෙදවුම් ලබාදීමත් සැලසුම් කරන ලදි. සමාලෝචිත වර්ෂයේ මෙම වැඩසටහනෙහි ප්‍රගතිය පහත පරිදි වේ.

(රු. 0000')

| දිස්ත්‍රික්කය | තේ අළුත් වගාව | | තේ නැවත වගාව | | භෝග පුනරුත්ථාපනය | | ගම්මිරිස් වගාව | | දළු කතුරු සහ දළු කුඩ සැපයූ සංඛ්‍යාව | | | යෙදවුම් සැපයීම | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | පැල ගණන | රු. | පැල ගණන | රු. | පැල ගණන | රු. | පැල ගණන | රු. | දළු කුඩ | දළු කතුරු | රු. | පැල ගණන | රු. |
| කළුතර | 5.34 | 80.10 | | | 0.79 | 11.79 | 0.10 | 2.00 | | 0.024 | 17.52 | | |
| කොළඹ | 2.10 | 31.50 | | | | | | | | | | | |
| මහනුවර | 4.20 | 63.03 | 5.05 | 75.73 | 1.42 | 21.30 | 0.30 | 4.80 | | 0.400 | 29.20 | | |
| මාතලේ | 0.60 | 9.00 | 0.96 | 14.40 | 0.30 | 4.50 | 0.10 | 1.60 | | 0.060 | 4.38 | | |
| නුවරඑළිය | 1.95 | 29.23 | 1.94 | 29.06 | 0.68 | 10.15 | 0.17 | 2.80 | | 0.260 | 18.98 | | |
| ගාල්ල | 7.27 | 109.04 | | | 0.83 | 12.45 | 0.25 | 4.00 | 0.02 | 0.200 | 23.00 | | |
| මාතර | 7.39 | 110.78 | | | 0.90 | 13.54 | 0.25 | 5.00 | 0.01 | 0.150 | 17.25 | 13.00 | 37.81 |
| හම්බන්තොට | 3.55 | 53.32 | | | 0.46 | 6.86 | | | 0.001 | 0.001 | 1.15 | 1.00 | 2.54 |
| රත්නපුර | 12.86 | 192.83 | | | 1.60 | 24.11 | 0.30 | 6.07 | 0.05 | 0.500 | 57.50 | | |
| කෑගල්ල | 6.66 | 99.87 | | | | | 0.05 | 1.00 | 0.008 | 0.008 | 10.12 | | |
| ගම්පල | 0.22 | 3.27 | | | | | | | 0.001 | 0.001 | 1.38 | | |
| බදුල්ල | 4.19 | 67.68 | | | 0.93 | 17.88 | 0.30 | 5.33 | 0.04 | 0.040 | 46.00 | | |
| මොණරාගල | 1.45 | 21.81 | | | | | 0.10 | 1.60 | | | | | |
| එකතුව | 57.79 | 871.47 | 7.95 | 119.20 | 7.91 | 122.58 | 1.93 | 33.19 | 0.136 | 0.232 | 226.48 | 14.00 | 40.35 |

## දශකයේ විශේෂ කාර්ය සාධනයන්

| | 2004 | 2005 | 2006 | 2007 | 2008 | 2009 | 2010 | 2011 | 2012 | 2013 | විශේෂිත කරුණු |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| **1තේ නැවත වගාව** | | | | | | | | | | | |
| තේ නැවත වගාව (හෙක්:) | 891 | 1057 | 1001 | 1024 | 881 | 777 | 847 | 772 | 889 | 1165 | |
| ඉලක්කය අනුව ප්‍රගතිය | 89% | 101% | 95% | 94% | 92% | 92% | 111% | 91% | 99% | 93% | |
| ලබාදී ඇති දිරිදීමනා මුදල (රු.මිලි.) | 188.10 | 174.8 | 183.3 | 172.9 | 194.6 | 178.17 | 177.85 | 189.88 | 226.3 | 351.84 | |
| **2 තේ අළුත් වගාව** | | | | | | | | | | | |
| තේ අළුත් වගාව (හෙක්:) | 12 | 8 | 0.83 | *- | *- | *- | *- | 28.38 | 239 | 263 | * ප්‍රතිපත්තිමය තීරණ මත ක්‍රියාත්මක නොකරන ලදී. |
| ලබාදී ඇති දිරිදීමනා මුදල (රු.මිලි.) | 3.25 | 0.30 | 0.042 | *- | *- | *- | *- | 1.17 | 23.21 | 42.41 | |
| **3 භෝග පුනරුත්ථාපනය** | | | | | | | | | | | |
| පාළු සිටවූ පැල සංඛ්‍යාව (මිලියන) | 1.48 | 1.24 | 0.52 | 0.516 | 0.519 | 0.43 | 0.424 | 0.50 | 0.77 | 0.48 | |
| ලබාදී ඇති දිරිදීමනා මුදල (රු.මිලි.) | 14.46 | 8.11 | 7.794 | 4.13 | 4.84 | 3.25 | 3.586 | 2.44 | 14.35 | 11.236 | |
| **4 රබර් සමග තේ වගාව** | | | | | | | | | | | |
| රබර් සමග තේ වගාව (හෙක්:) | 9 | 14.6 | 6.8 | 4.4 | - | - | - | - | - | - | කුඩා තේ ඉඩම් හිමි ඉල්ලුම අවම වීම |
| 8 | වල්පැළ නෙළීම ( වරකට ශ්‍රම දින 10 බැගින් ) | | | 30 | | 24000 | 20 | | 16000 | 100 | | 80000 | 120 | | 96000 | 120 | | 96000 | 390 | | 312000 | 16.17 |
| 9 | සෙවන ගස් වගා කිරීම ( ඇකේෂියා හා කැලියැන්ඩ්‍රා 740 ක් සඳහා රිකිලි 1 කට රු.1.00 | 740 | 2960 | 6 | 2960 | 7760 | 1 | 242 | 1042 | | | | | | | | | | 7 | 3202 | 8802 | 0.46 |
| 10 | උස සෙවන ගස් වගාකිරීම ( ග්ලිරිසීඩියා 100 ක් රු.6/- බැගින්) සහ ඩොලමයිට් 100kg | 100 | 2082 | 4 | 2082 | 5282 | 1 | 108 | 908 | | | | | | | | | | 5 | 2190 | 6190 | 0.32 |
| 11 | තෘණ උදුරා දැමීම | | | | | | | | | 20 | | 16000 | | | | | | | 20 | | 16000 | 0.83 |
| 12 | වළවල් කැපීම, කණු ඇදීම, කුඤ්ඤ ගැසීම | | | | | | | | | 180 | | 144000 | | | | | | | 180 | | 144000 | 7.46 |
| 13 | තේ වගා කිරීම ( පැළයක් රු.25/- බැගින් ) | 12500 | 312500 | | | | | | | 60 | 187500 | 235500 | | | | | | | 60 | 187500 | 235500 | 12.20 |
| 14 | සෙවන ගස් පාලනය කිරීම ( වසරකට දෙවර බැගින් ) | | | | | | 6 | | 4800 | 12 | | 9600 | 15 | | 12000 | 15 | | 12000 | 48 | | 38400 | 1.99 |
| 15 | පිළිකුලු අංකමාරය මර්ධනය කිරීම (පරපෝෂක් ග්‍රෑ.200 ක රු.93/- බැගින් වරකට ක්.ග්‍රෑ.280 බැගින් වාර 10 ) | 3 | 1302 | | | | | | | 40 | 1302 | 33302 | 40 | 1302 | 10902 | 40 | 1302 | 33302 | 120 | 3906 | 99906 | 5.18 |
| 16 | දළු නෙළන තත්ත්වයට පත් කිරීම සුදුසු පරිදි හැඩ ගැන්වීම | | | | | | | | | | | | 12 | | 9600 | 15 | | 12000 | 27 | | 21600 | 1.12 |
| 17 | වසුන් යෙදීම | | | | | | | | | 100 | | 80000 | 75 | | 60000 | | | | 175 | | 140000 | 7.25 |
| 18 | තේ පොහොර යෙදීම ( ටී 200 තෙවන වසර ) | 1200 | 31200 | | | | | | | 20 | 31200 | 47200 | 20 | 63180 | 79180 | | | | 40 | 94380 | 126380 | 6.55 |
| | සිව්වන වසර | 2430 | 63180 | | | | | | | 60 | | 48000 | 60 | | 48000 | 32 | | 25600 | 152 | | 121600 | 6.30 |
| | ටී. 750 පස්වන වසර | 1750 | 45500 | | | | | | | | | | | | | | 45500 | | | 45500 | 45500 | 2.36 |
| 19 | පාලු සැපයීම | 2000 | 25 | | | | | | | | | | 12 | 11250 | 20850 | 6 | 11250 | 16050 | 18 | 22500 | 36900 | 1.91 |
| 20 | වටපණු උරුලු මර්ධනය කිරීම ( වළකට ග්‍රෑ. 7 බැගින් ) කුරේටර් සැපයීම | 88 | 4840 | | | | | | | 4 | 4840 | 8040 | | | | | | | 4 | 4840 | 8040 | 0.42 |
| 21 | කෘමි උවදුරු මර්ධනය හා උපකරණ සඳහා | | | | 2000 | 2000 | | 2000 | 2000 | | 2000 | 2000 | | 2000 | 2000 | | 2000 | 2000 | | 2000 | 10000 | 0.52 |
| | එකතුව | | | 546 | 40374 | 477174 | 128 | 18470 | 120870 | 607 | 234902 | 720502 | 359 | 77732 | 364932 | 237 | 60052 | 246452 | 1877 | 431530 | 1929930 | 100 |

* පිරිවැය ඇස්තමේන්තුව තේ පර්යේෂණායතනයේ නිර්දේශයන්ට අනුකූලව වන අතර, අමුද්‍රව්‍ය පිරිවැය හා ප්‍රවාහන පිරිවැයද අන්තර්ගත කර ඇත.

උපලේඛන අංක : 11 - B



## පහත් බිම්හි තේ නැවත වගාව සඳහා වන නිෂ්පාදන පිරිවැය ඇස්තමේන්තුව - 2013
( උදුරා දැමීමේ සිට දළු නෙලන අවධිය දක්වා ) හෙක්ටයාරයකට / රුපියල්
දෛනික වැටුප රු.800

| | | ප්‍රමාණය | වියදම | උදුරා දැමීම පළමු වසර | | | පස පුනරුත්ථාපනය දෙවන වසර | | | තේ වගා කිරීම තෙවන වසර | | | පළමු වසර නඩත්තුව හතරවන වසර | | | දෙවන වසර නඩත්තුව පස්වන වසර | | | මුළු පිරිවැය | | | මුළු පිරිවැය ප්‍රතිශතය % |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | ශ්‍රම දින | අමුද්‍රව්‍ය පිරිවැය | මුළු පිරිවැය | ශ්‍රම දින | අමුද්‍රව්‍ය පිරිවැය | මුළු පිරිවැය | ශ්‍රම දින | අමුද්‍රව්‍ය පිරිවැය | මුළු පිරිවැය | ශ්‍රම දින | අමුද්‍රව්‍ය පිරිවැය | මුළු පිරිවැය | ශ්‍රම දින | අමුද්‍රව්‍ය පිරිවැය | මුළු පිරිවැය | ශ්‍රම දින | අමුද්‍රව්‍ය පිරිවැය | මුළු පිරිවැය | |
| 1 | පාලන තේ උදුරා දැමීම හා කුඩු කිරීම | | | 104 | | 87200 | | | | | | | | | | | | | 104 | | 87200 | 4.59 |
| | (50 % පැල පැවති ඉවත්කර දිනකට පැදුරු 40 බැගින් | | | | | | | | | | | | | | | | | | | | | |
| 2 | [illegible] | | | 125 | | 100000 | | | | | | | | | | | | | 125 | | 100000 | 5.52 |
| 3 | [illegible] | | | 100 | | 80000 | 40 | | 32000 | 10 | | 8000 | 5 | | 4000 | 5 | | 4000 | 160 | | 128000 | 7.07 |
| 4 | ඩොලමයිට් දැමීම ( කි.ග්‍රෑ.1 ක් රු.6.00 බැගින් ) | 1976 | 11856 | 2 | 11856 | 13456 | | | | | | | | | | | | | 2 | 11856 | 13456 | 0.74 |
| 5 | [illegible] ( [illegible] 500 බැගින් දිනකට ) | | | 54 | | 43200 | | | | | | | | | | | | | 54 | | 43200 | 2.39 |
| 6 | [illegible] ( කි.ග්‍රෑ.1ක් රු.26.00 බැගින් කි.ග්‍රෑ.930 කට ) | 1610 | 41860 | 4 | 9620 | 12820 | 4 | 24180 | 27380 | 1 | 8060 | 8860 | | | | | | | 9 | 41860 | 49060 | 2.71 |
| 7 | [illegible] ( දිනකට ශ්‍රම දිනය 1 බැගින් ) | | | 14 | | 11200 | 56 | | 44800 | | | | | | | | | | 70 | | 56000 | 3.09 |
| 8 | [illegible] ( දිනකට ශ්‍රම දිනය 10 බැගින් ) | | | 30 | | 24000 | 20 | | 16000 | 100 | | 80000 | 120 | | 96000 | 120 | | 96000 | 390 | | 312000 | 17.23 |
| 9 | [illegible] ( [illegible] 300 ක් සඳහා | 300 | 2520 | 8 | 2520 | 8920 | 1 | 252 | 1052 | | | | | | | | | | 9 | 2772 | 9972 | 0.55 |
| | හා ඩොලමයිට් කි.150 ක් සඳහා [illegible] 1 කට රු.1.00 බැගින් ) | | | | | | | | | | | | | | | | | | | | | |
| 10 | [illegible] ( [illegible] 100 ක් රු.6/- බැගින් හා ඩොලමයිට් 100 Kg | 100 | 2082 | 6 | 2082 | 6882 | 1 | 208 | 1008 | | | | | | | | | | 7 | 2290 | 7890 | 0.44 |
| 11 | [illegible] | | | | | | | | | 20 | | 16000 | | | | | | | 20 | | 16000 | 0.88 |
| 12 | [illegible] | | | | | | | | | 180 | | 144000 | | | | | | | 180 | | 144000 | 7.95 |
| 13 | තේ පැළ සිටුවීම ( පැළයක් රු.25/- බැගින් ) | 12500 | 312500 | | | | | | | 60 | 187500 | 235500 | | | | | | | 60 | 187500 | 235500 | 13.00 |
| 14 | [illegible] | | | | | | 6 | | 4800 | 12 | | 9600 | 15 | | 12000 | 15 | | 12000 | 48 | | 38400 | 2.12 |
| 15 | [illegible] ( [illegible] 200 ක | 3 | 1302 | | | | | | | 20 | 1302 | 17302 | 20 | 1302 | 17302 | 20 | 1302 | 17302 | 60 | 2604 | 50604 | 2.79 |
| | රු.93/- බැගින් දිනකට [illegible] 250 බැගින් වාර 10 ) | | | | | | | | | | | | | | | | | | 0 | 1302 | 1302 | 0.07 |
| 16 | [illegible] | | | | | | | | | | | | 12 | | 9600 | 15 | | 12000 | 27 | | 21600 | 1.19 |
| 17 | [illegible] | | | | | | | | | 100 | | 80000 | 75 | | 60000 | | | | 175 | | 140000 | 7.73 |
| 18 | [illegible] ( පී 200 [illegible] ) | 1200 | 31200 | | | | | | | 20 | 31200 | 47200 | 20 | 63180 | 79180 | | | | 40 | 94380 | 126380 | 6.98 |
| | [illegible] | 2430 | 63180 | | | | | | | 60 | | 48000 | 60 | | 48000 | 32 | | 25600 | 152 | | 121600 | 6.71 |
| | පී. 750 [illegible] | 1750 | 45500 | | | | | | | | | | | | | | 45500 | | | 45500 | 45500 | 2.51 |
| 19 | [illegible] | 2000 | 25 | | | | | | | | | | 12 | 15000 | 24600 | 12 | 15000 | 24600 | 24 | 30000 | 49200 | 2.72 |
| 20 | [illegible] ( [illegible] 7 බැගින් ) | 88 | 4840 | | | | | | | 4 | 4840 | 8040 | | | | | | | 4 | 4840 | 8040 | 0.44 |
| | [illegible] | | | | | | | | | | | | | | | | | | | | | |
| 21 | [illegible] | | | | 2000 | 2000 | | 2000 | 2000 | | 2000 | 2000 | | 2000 | 2000 | | 2000 | 2000 | | 2000 | 10000 | 0.55 |
| | එකතුව | | | 447 | 28078 | 385678 | 128 | 26640 | 129040 | 587 | 224902 | 704502 | 339 | 81482 | 352682 | 219 | 67802 | 279002 | 1720 | 434904 | 1,810,904 | 100 |

* පිරිවැය ඇස්තමේන්තුව තේ පර්යේෂණායතනයේ නිර්දේශයන්ට අනුකූල වන අතර, අමුද්‍රව්‍ය පිරිවැය හා ප්‍රවාහන පිරිවැයද අන්තර්ගත කර ඇත.

උපලේඛන අංක 12

## කුඩා තේ වතු හිමියන් සඳහා ණය ක්‍රමය යටතේ පොහොර ලබාදීම
## මෙ. ටො. ( 1993 - 2009 දක්වා )

| වර්ෂය | ණය යෝජනා ක්‍රමය | අනෙකුත් | අත්පිට මුදලට | මුලු නිකුතුව |
|---|---|---|---|---|
| 1993 | 2405 | 448 | 552 | 3405 |
| 1994 | 2811 | 93 | 329 | 3233 |
| 1995 | 3591 | 375 | 417 | 4353 |
| 1996 | 8278 | 426 | 261 | 8968 |
| 1997 | 12879 | 779 | 162 | 13820 |
| 1998 | 11035 | 3915 | 577 | *15527 / +17700 |
| 1999 | 11210 | 712 | 343 | 12992 |
| 2000 | 15317 | 191 | 351 | 15859 |
| 2001 | 15905 | 84 | 432 | 16421 |
| 2002 | 16009 | 163 | 734 | 16906 |
| 2003 | 8845 | 5 | 274 | 9124 |
| 2004 | 8480 | 0.7 | 527 | 9007 |
| 2005 | 8412 | 523 | 243 | 9178 |
| 2006 | 3800 | 1284.2 | 628 | 5712 |
| 2007 | 1877 | 3087 | 238 | 5202 |
| 2008 | 1378 | 2970 | 190 | 4538 |
| 2009 | 964 | - | 92 | - |

+ ඩොලමයිට් සහිතව

* ඩොලමයිට් රහිතව

** 2009 වසරේ සිට කුඩා තේ ඉඩම්හිමියන් සඳහා පොහොර සහනාධාරය ලබාදීම අධිකාරියේ කාර්යභාරයෙන් බැහැරවී තිබේ.

**උපලේඛන අංක : 13**

**තේ අපනයනය හා විදේශ විනිමය ඉපයීම්**

**1995 – 2014**

| වර්ෂය | **අපනයනය කල ප්‍රමාණය ( කි. ග්‍රෑ. මිලියන ) | * අපනයන ඉපයීම් ප්‍රමාණය ( රු. මිලියන ) | මුලු අපනයන ඉපයීම් වලට දායක ප්‍රතිශතය % |
|---|---|---|---|
| 1995 | 240 | 24638 | 12.62 |
| 1996 | 244 | 34068 | 15.02 |
| 1997 | 269 | 42533 | 15.51 |
| 1998 | 272 | 50280 | 16.19 |
| 1999 | 269 | 43728 | 13.44 |
| 2000 | 288 | 53133 | 12.06 |
| 2001 | 294 | 61602 | 14.31 |
| 2002 | 291 | 63105 | 14.00 |
| 2003 | 298 | 65937 | 13.30 |
| 2004 | 300 | 74890 | 12.08 |
| 2005 | 309 | 81480 | 12.70 |
| 2006 | ***315 | ***86337 | 12.80 |
| 2007 | ***294 | ***106217 | 13.20 |
| 2008 | 320 | 137585 | 15.60 |
| 2009 | 280 | 136183 | 16.70 |
| 2010 | 315 | 155608 | 16.60 |
| 2011 | 323 | 164869 | 14.10 |
| 2012 | 320 | 180430 | 14.48 |
| 2013 | 319.6 | 199446 | 14.80 |
| 2014 | 327.3 | 212588 | 15.00 |

* ප්‍රති අපනයන ඉපයීම් සහිතව

** ආනයනික තේ ද ඇතුළුව

*** ප්‍රති අපනයන ඉපයීම් රහිතව

මුලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව

**උපලේඛන අංක : 14**

**දළ ජාතික නිෂ්පාදනයට තේ මගින් එකතු කල වටිනාකම.**

**( 1992 - 2014 )**

| වර්ෂය | එකතු කල වටිනාකම % |
|---|---|
| 1992 | 2.0 |
| 1993 | 2.4 |
| 1994 | 2.3 |
| 1995 | 2.1 |
| 1996 | 2.2 |
| 1997 | 2.4 |
| 1998 | 2.8 |
| 1999 | 2.4 |
| 2000 | 2.6 |
| 2001 | 2.3 |
| 2002 | 2.4 |
| 2003 | 2.3 |
| 2004 | 2.2 |
| 2005 | 2.0 |
| 2006 | 1.8 |
| 2007 | 1.2 |
| 2008 | 1.6 |
| 2009 | 1.7 |
| 2010 | 1.6 |
| 2011 | 1.3 |
| 2012 | 1.3 |
| 2013 | 0.9 |
| 2014 | 0.9 |

මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව

තේ වගාවේ යන්ත්‍ර භාවිතාව ප්‍රචලිත කිරීමේ ව්‍යාපෘතිය - 2014 වර්ෂය (භෞතික තොරතුරු)

| ප්‍රාදේශිය කාර්යාලය | ප්‍රතිලාභී සමිති සංඛ්‍යාව | උපකරණ බෙදාහැරීම (සංඛ්‍යාව) | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | දළු කතුරු | දළු කූඩ | දළු නෙලන යන්ත්‍ර | | ඉන්ධන බල ක්‍රියාකරන | | ඒප්‍රන් | ඕවරෝල් සහ කැප් තොප්පි | ගම් බූට්ස් සපත්තු යුගල | කැන්වස් සපත්තු යුගල |
| | | | | බැටරි බල | ඉන්ධන බල | කප්පාදු යන්ත්‍ර | වලවල් හාරන යන්ත්‍ර | | | | |
| ගාල්ල | 8 | 80 | 80 | 8 | 8 | 8 | 8 | 80 | 8 | 16 | 80 |
| මාතර | 7 | 70 | 70 | 7 | 7 | 7 | 7 | 70 | 7 | 14 | 70 |
| රත්නපුර | 8 | 80 | 80 | 8 | 8 | 8 | 8 | 80 | 8 | 16 | 80 |
| මහනුවර | 6 | 60 | 60 | 6 | 6 | 6 | 6 | 60 | 6 | 12 | 60 |
| නුවරඑළිය | 6 | 60 | 60 | 6 | 6 | 6 | 6 | 60 | 6 | 12 | 60 |
| බණ්ඩාරවෙල | 5 | 50 | 50 | 5 | 5 | 5 | 5 | 50 | 5 | 10 | 50 |
| කෑගල්ල | 5 | 50 | 50 | 5 | 5 | 5 | 5 | 50 | 5 | 10 | 50 |
| කළුතර | 5 | 50 | 50 | 5 | 5 | 5 | 5 | 50 | 5 | 10 | 50 |
| **එකතුව** | 50 | **500** | **500** | **50** | **50** | **50** | **50** | **500** | **50** | **100** | **500** |

## තේ වගාවේ යන්ත්‍ර භාවිතාව ප්‍රචලිත කිරීමේ ව්‍යාපෘතිය - 2014 වර්ෂය (මූල්‍ය තොරතුරු)

උපකරණ වටිනාකම (රුපි.000')

| ප්‍රාදේශිය කාර්යාලය | ප්‍රතිලාභි සමිති සංඛ්‍යාව | දළු කතුරු | දළු කූඩ | දළු නෙලන යන්ත්‍ර | | ඉන්ධනවලින් ක්‍රියාකරන | | ඒප්‍රන් | ඕවරෝල් සහ කැප් තොප්පි | කැන්වස් සපත්තු යුගල | මුළු වියදම |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | බැටරි බල | ඉන්ධන බල | කප්පාදු යන්ත්‍ර | වලවල් භාරන යන්ත්‍ර | | | | |
| ගාල්ල | 8 | 111 | 68 | 330 | 524 | 431 | 638 | 44 | 26 | 100 | 2272 |
| මාතර | 7 | 97 | 59 | 289 | 458 | 377 | 559 | 39 | 22 | 88 | 1988 |
| රත්නපුර | 8 | 111 | 68 | 330 | 524 | 431 | 638 | 44 | 26 | 100 | 2272 |
| මහනුවර | 6 | 83 | 51 | 247 | 393 | 323 | 479 | 33 | 19 | 75 | 1704 |
| නුවරඑළිය | 6 | 83 | 51 | 247 | 393 | 323 | 479 | 33 | 19 | 75 | 1704 |
| බණ්ඩාරවෙල | 5 | 69 | 42 | 206 | 327 | 270 | 399 | 28 | 16 | 63 | 1420 |
| කෑගල්ල | 5 | 69 | 42 | 206 | 327 | 270 | 399 | 28 | 16 | 63 | 1420 |
| කළුතර | 5 | 69 | 42 | 206 | 327 | 270 | 399 | 28 | 16 | 63 | 1420 |
| **එකතුව** | **50** | **694** | **424** | **2062** | **3272** | **2695** | **3990** | **275** | **160** | **627** | **14198** |

## කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය

## 2014 දෙසැම්බර් 31 වන දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

| | උපලේඛන අංකය | 2014 | | 2013 | |
|---|---|---|---|---|---|
| **වත්කම්** | | | | | |
| **ජංගම වත්කම්** | | | | | |
| මුදල් හා මුදල් සමාන | 7 | 75,256 | | 27,403 | |
| ලැබීම් | 4,5 | 118,817 | | 118,970 | |
| ඉන්වෙන්ට්‍රි | 3 | 15,662 | | 15,391 | |
| පූර්ව ගෙවීම් | 6 | 800 | | 461 | |
| වෙනත් ජංගම වත්කම් | 2A | 6,145 | 216,680 | 5,412 | 167, 638 |
| **ජංගම නොවන වත්කම්** | | | | | |
| ආයෝජන (ස්ථාවර තැන්පතු) | 2 | | 9,993 | | 8,962 |
| වෙනත් මූල්‍ය වත්කම් | 2A | | 3,935 | | 2,028 |
| දේපළ, අංගන හා පිරියත | 1 | 349,362 | | 343,147 | |
| අඩු කළා: ගිණුම් ක්ෂය වීම් | | ( 92,586) | 256,776 | 74,702 | 268,444 |
| **මුළු වත්කම්** | | | **487,385** | | **447,073** |
| **වගකීම්** | | | | | |
| **ජංගම් වගකීම්** | | | | | |
| ගෙවීම් | 8 | 54,536 | | 22,266 | |
| උපචිත වියදම් | 9 | 145,045 | 199,581 | 261,690 | 283,956 |
| **ජංගම නොවන වගකීම්** | | | | | |
| සේවක ප්‍රතිලාභ (පාරිතෝෂික) | 10 | | 139,450 | | 130,005 |
| **මුළු වගකීම්** | | | **339,031** | | **413,961** |
| **ශුද්ධ වත්කම්** | | | **148,354** | | **33,112** |
| **ශුද්ධ වත්කම්/ සමකොටස්** | | | | | |
| රජය මගින් ලබා දුන් ප්‍රාග්ධනය | 01A | 25,220 | | 19,830 | |
| ප්‍රත්‍යාගණන අතිරික්ත | 01B | 124,109 | | 124,109 | |
| සමුච්චගත අතිරික්ත / (ඌණතා) | | (61,574) | 87,755 | (269,702) | (125,763) |
| ප්‍රදාන | 01C | | 60,599 | | 158,875 |
| **මුළු ශුද්ධ වත්කම්/ සම කොටස්** | | | **148,354** | | **33,112** |

අංක 03 සිට 04 දක්වා පිටුවල වන ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අංක 07 සිට 23 දක්වා වන පිටුවල සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල ප්‍රධාන කොටසක් සකසනු ලබයි. මෙම මූල්‍ය ප්‍රකාශන සැකසීමේ හා ඉදිරිපත් කිරීමේ වගකීම දරනු ලබන්නේ අධ්‍යක්ෂ මණ්ඩලයයි. මෙම මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය මගින් අනුමත කර ඇති අතර ඒ වෙනුවෙන් පහත අත්සන් තබා ඇත.

(වැඩබලන සභාපති) (අධ්‍යක්ෂ) (සාමාන්‍යාධිකාරී) (මූල්‍ය කලමනාකරු)

## කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය
## මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය
## 2014 දෙසැම්බර් 31 වන දිනට අවසන් වූ වර්ෂය

රු.'000

| | සටහන් | 2014 | | 2013 | |
|---|---|---|---|---|---|
| **මෙහෙයුම් ආදායම්** | | | | | |
| සංයුක්ත අරමුදල | | | | | |
| වසර තුළ ලැබුණු අරමුදල් | | | 734,994 | | 505,063 |
| **වෙනත් ආදායම්** | 15 | | | | |
| පොළී C/D | | 1,684 | | 2,726 | |
| සේවකයන්ට ලබාදුන් ණය පොළී | | 3,874 | | 3,450 | |
| විවිධ ආදායම් | | 4,162 | | 3,238 | |
| පැල තවාන් අතිරික්ත (ඌණතා) | 17 | 52 | | 167 | |
| හන්තාන වියදම් මත ආදායම | | 1,957 | 11, 730 | 1,797 | 11, 378 |
| | | | 746,724 | | 516,441 |
| **සංවර්ධන වියදම්** | | | | | |
| සහනාධාර | 13 | (331,213) | | (431,451) | |
| ව්‍යාප්ති | 14 | (9,284) | | (3,660) | |
| | | | | (4,617) | |
| සමාජ සංවර්ධනය | 13 | (1,335) | | (1,960) | |
| ආයතන සංවර්ධනය | | (3,272) | | (2,991) | |
| | | | | (1,727) | |
| | | | (345,104) | | (440,062) |
| **මෙහෙයුම් වියදම්** | 12 | | | | |
| පුද්ගල පඩිනඩි | | | | | |
| වැටුප් දීමනා/ සේ.අ./සේ.නියු.අර යනාදිය | | (196,113) | | (186,446) | |
| අතිකාල/ අඩ වැටුප් | | (2,669) | | (2,055) | |
| ප්‍රවාහන | | (8,543) | | (7,562) | |
| | | | | (7,728) | |
| සැපයුම් හා පාරිභෝගික භාණ්ඩ | | (3,420) | | (3,252) | |
| නඩත්තු | | (15,690) | | (14,813) | |
| සන්නිවේදන | | (4,535) | | (3,943) | |
| කුලී, වරිපනම් හා විදුලිය | | (5,795) | | (5,638) | |
| වෙනත් මෙහෙයුම් වියදම් | | (16,047) | | (16,754) | |
| **මුළු මෙහෙයුම් වියදම්** | | | (252,812) | | (238,462) |
| **මෙහෙයුම් කටයුතු අතිරික්ත/ (ඌණතා)** | | | 148,808 | | (162,083) |
| පාරිතෝෂික | | (23,408) | | (25,023) | |
| ක්ෂය වීම් හා ක්‍රමක්ෂය | | (18,316) | | (18,316) | |
| බොල් ණය ප්‍රතිපාදන/ කපා හැරි ණයකරුවන් | | (76) | (42,699) | (2,063) | (45,402) |
| | | | (106,110) | | (207,485) |
| දේපළ අංගන හා පිරියත අළෙවියෙන් ලැබූ ලාභය | | | | | |
| IFAD හා දිවිනැගුම- පුනරාවර්තන ප්‍රදාන | 14 | 455,053 | | 40,241 | |
| පුනරාවර්තන වියදම් | | (455,053) | 0 | (40,241) | |
| අතිවිශේෂ අයිතමයන්ට පෙර ශුද්ධ අතිරික්තය/(ඌණතාවය) | | | 106,110 | | |
| පෙර වසර ගැලපුම් | | | 1,185 | | 151 |
| විලම්භිත ආදායම | | | 100,833 | | 19,492 |
| **කාල සීමාව තුළ ශුද්ධ අතිරික්තය/(ඌණතාවය)** | | | **(208,128)** | | **(187,842)** |

**කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය**
**ඒකාබද්ධ මුදල් ගැලීම් ප්‍රකාශය**
**2014 දෙසැම්බර් 31 වන දිනට අවසන් වූ වර්ෂය**

රු.'000

| | 2014 | 2013 |
|---|---|---|
| **මෙහෙයුම් කටයුතුවලින් මුදල් ගැලීම** | | |
| සාමාන්‍ය කටයුතුවල අතිරික්තතා/ (ඌණතා) | 208,128 | (187, 842) |
| **මුදල් නොවන සංචලන** | | |
| ක්ෂය වීම | 18,067 | 18,316 |
| පාරිතෝෂික සැපයීම | 23,408 | 25,023 |
| අඩමාන ණය සඳහා ප්‍රතිපාදන වැඩි කිරීම | 76 | 2,063 |
| කපා හැරි ණයකරුවන් | (7) | (771) |
| පොළී ආදායම | (1,684) | (2,726) |
| ගෙවීම්වල වැඩිවීම්/අඩුවීම් | (84,375) | 160,314 |
| ප්‍රත්‍යාගණන අලාභ | | |
| සේවක පිරිවැය සම්බන්ධ ප්‍රතිපාදන වැඩි කිරීම | | |
| දේපළ, අංගන හා පිරියත විකුණුමෙන් ලද (ලාභ)/ අලාභ | (14) | (54) |
| අනෙක් වත්කම්වල වැඩිවීම/අඩුවීම | (3,672) | (2,487) |
| ලැබීම්වල වැඩිවීම/අඩුවීම | 22 | (647) |
| ඉන්වෙන්ට්‍රි අයිතමයන්ගේ වැඩිවීම/අඩුවීම | (271) | 6,990 |
| **මෙහෙයුම් කටයුතුවල ශුද්ධ මුදල් ගැලීම** | 159,677 | 18,177 |
| **ආයෝජන කටයුතුවල මුදල් ගැලීම්** | | |
| අංගන හා පිරියත මිලදී ගැනීම | 6,450 | (18,385) |
| අංගන හා පිරියත විකුණුමෙන් ලැබූ මුදල් | 19 | 55 |
| **ආයෝජන කටයුතුවල ශුද්ධ මුදල් ගැලීම** | (6,450) | (18,330) |
| ලැබූ පොළී | 1,476 | 1,949 |
| ගෙවූ පාරිතෝෂික | (13,964) | (10,920) |
| **මූල්‍ය කටයුතුවල මුදල් ගැලීම්** | (12,488) | (8,972) |
| ප්‍රාග්ධන ප්‍රදාන | (98,276) | (4105) |
| රජයේ දායකත්වය | (5,390) | |
| **මූල්‍ය කටයුතුවල ශුද්ධ මුදල් ගැලීම** | (92,886) | (4,105) |
| **මුදල් හා මුදල් සමාන දෑවල ශුද්ධ වැඩිවීම/(අඩුවීම)** | 47,853 | (13,230) |
| **කාල වකවානුව ආරම්භයේ මුදල් හා මුදල් සමාන දෑ** | 27,403 | 40,633 |
| **කාල වකවානුව අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ** | 75,256 | 27,403 |

## මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන්

1. ගිණුම්කරණ ප්‍රතිපත්ති

1.1 පොදු

1.1.1 ගිණුම්කරණ මූලධර්ම

කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන සැකසෙන්නේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් සකසන ලද ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලවයි. ඓතිහාසික පිරිවැය ක්‍රමය මත පදනම් වී මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇත. මෙම ගිණුම්වලට බලපාන උද්ධමනීය සාධකයන් සඳහා ගැලපීම් සිදු කර නොමැත. සුදුසු ස්ථානයන්හිදී භාවිතා කර ඇති නිශ්චිත ප්‍රතිපත්තීන් ඉදිරියේදී දැක්වෙන සටහන් තුළ විස්තර කර ඇත.

1.1.2 පශ්චාත් ශේෂ පත්‍ර සිද්ධීන්

ශේෂ පත්‍ර දිනයට පසුව සිදු වූ සියළුම ද්‍රව්‍යාත්මක සිදුවීම් සලකා බලා ඇති අතර අවශ්‍ය ස්ථානයන්හිදී ගිණුම් තුළ ගැලපීම් සිදු කර ඇත.

1.1.3 සංසන්දනීය අගයන්

වත්මන් වසර පෙන්නුම් කිරීමේදී වෙනස්කම් තහවුරු කිරීමට අවශ්‍ය අවස්ථාවන්හිදී සංසන්දනීය අගයන්ගේ ගැලපීම් සිදු කර ඇත.

1.1.4 අති විශේෂ අයිතමයන්

වසර තුළදී පොහොර ණයකරුවන් වැනි සමහර ණයකරුවන් තම හිඟ ණයමුදල් පියවා දමන ලදී. බොල් ණය ප්‍රතිපාදන ක්‍රමය වෙනස් නොකළ අතර මෙම වසර සඳහා රු.මිලියන 2.063 ක බොල් ණය ප්‍රතිපාදන වෙන් කර ඇත. ණය ගෙවීම පිළිබඳව විශ්වාසයක් තැබිය නොහැකි ණයකරුවන් ලෙස හඳුනාගත් අය පිළිබඳව පහත දක්වා ඇති පියවරයන් ගන්නා ලදී. නියෝජනය නොවන ශේෂයන් සඳහා බොල් ණය ප්‍රතිපාදන ලබා දී නොමැත.

| ණය ආයු කාලය | ප්‍රතිපාදනය |
|---|---|
| වසරකට අඩු | නැත |
| වසරකට වැඩි හා වසර දෙකක් දක්වා | 10% |
| වසර දෙකකට වැඩි හා වසර තුනක් දක්වා | 30% |
| වසර තුනකට වැඩි හා වසර පහක් දක්වා | 50% |
| වසර පහකට වැඩි | 100% |

2. වත්කම් හා ඒවා ඇගයීමේ මූලධර්ම

2.1 දේපළ, අංගන හා පිරියත

පිරිවැයෙන් සමුච්චගත ක්ෂය වීම්වලින් අඩු කොට ශේෂ පත්‍රය තුළ දේපළ, අංගන හා පිරියත දක්වා ඇත. ක්ෂයවීම් දක්වා ඇත්තේ පහත අනුපාතයන් භාවිතා කරමින් ඍජු රේඛීය පදනමකින් ප්‍රත්‍යාගණනය කිරීමෙනි.

| | |
|---|---|
| ගොඩනැගිලි | 2% |
| මෝටර් වාහන | 20% |
| ගෘහභාණ්ඩ, සවිකිරීම් හා කාර්යාල උපකරණ | 12.5% |
| පරිගණක | 20% |

ක්ෂය වීම් ප්‍රතිපත්තිය වෙනස් වීම හේතුවෙන් අත්පත් කරගත් නව වත්කම් අත්පත් කරගත් දිනයේ සිට ක්ෂය කරනු ලැබීය.

නෙල්ලිගොල්ල ගොඩනැගිල්ලේ අධි ක්ෂය වීම රුපියල් 1.06 ක් වූ අතර පෙර වසර සමඟ ගැලපුම් කරන ලදී.

2.2 ආයෝජන

ආයෝජනවලට පාරිතෝෂික අරමුදලේ ස්ථාවර තැන්පතුව ඇතුළත් වේ.

2.3 තොග හා ඉන්වෙන්ට්‍රි
තොග හා ඉන්වෙන්ට්‍රි අඩුම පිරිවැයට හෝ ශුද්ධ උපලබ්ධි වටිනාකමට ගණනය කර ඇති අතර FIFO පදනම මත පිරිවැය වෙත එළැඹිණි.

2.4 වෙළෙඳ ණයකරුවන් හා ලැබීම්
වෙළෙඳ හා අනෙකුත් ලැබීම් ඒවායේ පොත් අගය අනුව දක්වා ඇති අතර අඩමාන ලැබීම් බොල් ණය ප්‍රතිපාදන තුළට ඇතුළත් කර ඇත.

2.5 අනෙකුත් ලැබීම්
වෙළෙඳ ණයකරුවන් නොවන අනෙකුත් ලැබීම් ඒවායේ ප්‍රමාණවලින් දක්වා ඇත.

2.6 මුදල් හා මුදල් සමාන දෑ
මුදල් හා මුදල් සමාන දෑ සඳහා අයත් වන්නේ අත ඇති මුදල්, බැංකු හා ඇමතුම් තැන්පතුය.

2.7 මුදල් ගැලීම්
වක්‍ර ක්‍රමය භාවිතා කරගෙන මුදල් ගැලීම් ප්‍රකාශය සකසා ඇත.

2.8 ලැබුණු අරමුදල් සඳහා ගිණුම්කරණය
2007 වසරේ සිට ඒකාබද්ධ අරමුදල හරහා භාණ්ඩාගාරයෙන් මුදල් ප්‍රේෂණය කර ඇත

3. වගකීම්
ශේෂ පත්‍රයේ සඳහන් සියළුම ද්‍රව්‍යාත්මක වගකීම් ගිණුම් තුළ ඇතුළත් කර ඇති අතර පවතින සියළු වගකීම් සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන සලසා ඇත. එහෙත් ඒවායේ ප්‍රමාණ නිවැරදිම ලෙස නිශ්චය කළ නොහැක.ශේෂ පත්‍රය තුළ ජංගම වගකීම් ලෙස දක්වා ඇති වගකීම් වනාහී ඉල්ලුම මත ගෙවිය යුතු වගකීම් ය.

3.1 පාරිතෝෂික ප්‍රතිපාදන
සේවයෙන් ඉවත්ව යන විට සේවාවේ 6 වන වසරේ සිට සියළුම සේවකයන්ට ගෙවන පාරිතෝෂික සඳහා ගිණුම්වල සියළු ප්‍රතිපාදන සකසා ඇත. කෙසේවෙතත්, රු. මිලියන 8.96 ක් පමණක් මෙම ප්‍රතිපාදන වෙනුවෙන් ස්ථාවර තැන්පතුවක් තැන්පත් කර ඇත. අරමුදල්වල අප්‍රමාණවත් බව නිසා මෙම තැන්පතුව වැඩි කිරීමට නොහැකිව ඇත.

3.2 බදු අය කිරීම
ඒකාබද්ධ අරමුදලෙන් මූල්‍යනය කෙරෙන බැවින් කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය බදු අය කිරීමෙන් නිදහස් කෙරේ.

3.3 අසම්භාව්‍ය වගකීම්
L.T හා නඩු සඳහා දළ වශයෙන් රු. මිලියන 3 ක අසම්භාව්‍ය වගකීමක් පවතී.

4. 1981 සිට 2013 දක්වා IRDP, SHTDP, TDP හා වෙනත් ව්‍යාපෘති සඳහා ලැබුණු අරමුදල් හා භාණ්ඩාගාර ප්‍රදාන ක්‍රමක්ෂය කර ඇත.ඒ අනුව රු. මිලියන 100.8 ක් විලම්භිත ආදායම් ලෙස ගිණුම්කරණය කර ඇති අතර ඉතිරිය ඉදිරි වර්ෂ අනුව ක්‍රමක්ෂය කරමින් ඉදිරියට රැගෙන ඇත. කුඩා තේ වතු හිමියන් සඳහා වූ රු. මිලියන 93.61 අයවැය ප්‍රදාන මෙම වසරේදී ක්‍රමක්ෂය කර ඇත. ඉහත ගැලපීම් හේතුවෙන් විලම්භිත ආදායම රු. මිලියන 93.61 කින් වැඩි වී ඇත.
5. සංචාරක බංගලාව හා හෙක්ටයාර 10.54 කින් යුත් වලහන්දූව ඉඩම. මෙය ඉඩම් ප්‍රතිපාදන කොමිසමට අයත් වන අතර තවමත් හිමිකාරීත්වය අධිකාරිය වෙත පවරා නැත.
6. නැවත වගාකිරීම යනාදිය පිළිබද ජාතික අවශ්‍යතාවයන්ට අනුකූල වන ලෙස වසරේ ක්‍රියාකාරී සැලැස්ම සකසා ඇත.
7. මෙම වසර තුළදී කුඩා තේ වතු හිමියන් සඳහා දිවිනැගුම පාංශු සංරක්ෂණය හා යාන්ත්‍රීකරණය ව්‍යාපෘති තුළින් සංවර්ධන වැඩසටහන් දියත් කරනු ලැබීය. මේ සඳහා වැය වූ මුළු පිරිවැය රු. මිලියන 455.05 කි. යාන්ත්‍රීකරණ වැඩසටහන, දිවිනැගුම හා පාංශු සංරක්ෂණ වැඩසටහන් සඳහා TRI වෙතින් හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයෙන් අරමුදල් සැපයිණි.

**කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය**
**හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශය**
**2013 දෙසැම්බර් 31 වන දිනට අවසන් වූ වර්ෂය**

**රු.'000**

| | පාලනය කරන අස්ථිත්වයේ හිමිකරුවන්ගේ අයිතිය | | | | |
|---|---|---|---|---|---|
| විස්තරය | දායක ප්‍රාග්ධනය | අනෙක් සංචිත | ප්‍රත්‍යාගණන සංචිත | සමුච්චිත අතිරික්ත (ඌණතා) | මුළු ශුද්ධ වත්කම්/හිමිකම |
| 31/12/2013 දිනට ශේෂය | 19,830 | 158,875 | 124,109 | (269,702) | 33,112 |
| වසර සඳහා අතිරික්තතා/(ඌණතා) | | | | 208,128 | 208,128 |
| දේපළ ප්‍රත්‍යාගණනයෙන් ලත් ලාභය | | | | | |
| වසර තුළ රජයේ ප්‍රදාන | 7,947 | | | | 7,947 |
| වසර තුළ වෙනත් ප්‍රදාන | | | | | |
| වසරේ විලම්භිත ආදායම | (2,558) | (98,275) | | | (100,833) |
| 31/12/2014 දිනට ශේෂය | **25,220** | **60,600** | **124,109** | **(61,574)** | **148,354** |

# කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය
# මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ සටහන්
# 2014 දෙසැම්බර් 31න් අවසන් වූ වර්ෂය

සටහන 01

දේපළ, අංගන හා පිරියත 2014

| විස්තරය | 2014.01.01 දිනට පිරිවැය | වසර සඳහා එකතු කිරීම් | මාරු කිරීම/ අපහරණය | 2014.12.31 දිනට පිරිවැය |
|---|---|---|---|---|
| ඉඩම් | 72,468,393.51 | 963,404.11 | --------------- | 73,946,464.44 |
| ගොඩනැගිලි | 170,047,675.59 | 2,871,290.32 | --------------- | 172,404,299.09 |
| මෝටර් රථ | 52,771,453.00 | 1,222,415.00 | --------------- | 53,993,868.00 |
| ව්‍යාපෘති මෝටර් රථ | 13,945,935.00 | -------------- | --------------- | 13,945,935.00 |
| ගෘහ භාණ්ඩ සවි කිරීම් හා කාර්යාල උපකරණ | 17,819,098.53 | 428,153.18 | (105,919.00) | 18,139,132.71 |
| පරිගණක | 15,707,564.22 | 1,006,740.00 | (168,634.50) | 16,545,669.72 |
| අංගන හා පිරියත | 386,650.00 | --------------- | --------------- | 386,650.00 |
| එකතුව | 343,146,769.85 | 6,492,002.61 | (274,553.50) | 349,362,018.96 |

ක්ෂය වීම

| විස්තරය | 2014.01.01 දිනට ක්ෂය වීම | වසරේ ක්ෂය වීම | මාරු කිරීම/ අපහරණය | සමුච්චිත ක්ෂය වීම | ලියා හල වටිනාකම |
|---|---|---|---|---|---|
| ඉඩම් | ---------------- | ----------------- | --------------- | --------------- | 73,431,797.62 |
| ගොඩනැගිලි | 28,271,123.58 | 3,410,790.46 | --------------- | 31,681,914.04 | 141,237,051.88 |
| මෝටර් රථ | 16,424,269.80 | 10,418,627.02 | --------------- | 26,842,896.82 | 27,150971.18 |
| ව්‍යාපෘති මෝටර් රථ | 8,328,059.50 | 1,783,459.50 | -------------- | 10,111,519.00 | 3,834,416.00 |
| ගෘහ භාණ්ඩ සවි කිරීම් හා කාර්යාල උපකරණ | 10,547,865.78 | 1,589,973.40 | (109,680.77) | 12,025,958.41 | 6,113,174.30 |
| පරිගණක | 9,684,474.63 | 2,011,945.26 | (159,334.50) | 11,537,085.39 | 5,008,584.33 |
| අංගන හා පිරියත | 386,649.00 | -------------- | ------------- | 386,649.00 | 1.00 |
| එකතුව | 73,642,442.29 | 19,214,795.64 | (269,015.27) | 92,586,022.66 | 256,775,996.31 |

# කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය
# මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ සටහන්
# 2014 දෙසැම්බර් 31 අවසන් වූ වසර

සටහන්

| විස්තරය | රු |
|---|---|
| ආයෝජන - 2013 | |
| ස්ථාවර තැන්පතු - පාරිතෝෂිතය | 9,993,082.42 |
| | |
| සටහන 02 A | |
| වෙනත් මූල්‍ය වත්කම් | |
| විෂම පිරිවැය | 3,935,215.98 |
| | |
| වෙනත් ජංගම වත්කම් | |
| පැළ තොග | 6,145,433.14 |
| | |
| සටහන 03 | |
| ඉන්වෙන්ට්‍රි | |
| ලිපි ද්‍රව්‍ය | 2,192,649.90 |
| විවිධ තොග | 9,629,930.26 |
| තේ | 451,760.62 |
| පොහොර | 107,197.60 |
| බැසම්ඩ්/ මෙතුම් සෝඩියම් | 619,938.47 |
| පොලිතීන් | 913,295.98 |
| ඉසින යන්ත්‍ර | 28,563.96 |
| තවාන් උපකරණ | 24,228.26 |
| තරාදි | 84,258.35 |
| දළු කඩන කතුර (Plucking seizers) | 212,689.61 |
| ආධාර පැකේජ | 972,117.58 |
| ටයර හා ටියුබ් | 36,624.00 |
| පුහුණු සඳහා යොදා ගැනෙන උපකරණ | 3,982.50 |
| වෙනත් තොග | 385,078.93 |
| | |
| එකතුව | 15,662,316.02 |
| | |
| සටහන 04 05 | |
| ලැබීම් | |
| | |
| ණයකරුවන් | 18,857,298.69 |
| ණය හා අත්තිකාරම් | 110,188,411.30 |
| තැන්පතු හා අත්තිකාරම් | 748,328.84 |
| වෙනත් ශේෂ | 11,079,409.76 |

| | |
|---|---|
| එකතුව | 140,873,448.59 |
| | 22,056,832.16 |
| අඩු කළා: බොල් ණය ප්‍රතිපාදන | |
| | 118,816,616.43 |
| එකතුව | |
| සටහන 06 | 800,157.99 |
| පෙර ගෙවීම් | |
| සටහන 07 | |
| මුදල් බැංකු ශේෂ | 492,678.75 |
| මාර්ගස්ථ මුදල් | 46,800,144.38 |
| අතැති මුදල් හා බැංකුවෙහි ඇති මුදල් | 27,963,000.00 |
| තැන්පතු | 75,255,823.13 |
| එකතුව | |
| | |

| | |
|---|---|
| සටහන 08 | |
| ගෙවීම් | |
| | 12,103, 655.89 |
| ණයකරුවන් | 4,716,594.46 |
| තැන්පතු ගෙවීම් | 3,011,905.55 |
| වෙනත් ප්‍රතිපාදන | 34,670,612.05 |
| වෙනත් ශේෂ | 54,535,767.95 |
| එකතුව | |
| සටහන 9 | |
| උපචිත වියදම් | 65,000.00 |
| වාර්ෂික චාරිකාව | 132,885.04 |
| විදුලිය | 4,979,094,04 |
| සේවක අර්ථසාධක අරමුදල හා සේවා | |
| නියුක්තයන්ගේ භාර අරමුදල | 9,200.00 |
| පරිගණක නඩත්තුව | 116,336.67 |
| සම්මන්ත්‍රණ හා දේශන | 8,700.00 |
| වරිපනම් හා බදු | 366,827.50 |
| ඉන්ධන | 23,119.29 |
| නිවාඩු දින ගෙවීම් | 753,572.32 |
| වෛද්‍ය පහසුකම් | 125,330.00 |
| යතුරු පැදි නඩත්තුව | 8,230.00 |
| පුවත්පත් | 17,114.00 |
| සුබසාධන | |
| කාර්යාල උපකරණ නඩත්තුව | 20,160.00 |

| | |
|---|---|
| අතිකාල<br>තැපැල් ගාස්තු<br>කුළිය<br>වැටුප්/ වේතන<br>ආරක්ෂාව<br>උපයන විට බදු<br>ගොඩනැගිලි පිරිසිදු කිරීම/ නඩත්තුව<br>නොමිලේ ලබා දෙන තේ කෝප්පය<br>දුරකථන<br>T.S.H.S.F.<br>ප්‍රවාහන ගාස්තු<br>ගමනාගමන හා උපවේශන<br>නිළ ඇඳුම් හා සපත්තු<br>ලිපි ද්‍රව්‍ය<br>පුස්තකාලය<br>ජලය<br>වාහන නඩත්තුව<br>මුද්දර ගාස්තු<br>නැවත පැළ සිටුවීම සඳහා වන සහනාධාර<br>අළුත් පැළ සිටුවීම සඳහා වන සහනාධාර<br>භෝග ප්‍රතිස්ථාපනය<br>බැංකු ගාස්තු<br>ව්‍යාප්ති වැඩසටහන<br>වෘත්තීය සමිතිය<br>ඩොලමයිට් සහනාධාර<br>දිවිනැගුම<br>මඩ් ශාක<br>වෙනත් | 229,895.86<br>21,446.10<br>264,074.00<br>560,692.08<br>168,445.56<br>10,850.31<br>21,100.00<br>24,360.00<br>147,057.49<br>194,351.00<br>41,950.00<br>790,211.47<br>6,722.50<br>38,711.00<br>9,520.00<br>22,415.15<br>277,945.00<br>30,030.00<br>92,223,497.23<br>38,405,011.28<br>3,998,099.50<br>332,115.60<br>5,230.00<br>212.00<br>228,190.00<br>216,355.00<br>134,586.25<br>16,145.42 |
| එකතුව | 145,044,789.36 |
| සටහන 10<br>සේවකයන් සඳහා වන ප්‍රතිලාභ<br>(පාරිතෝෂිතය) | 139,449,953.77 |

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය
எனது இல. } LP/I/TSHDA/01/14/01
My No.

ඔබේ අංකය
உமது இல. }
Your No.

දිනය
திகதி } 2015 ඔක්තෝබර් 29 දින
Date

කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය
05 NOV 2015
පැලවත්ත - බත්තරමුල්ල

සභාපති

කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය

**කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

---

කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1975 අංක 35 දරන කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය පනතේ 15 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් අධිකාරියේ සභාපති වෙත යථාකාලයේදී නිකුත් කරනු ලැබේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) වලට අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

**2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 01 අනුව විශේෂ අවස්ථාවකදී හැර ආදායමින් වියදම් අඩුකර දැක්වීම නොකළයුතු වුවද තේ දළු හා මව් පඳුරු කොටස් අලෙවියෙන් සහ හන්තාන පුහුණු මධ්‍යස්ථානයේ පාඨමාලා පැවැත්වීමෙන් ලැබී තිබුණු ආදායම් හා වියදම් වෙන් වෙන්ව දක්වනු වෙනුවට ශුද්ධ ප්‍රතිඵලය පමණක් දක්වා තිබුණි. තවද එකතුව රු.4,162,477 ක් වූ විවිධ ආදායමින් රු.2,331,811 ක් එනම් සියයට 56 ක් වර්ගීකරණයකින් තොරව විවිධ ආදායම් ලෙස දක්වා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 03 අනුව තේ කම්හල් ජාලය පුළුල් කිරීම සඳහා 1998 – 2001 කාලපරිච්ඡේදය තුල ලැබී තිබුණු රු. 93,610,309 ක රජයේ ප්‍රදානය නිවැරදිව ගැලපීම් නොකිරීම නිසා ගිණුම්වලින් ඉදිරියට ගෙනවිත් තිබුණු අතර එය අතීතානුයෝගීව ගැලපුම් නොකර විලම්භිත ආදායමක් ලෙස සමාලෝචිත වර්ෂයේ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ දක්වා තිබුණි.

### 2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

(අ) සේවක පාරිතෝෂික ගෙවීම් සඳහා ප්‍රතිපාදන

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) සේවකයන්ගේ සේවා කාලය වසරක් සම්පූර්ණ වූ පසු සේවක පාරිතෝෂික ගෙවීම් සඳහා ප්‍රතිපාදන ඇතිකිරීම ආරම්භ කළ යුතු වුවද සේවකයාගේ සේවා කාලයේ 6 වෙනි වර්ෂය ආරම්භයේදී සම්පූර්ණ ප්‍රතිපාදනය ඇතිකිරීම අධිකාරියේ ප්‍රතිපත්තිය වීම හේතුවෙන් ප්‍රතිපාදනය ඇතිකරන වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයට අසාමාන්‍ය බලපෑමක් ඇතිවිය හැකිවුවද අධිකාරිය විසින් ඒ පිළිබඳ සැලකිලිමත් වී නොතිබුණි.

(ii) අධිකාරියේ ප්‍රතිපත්තිය සේවා කාලයේ 6 වෙනි වර්ෂය ආරම්භයේ සේවක පාරිතෝෂික ගෙවීම් සඳහා සම්පූර්ණ ප්‍රතිපාදනය ඇතිකිරීම වුවත් මාතර, හන්තාන හා රත්නපුර ප්‍රාදේශීය කාර්යාල විසින් සේවා කාලයේ 5 වෙනි වර්ෂයේ සිට වර්ෂ 05 ක සම්පූර්ණ කාලය සඳහා ප්‍රතිපාදනය කර තිබුණි.

### 2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ ප්‍රාදේශීය කාර්යාලවල තේ දළු අලෙවියෙන් හා මව්පඳුරු වල රිකිලි අලෙවියෙන් ලද ආදායම් පිළිවෙලින් රු. 2,296,929 ක් හා රු. 1,451,142 ක් ගිණුම්ගත කර තිබුණු නමුත් එම වගාවන්හි තේ පඳුරුවල හා මව්පඳුරු වල වටිනාකම ප්‍රාග්ධනීත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) අධිකාරිය සතු මෝටර් වාහන හැර, වර්තමානයේ ප්‍රයෝජනයට ගනු ලබන සම්පූර්ණයෙන් ක්ෂය වී ඇති ජංගම නොවන වත්කම්වල සාධාරණ අගය පෙන්නුම් කිරීම සඳහා ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු කර නොතිබුණි.

### 2.2.4 පැහැදිලි නොකල වෙනස්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට සේවක ණය හා අත්තිකාරම් ගිණුම් 05 ක සහ ණයහිමි ගිණුම් 02 ක ලෙජර් ශේෂ ඊට අදාළ උපලේඛන සමග සැසදීමේදී රු.898,423 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ රු.39,498,038 ක් වූ ගොඩනැගිලි පිරිවැය ස්ථාවර වත්කම් ලේඛනයේ රු.40,602,444 ක් ලෙස දක්වා තිබීමෙන් රු.1,104,405 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඇ) මූල්‍ය ප්‍රකාශන අනුව රු.9,189,862 ක් හා රු.34,873,648 ක් වූ හන්තාන පුහුණු මධ්‍යස්ථානයේ ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම් භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තාවලට අනුව පිළිවෙලින් රු.7,170,987 ක් හා රු.34,542,475 ක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව ඉඩම් හා ගොඩනැගිලි වල රු.2,350,048 ක වෙනසක් නිරීක්ෂණය විය.

### 2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| විස්තරය | මුදල | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| නැවත උපලේඛනගත කළ මෝටර් වාහන ණය | 7,688,482 | උපලේඛන හා වෙනත් ආධාරක ලියකියවිලි |
| තේ පරීක්ෂකවරුන් /ව්‍යාපෘති නිලධාරීන් සඳහා ලබාදුන් යතුරු පැදි ණය | 8,780,927 | - එම- |

## 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

සමාලෝචිත වර්ෂය අවසානයට වසර 05 ඉක්මවූ ණයගැති වටිනාකම රු.34,465,672 ක් හා ණයහිමි වටිනාකම රු.3,057,868 ක් වූ අතර ඒවා නිරවුල් කිරීමට හෝ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 2.4 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

විගණනයේදී නිරීක්ෂණය වූ නීති, රීති, රෙගුලාසිවලට අනුකූල නොවීමේ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) (i) 1975 අංක 35 දරන කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය පනතේ 14 වන වගන්තිය | අධිකාරියේ පනතේ කාර්යයන්වල ඇතුලත් දැනට තේ කර්මාන්තශාලා වලට අදාල කාර්යයන් අධිකාරිය විසින් සිදු නොකරන බැවින් පනත සංශෝධනය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. පනත සංශෝධනය කිරීමට දැනටමත් වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය වෙත යොමු කර ඇති අතර, අමාත්‍යාංශය විසින් නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති බව මේ සම්බන්ධයෙන් සභාපතිවරයා විසින් මා වෙත වාර්තා කර ඇත. |
| (ii) 2003 අංක 34 දරන කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය සංශෝධන පනත (2) (ආ) (ii) හා (iv) වගන්ති | සමාජිකයින් 13 කින් යුත් අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා සමාජිකයින් දෙදෙනෙකු පත් කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අධිකාරියේ මෙහෙයුම් කටයුතුවලින් රු. මිලියන 106.11 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. මිලියන 207.48 ක් විය. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේදී මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.මිලියන 313.59 ක වර්ධනයක් නිරීක්ෂණය විය. ඒකාබද්ධ අරමුදලින් ලබාදුන් ප්‍රතිපාදනය රු.මිලියන 229.93 කින් වැඩිවීම හා සංවර්ධන වියදම රු.මිලියන 94.95 කින් අඩුවීම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3.2 අධිකාරියට එරෙහිව හෝ අධිකාරිය විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි**

අධිකාරියට එරෙහිව සේවකයින් 04 දෙනෙකු විසින් එකතුව රු.3,115,116 ක් වන්දි ඉල්ලා අධිකරණවල නඩු පවරා තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

#### 4.1.1 තේ නිෂ්පාදනය සඳහා කුඩා තේ වතු හිමියන්ගේ දායකත්වය

විගණනයට ලබා ගත හැකි වූ තොරතුරුවලට අනුව, සමාලෝචිත වර්ෂය තුළ ශ්‍රී ලංකාවේ මුළු තේ නිෂ්පාදනය කිලෝග්‍රෑම් මිලියන 338.03 ක් වූ අතර ඒ සඳහා කුඩා තේ වතු හිමියන්ගේ දායකත්වය කිලෝග්‍රෑම් මිලියන 247.38 ක් හෙවත් සියයට 73.18 ක් විය. ඉකුත් වර්ෂය තුළදී ශ්‍රී ලංකාවේ මුළු තේ නිෂ්පාදනය කිලෝග්‍රෑම් මිලියන 340.22 ක් වූ අතර ඒ සඳහා කුඩා තේ වතු හිමියන්ගේ දායකත්වය කිලෝග්‍රෑම් මිලියන 244.30 ක් හෙවත් සියයට 71.81 ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂය සඳහා කුඩා තේ හිමියන්ගේ දායකත්වය සියයට 1.37 කින් වැඩිවී තිබුණි.

#### 4.1.2 තේ වගා සංවර්ධන ආධාර

ඉදිරිපත් කරන ලද අධිකාරියේ වාර්ෂික වාර්තාව අනුව, තේ නැවත වගා කිරීම හා නව වගා කිරීම් සඳහා සහනාධාර ලබාදීම, ව්‍යාප්ත සේවා සැපයීම, සමාජ සංවර්ධනය සහ ආයතනික ශක්තිමත් කිරීම වැනි සංවර්ධන කාර්යයන් සඳහා සමාලෝචිත වර්ෂය තුළදී රු. මිලියන 345.1 ක සහනාධාර මුදලක් ලබා දී තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂ 04 හි වගා සංවර්ධන පිරිවැය හා ක්‍රියාත්මක කිරීමේ පිරිවැය පහත දැක්වේ.

| | 2014 | 2013 | 2012 | 2011 | 2010 |
|---|---|---|---|---|---|
| සංවර්ධන පිරිවැය (රු. මිලියන) | 345.1 | 440.0 | 276.3 | 208.0 | 189.2 |
| ක්‍රියාත්මක කිරීමේ පිරිවැය (රු. මිලියන) | 252.8 | 238.5 | 233.5 | 218.5 | 205.4 |
| සංවර්ධන පිරිවැය රු. 1 කට ක්‍රියාත්මක කිරීමේ පිරිවැය | 0.73 | 0.54 | 0.85 | 1.04 | 1.08 |

ඉහත සඳහන් තොරතුරු වලට අනුව සමාලෝචිත වර්ෂයේ සංවර්ධන පිරිවැය ඉකුත් වර්ෂය හා සැසඳීමේදී රු.මිලියන 94.9 කින් පහත වැටී තිබුණු අතර, සංවර්ධන පිරිවැය රුපියල් එකකට ක්‍රියාත්මක කිරීමේ පිරිවැයද ඉකුත් වර්ෂය හා සැසඳීමේදී රු.0.19 කින් වැඩි වී තිබුණි.

(ආ) ජාතික අවශ්‍යතාවයට අනුව, උපරිම ඵලදාව ලබාගැනීමට සහ තේ ඉඩම් නඩත්තු කිරීමට වාර්ෂිකව හෙක්ටයාර් 2,300 ක් නැවත වගා කළ යුතු වුවද ලබා ගත හැකිවූ තොරතුරුවලට අනුව, සමාලෝචිත වර්ෂය තුළදී සහනාධාර යෝජනා ක්‍රමය යටතේ හෙක්ටයාර් 720 ක් පමණක් නැවත වගා කර තිබුණු අතර එය හෙක්ටයාර් 116,492 ක් වූ මුළු පරිණත තේ ඉඩම් වලින් සියයට 0.62 ක් නියෝජනය විය. මෙම පරිණත තේ වගාවෙන් හෙක්ටයාර් 21,613 ක් වර්ෂ 25 ඉක්මවූ වගාවන් බැවින් එම මුළු වගා ප්‍රමාණයම නැවත වගාව සඳහා යොමු කිරීමේ අවශ්‍යතාවය සංගණන තොරතුරු මගින් පෙන්වා දී තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ තේ නැවත වගාව සඳහා ලබාදී තිබූ සහනාධාර ප්‍රමාණය රු.මිලියන 258.09 ක් වූ අතර එය අපේක්ෂිත රු.මිලියන 391.75 ක සහනාධාර මුදලින් සියයට 65.88 ක් විය.

**4.1.3 භෝග පුනරුත්ථාපනය**

-------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) තේ වගා සඳහා නිර්දේශිත ක්‍රම අනුගමනය කර පැල මිලියන 0.8 ක් සිටුවීම ඉලක්ක කර තිබුණද වර්ෂය තුල සිටුවා තිබුනේ පැල මිලියන 0.271 ක් එනම් ඉලක්ක ගත ප්‍රමාණයෙන් සියයට 34 ක් පමණක් විය.

(ආ) භෝග පුනරුත්ථාපනය සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 17.5 ක වගා ආධාර ලබාදීමට අපේක්ෂා කර තිබුණද ලබා දී තිබුණේ රු.මිලියන 5.9 ක් එනම් අපේක්ෂිත ප්‍රමාණයෙන් සියයට 44 ක් පමණි. තවද මේ සඳහා නිකුත් කිරීමට අපේක්ෂා කළ සහනාධාර ලබාදීමේ අවසර පත්‍ර සංඛ්‍යාව 2,089 ක්ව තිබියදී නිකුත් කිරීමට හැකි වී තිබුණේ අවසර පත්‍ර 1,498 ක් පමණක් විය.

**4.1.4 තේ සංවර්ධන ව්‍යාපෘති චක්‍රීය ණය අරමුදල**

සමාලෝචිත වර්ෂයට අදාල වාර්ෂික වාර්තාවට අනුව මහ බැංකුව SDR මිලියන 15.4 ක් වෙන්කර කුඩා තේ වතු අංශයේ සංවර්ධනය සඳහා ඇති කර තිබු චක්‍රීය අරමුදලෙන් සමාලෝචිත වර්ෂය තුල ණය මුදල් සපයා තිබුණේ තේ නැවත වගාව සඳහා අයදුම්කරුවන් 20 කට හා වාණිජ පැල තවාන් සඳහා අයදුම්කරුවන් 02 දෙනෙකුට පමණි.

**4.1.5. ආයතනික පැළ තවාන්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය තුළ තේ පැළ තවාන් 08 ක මෙහෙයුම් වල ප්‍රතිඵලය රු. 52,154 ක ශුද්ධ අතිරික්තයක් වූ අතර එයට අනුරූපීව ඉකුත් වර්ෂයේ ශුද්ධ අතිරික්තය රු.167,217 ක් වූයෙන් අතිරික්තය රු. 115,063 කින් අඩුවීමක් නිරීක්ෂණය විය.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා පැළ තවාන්වල දළ ලාභ අනුපාතිකය සියයට 0.6 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අනුපාතිකය සියයට 2.3 ක් විය.

(ඇ) තිස්පනේ පැළ තවානෙන් අඛණ්ඩව පාඩු ලබා තිබුණු අතර, සමාලෝචිත වර්ෂය තුළ හා ඉකුත් වර්ෂය තුළ පිළිවෙලින් රු.206,540 ක් හා රු. 232,174 ක් වූ පාඩු සිදුවී තිබු බව නිරීක්ෂණය විය.

(ඈ) සමාලෝචිත වර්ෂය තුළදී පැළ තවාන් 07 ක මැරී තිබුණු පැළ සංඛ්‍යාව 150,754 ක්වූ අතර එය මුළු පැළ සංඛ්‍යාවෙන් සියයට 10 ක් විය. රහතුන්ගොඩ, හිඟුල්ඔය හා වෝගන් යන පැළ තවාන්වල මැරුණු පැළ සංඛ්‍යාව සමාලෝචිත වර්ෂය තුළදී අසාමාන්‍ය ලෙස වැඩි වී තිබුණි.

**4.1.6 ව්‍යාපෘති ආධාර උපයෝජනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) දිවිනැගුම ව්‍යාපෘතිය යටතේ ලද රු. 19,880,000 කින් නව තේ වගාව හා නැවත වගාව, ගම්මිරිස් වගාව, තේ ඉඩම්වල පාළු සිටුවීම යන සංවර්ධන කාර්යයන් සඳහා ප්‍රදේශීය කාර්යාල 8 කට නිකුත් කරන ලද මුදලින් රු.7,070,800 ක්ද ප්‍රධාන කාර්යාලයේ රඳවාගත් මුදලින් රු.6,211,877 ක්ද අදාළ කාර්යයන් සඳහා නොයොදවා ඉතිරි කර තිබුණි.

(ආ) දිවිනැගුම ව්‍යාපෘතිය යටතේ දිස්ත්‍රික්ක 8 ක වගාකරුවන්ට නව තේ වගාව හා නැවත වගාව, ගම්මිරිස් වගාව හා තේ වගාව තුළ පාළු සිටුවීම යන සංවර්ධන කාර්යයන් සඳහා අපේක්ෂිත මුල්‍යාධාර ප්‍රමාණය රු. 21,608,880 ක් වූ අතර සත්‍ය වශයෙන් ලබාදුන් මුල්‍යාධාර ප්‍රමාණය රු. 12,943,456 ක් විය. එය සියයට 25 සිට සියයට 66 දක්වා පරාසයක විය.

(ඇ) පාංශු ආධාර ව්‍යාපෘතිය සඳහා ලැබී තිබුණු රු.357,725,510 ක මුදලින් රු.18,297,791 ක් අදාළ කාර්යය සඳහා භාවිතා නොකර ප්‍රධාන කාර්යාලය හා ප්‍රාදේශීය කාර්යාලවල ඉතිරි වී තිබුණි.

(ඈ) අඩු ආදායම්ලාභී කාන්තාවන් සඳහා වූ තේ ව්‍යාපෘතිය සඳහා කළුතර ප්‍රාදේශීය කාර්යාලයට ලබා දී තිබුණු රු. 348,000 ක් වර්ෂය අවසානය දක්වාම අදාළ කාර්යයට නොයොදවා තිබුණු අතර එම මුදල ගෙවිය යුතු ලෙස වෙනත් ණයහිමියෝ යටතේ දක්වා තිබුණි.

**4.2 වත්කම් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ප්‍රාදේශීය කාර්යාල 04 ක සේවක නිවාස හා තේ ඉඩම් ඇතුළුව පිළිවෙලින් රු.23,161,486 ක් හා රු.55,302,611 ක් වටිනා ඉඩම් හා ගොඩනැගිලිවල අයිතිය සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම අධිකාරිය වෙත පවරා ගෙන නොතිබුණි.

(ආ) ගාල්ල ප්‍රාදේශීය කාර්යාලයට අයත් වලහන්දුව උපකාර්යාලය, පැලතවාන හා අක්මීමන මව් වගා ව්‍යාප්ති මධ්‍යස්ථානය ආදිය අධිකාරියට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

**4.3 මතභේදයට තුඩුදෙන ගණුදෙනු**

2014 නොවැම්බර් 12 දින අරලියගහ මන්දිරයේදී පවත්වනලද තේ ගොවි හමුවක් වෙනුවෙන් රු.5,908,811 ක් වැය කර තිබීම විගණනයේදී මතභේදයට තුඩුදෙන කරුණක් විය.

**4.4 මානව සම්පත් කළමනාකරණය**

අධිකාරිය විසින් ඉදිරිපත් කරන ලද තොරතුරුවලට අනුව 2014 දෙසැම්බර් 31 දිනට අනුමත සේවක සංඛ්‍යාව 422 ක් වූ අතර, තථ්‍ය සංඛ්‍යාව කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් ප්‍රාථමික මට්ටමේ තනතුරු 06 ක්ද ඇතුළුව 430 ක් විය. එදිනට අධිකාරියේ තනතුරු 53 ක් අතිරික්තව පැවති අතර තනතුරු 51 ක පුරප්පාඩුද පැවතුණි.

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2014 දෙසැම්බර් 31 දිනට පුරප්පාඩු වූ තනතුරු අතර නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (සංවර්ධන), කළමනාකරු (මානව සම්පත් හා පරිපාලන), කළමනාකරු(සංවර්ධන), කළමනාකරු(පුහුණු) ඇතුළත්ව තිබුණි.

(ආ) 2014/10 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව දින 180 සම්පූර්ණ කර ඇති සේවකයින් 22 ක් ස්ථිර කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී අතිරික්ත සේවක සංඛ්‍යාව 53 ක් විය.

(ඇ) විගණනය වෙත ලබාදී තිබූ තොරතුරු අනුව ඵලදායී ව්‍යාප්ති සේවාවක් සඳහා තිබියයුතු ව්‍යාප්ති කාරක හා තේ ගොවි අනුපාතිකය 1:1000 ක් පමණ විය යුතු වුවද තේ පරීක්ෂක/ ව්‍යාප්ති නිලධාරීන් 26 ක් සඳහා පැවති පුරප්පාඩු හේතුවෙන් ඉකුත් වර්ෂයේ 1:2730 ක් ව පැවති මෙම අනුපාතය සමාලෝචිත වර්ෂයේ 1:2736 දක්වා වැඩි වී තිබුණි.

**4.5 නොවිසඳී ඇති විගණන ඡේද**

නිලධාරියකුට අධිකාරියේ අනුමත කාර්ය මණ්ඩලයේ නොමැති තනතුරක වැඩ බැලීම සඳහා පත්කර දීමනා ගෙවීම සම්බන්ධයෙන් 2014 නොවැම්බර් 19 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා රැස්වීමේදී සාකච්ඡාවට භාජනය වූ අතර ඔහු සහකාර සාමාන්‍යාධිකාරී (මානව සම්පත් හා පරිපාලන) තනතුරේ වැඩ බැලීමට පත් කිරීම සහ බඳවා ගැනීමේ පරිපාටියට අනුකූල නොවන ලෙස දීමනා ගෙවීම පිළිබඳ අවශ්‍ය නිවැරදි ක්‍රියා මාර්ගයක් ගන්නා ලෙස ප්‍රධාන ගණන්දීමේ නිලධාරීට සහ ගණන්දීමේ නිලධාරීවෙත නියෝගයක්ද දී තිබුණි. කෙසේ වුවද විගණිත දිනය වූ 2015 අගෝස්තු 14 දින දක්වාම එම නියෝගය ක්‍රියාත්මක කිරීමට අධිකාරිය විසින් කටයුතු කර නොතිබුණි.

5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

---

5.1 අයවැය ලේඛනමය පාලනය

අයවැයගත හා තථ්‍ය සංඛ්‍යා අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වුයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

5.2 විගණන කමිටු

---

2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.1 වගන්තිය අනුව අවම වශයෙන් මාස 03 කට වරක් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්විය යුතු වුවත් සමාලෝචිත වර්ෂය තුළ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වාර 03 ක් පමණක් පවත්වා තිබුණි.

6. පද්ධති හා පාලනයන්

---

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර අධිකාරියේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු වේ.

(අ) ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂ
(ආ) මුදල් පාලනය හා බැංකු සැසඳුම්
(ඇ) සහනාධාර ගෙවීම
(ඈ) ණය හා අත්තිකාරම් ගෙවීම සහ අයකර ගැනීම
(ඉ) වත්කම් කළමනාකරණය

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති (වැඩබලන)